දළදා වරෑණ

මහනුවර ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2560 පොසොන් පුර පසළොස්වක නම් තිථිය ලක් රවි දින ■ 2016 ජූනි මස 19 වැනි ඉරිදා



■ නොමිලේ පිරිනමන දහම් පඬුරකි ■ විකිණීම සඳහා නොවේ

ධම්ම පදයෙන් දහම් ඔවදන්



කලකෝලාහල මරණාය ඇති බව නැතිකර ගන්න සිහිකර ගන්න

'පරෙච්න විජානන්ති - මයමෙත්ථ යමාමසෙ
යෙ ච නත්ථ විජානන්ති - තතො සම්මන්ති මෙධගා'

- ධම්ම පදය - යමග වග්ගය

මේ ලෝකයේ කෝලාහල කරන පිරිස තමන් මැරෙන බව නොදනිති. එහෙත් ඒ කෝලාහල කරන පිරිස අතර යමෙක් තමන් මැරෙන බව දනිත්ද? එයින්ම කෝලාහලය නවතී.

රණ්ඩු දබර කලකෝලාහලවලින් තොර යහපත් සමාජයක් ගොඩනැගීම උදෙසා ඉවහල් වන අපූරු පදනමක් මෙම ධම්මපද ගාථාවෙන් පෙන්වා දී ඇත. ඒ තමන් මැරෙන බව වටහා ගැනීමයි. තෘෂ්ණාවෙන් පිරුණු ලෝක සත්වයාගේ නිරන්තර ස්වභාවය වන්නේ ආත්මාර්ථකාමීව කටයුතු කිරීමයි. තමන්ට අයහපතක්, අවැඩක්, අඩුවක්, අසාධාරණයක් සිදුවනවාට ඔහු කිසිසේත් කැමති වන්නේ නැත. තමන්ට පමණක් නොව තමා හා බැඳුණු අන් අයටද, අන් වස්තුවලටද අවැඩක්, අඩුවක්, අසාධාරණයක් සිදුවනවාට කැමති නැත. ඒ නිසාම තමන්ට හා තමා හා බැඳුණු අන් සියල්ලට අවැඩක්, අසාධාරණයක් සිදුවන විට ඔහු ඉවසන්නට සූදානම් නැත. ඒ අවැඩට, අසාධාරණයට මුල් වූ අය තමා කලකෝලාහලවලට, රණ්ඩුවට පැටලෙන්නේ ඔවුන් නොදැනීමය. විටක එය බැණ වැදීමකින් අවසන් වුවද තවත් විටක දරුණු ලෙස සිදු කළ ඝාතනයකින් අවසන් විය හැකිය.

මෙවන් තත්ත්වයක් නිසා සිදුවන්නේ යහපත් සමාජයේ නැවුම් සුවඳ පහව ගොස් අයහපත් සමාජයේ දුර්ගන්ධය දසත පැතිරීමයි. එවිට පුද්ගලයන් අතර පවතින අන්‍යෝන්‍ය සුහදතාව, සතුට, සාමය, බැඳීම වැනි සමාජ ලක්ෂණ සියල්ල නැතිවී යයි. එය පුද්ගලයාගේ මෙලොව ජීවිතයට බලපාන්නකි. පරලොව ජීවිතයට බලපාන්නකි. පරම විමුක්තිය ගැන සිතන්නටවත් ඉඩක් නැත.

මේ ආකාර අයහපතක් තමාට ගෙන දෙන රණ්ඩු දබර කලකෝලාහල කරන අය මොහොතකටවත් නොසිතන කාරණයක් ඇත. ඒ මරණයයි. බුදුන් වහන්සේගේ දේශනා තුළ මරණය භාවනාවක් ලෙස සලකා නිතර සිහි කළ යුතුය.

"මරණ ධම්මොම්හි මරණං අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං"

එහෙත් එය සිදුවන්නේ නැත. ආත්මාර්ථයේ අන්ධකාරයෙන් ඔහුගේ සිත වැසී ඇත. මරණයේ සිහිය නමැති ආලෝකය ඔහුට ලබන්නට ඉඩක් නැත. ඒ නිසා ඔහු අඳුරෙන් අඳුරට ගමන් කරයි.

එහෙත් තමන් මැරෙන බව කෙනකුට සිතන්න මෝහය විසින් බාධා පැමුණුවත් තමා උද්‍යෝගිමත් නම්, අවදිමත් නම් ඊට අවශ්‍ය මග සාදා ගන්නට හැකියාව ඇත. එය පුද්ගලයකු ලබන සැබෑ ජයග්‍රහණයකි. ඉහත ධම්මපද ගාථාවෙන් පැහැදී කරන සේ ඔහු ලබන ප්‍රතිලාභ රණ්ඩු දබර කලකෝලාහල නවත්වා ගැනීම පමණක් නොවේ. ජීවිතයේ යථා ස්වභාවය වටහා ගන්නට, උපේක්ෂා සහගතව සියල්ල දෙස බලන්නට, සැහැල්ලු දිවි පැවැත්මක් ඇතිකර ගන්නට අන්‍යෝන්‍ය සුහදතාව සුරකිමින් ආදර්ශවත්ව යහපත් සමාජයකට දායක වන්නට ලැබීම ආදිය ඔහු ලබන අපරිමිත ප්‍රතිලාභයන්ය.

ලලිත් අබේසේකර - ගුරු උපදේශක

මිහිඳු මාහිමිගේ පිරිවර කොපමණද?



පොසොන් පොහොය උදාව සමග සිහියට නැගෙනුයේ මිහිඳු හිමිගේ ලංකා ගමනයි. තුන්වෙනි සංඝායනාවට පසු මොග්ගලීපුත්තතිස්ස හිමිගේ උපදෙස් අනුව පිරිසිදු වූ ථෙරවාදී බුදු දහම චෛර්ය වංශික අශෝක රජු විසින් ශ්‍රී ලංකාව ඇතුළු රටවල් නවයකට බෙදාහැර ඇත. මෙකල ලංකාවේ පාලකයා දෙවන පෑතිස් රජුය. (ක්‍රි.පූ. 250-210) ථෙරවාදී බුදු දහමට පටහැනි මත ඉවතලා පිරිසිදු කළ තුන්වෙනි සංඝායනාවට පසු එහි අනාගත අභිවෘද්ධිය සඳහා අශෝක රජු රටවල් නවයකට ධර්මදූත පිරිස් යවා ඇත. මේ ධර්මදූත මෙහෙවර ඉන්දියාව තුළ ඇත ප්‍රදේශවලට මෙන්ම වයඹදිග ඉන්දියාව, ඉන් එහා පැවති රාජධානිවලටද, උතුරින් හිමාල අඩවියටද, නැගෙනහිරින් ස්වර්ණභූමිය දක්වාද, දකුණින් ශ්‍රී ලංකාවටද පැතිර යාම සිදුවිය. වංශකතාවල මෙවැනි ධර්මදූත පිරිස් නවයක් ගැන කියවෙයි. 1. කාශ්මීර ගන්ධාර දේශයට මජ්ඣන්තික ථෙර, 2. මහිෂ මණ්ඩලයට මහාදේව ථෙර, 3. වනවාසයට රක්ඛිත ථෙර, 4. අපරන්ත දේශයට යෝනක ධර්මරක්ඛිත ථෙර, 5. මහාරාෂ්ටයට මහා ධම්මරක්ඛිත ථෙර, 6. හිම වන ප්‍රදේශයට මජ්ඣිම ථෙර, 7. ස්වර්ණභූමියට සෝන හා උත්තර යන ථෙරවරු, 8. යවන රටට මහා රක්ඛිත ථෙර මෙසේ දූතයන් ලෙස යවා ඇත. ශ්‍රී ලංකාවට පැමිණියේ මහා මහින්ද හිමි ඇතුළු පිරිවරයි.

ඉහත විස්තර අනුව බොහෝ ධර්මදූත කණ්ඩායම් එක් ප්‍රධාන හිමිනමකගෙන් යුක්ත විය. සෙසු පිරිවර වංශකතාවල සඳහන් වී නැත. හිම වන ප්‍රදේශයට වැඩම කළ දෙනමක් ගැන සඳහන් වෙයි. ලංකාවට පැමිණි ධර්මදූත පිරිස හේතු කීපයක් නිසා වැදගත් වෙයි.

1. ලංකාවේ දූත පිරිසට මිහිඳු හිමි ඇතුළු පස් නමක් ඇතුළු විය. ඒ ප්‍රමාණයෙන් විශාල විය. වංශකතාවල පසුකාලීන තොරතුරුවල මේ දූත පස්නමට අමතරව සුමන සාමණේර හා භණ්ඩුක උපාසකගේද නම් ඇතුළත් නම් හතක් දක්නට ලැබෙයි.
2. අශෝක රජුගේ පුතා වූ මිහිඳු හිමි මේ දූත පිරිසේ ප්‍රධාන විය. මේ අනුව රජුගේ පුතා ලංකාවට වැඩි අතර ලංකාවේම වාසය කළ මිහිඳු හිමි ලංකාවේදීම අපවත් විය.
3. අශෝක රජුගේ දියණිය වූ සංඝමිත්‍රා තෙරණිය ජය ශ්‍රී මහා බෝධි ශාඛාව සමග පසුකල ලංකාවට පැමිණ ලංකාවේම වාසය කර ලංකාවේදීම පිරිනිවන් පෑවාය.
4. අශෝක රජුගේ මුණුබුරා වූ සුමන සාමණේර හිමි මේ දූත පිරිසට ඇතුළත් විය. සංඝමිත්‍රා කුමරිය ගිහි කල අග්ගිබ්‍රහ්ම කුමරු හා විවාහ වී ලද කුමරා සුමනයි. පසුකල සුමන කුමරු පැවිදිව රහත් විය.
5. භණ්ඩුක උපාසක රජ පවුලේම කිට්ටු නෑයකු විය.

මේ ධර්මදූත සේවාව සත්‍ය බව සාංචි දාගැබේ තිබී ලැබුණු කරඬු ලිපි කීපයක මේ ධර්මදූතයන් කීපදෙනකුගේ ශාරීරික ධාතු තැන්පත් කළ මංජුසාවල කෙටූ කෙටි කරඬු ලිපිවලින් පෙනී යයි. මෙම ධර්මදූත සේවාවේ පරමාර්ථ කීපයකි.

1. තුන්වෙනි සංඝායනාවෙන් පසු පිරිසිදු වූ ථෙරවාදය දඹදිව ඇත ප්‍රදේශ දඹදිව මායිමේ සීමා රාජ්‍යය, ස්වර්ණභූමි, යවන දේශ වැනි ඈත ප්‍රදේශ හා ශ්‍රී ලංකාව වැනි රටවල පතුරුවා බුදු දහමේ අනාගත දියුණුව ඇති කිරීමයි.
2. බුදු දහම සමග පැතිරී දියුණු වූ මෞර්ය බෞද්ධ ශිෂ්ටාචාරය මේ රටවල පතුරුවා හැරීම තවත් අරමුණක් විය.

"යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ."

3. දිග් විජය වෙනුවට ධර්ම විජය මගින් අධ්‍යාත්මිකව මෙම රටවල් ජයගැනීමයි.

සමන්ත ප්‍රාසාදිකාව හා මිහිඳු හිමි හා පිරිවර ගැන සඳහන් කිරීමේදී අදහස් දෙකක් දක්වයි. මුටසීව රජු ඇවෑමෙන් පෑතිස් රජ වනතුරු මිහිඳු හිමි හා පිරිවර දකුණු ඉන්දියාවේ වේදිස නුවරට වැඩ මිහිඳු හිමිගේ මව් බිසව වූ වේදිස දේවියගේ උවටැන් ලබමින් මාස තුනක් කල් ගතකර ඇත. මිහිඳු හිමි වේදිස නුවරට වැඩීම ගැන විස්තරයේදී පාලි සමන්ත ප්‍රාසාදිකාව දෙවරක්ම සඳහන් කරනුයේ මහින්ද, ඉට්ඨිය, උත්තිය, සම්භල, භද්දසාල යන ථෙරවරුන්ගේ නම් පහ පමණකි. සමන්තප්‍රාසාදිකාවේ විස්තරයම මහාවංශයේ වැඩි විස්තර සහිතව පිරිවර පස්නමක් ලංකාවට වැඩි බව කියයි. මේ අනුව සමන්තප්‍රාසාදිකාව හා මහාවංශය ලංකාවට වැඩියේ මිහිඳු හිමි ඇතුළු පස්නමක් බව මුලින් සඳහන් කරයි. ඒ සටහන වඩාත් විශ්වාසනීය වෙයි.

හේතුව අලුතින් උපසම්පදාව ඇති කිරීමට පස්නමක් අවශ්‍ය බැවිනි. සුමන සාමණේර හා භණ්ඩුක උපාසක යන නම් දෙක දූත පිරිසට එකතු කර ඇත්තේ පසුවයි. ඒ දෙදෙන පසුව වෙනම අවුත් මුල් දූත පිරිසට එකතු වූවා විය හැක.

ලංකාවට ආ ධර්මදූත පිරිස පස්නමක් බව වංශකතාවල මුල් තොරතුරුවල කියවෙන බැවින් දකුණු ඉන්දියාවේ වේදිය නුවරට වැඩ මිහිඳු හිමිගේ මවගෙන් තුන් මාසයක් උවටැන් ලැබුවේ මේ මුල් පස්නම බව පෙනී යයි. ඉන්පසුව වෙනම සුමන සාමණේර හිමි හා භණ්ඩුක උපාසක පසුව පැමිණ මේ දූත පිරිසට එකතු වූ සිතීම සාධාරණය. නැත්නම් පසුකල ලියැවුණු මහාවංශයට මූලාශ්‍ර තොරතුරු ගැනීමේදී දැනට විනාශ වී ඇති සීහළ අට්ඨකතාවල ගුරු කුල සම්ප්‍රදාය අනුව එකිනෙකට පටහැනි මත ඇතුළත්ව තිබීම නිසා මේ මත ගැටුම මතුවූවා විය හැක. චීන ජාතික හියුංසාංගේ ගමන් විස්තරයේ මිහිඳු හිමි අශෝක රජුගේ බාල සහෝදරයකු බව කියයි. ආපසු දඹදිව නොවැඩි මිහිඳු හිමි පෑතිස් රජුට පසු රජ වූ උත්තිය රජු කල වයස 80 පිරී ලංකාවේදීම අපවත් විය. මිහිඳු හිමිගේ උපදෙස් පිට ලංකාවේ මෙහෙණි සස්න ඇති කිරීමට ජය ශ්‍රී මහා බෝධියේ අංකුරයක් පැමිණ ලංකාවට වැඩි සංඝමිත්‍රා තෙරණිය ලංකාවට වැඩීම සාංචි තොරණේ කැටයම් කර ඇති බව රීස් ඩේවිස් පෙන්වා දෙයි. සංඝමිත්‍රා තෙරණිය පැවිදි වීමට පෙර අග්ගිදත්ත කුමරු හා විවාහව සිටියදී ඔහුට දාව සංඝමිත්‍රා කුමරිය ලද පුතා සුමන කුමරුයි. පසුකල පෑතිස් රජු කල ලංකාවට පාත්‍රා ධාතුව, අකු ධාතුව, බුද්ධ ධාතු රාශියක් වැඩම කරවූයේ සුමන සාමණේර හිමිය. එතුමා දිගු කාලයක් ලංකාවේ වාසය කර ලංකාවේදීම අපවත් වූ බව සිතිය හැක. එහෙත් ඒ පිළිබඳව වංශකතා තොරතුරු හමු නොවෙයි.



උපසම්පදාව ඇති කර අලුතින් ශාසනය පිහිටුවීමට අවම පස්නමක් අවශ්‍ය බැවින් පස්නම පිළිබඳ සටහන වැදගත්ය. මේ දූත පිරිසට වෙනම් හෝ පසුව සුමන සාමණේර හා භණ්ඩුක උපාසක එකතු වී ඇත. මිහින්තලේදී පෑතිස් රජුට මිහිඳු හිමි හමුවීම අහම්බෙන් වූ සිද්ධියක් බව ලාංකේය වංශකතා දක්වයි.

එහෙත් දඩයමට යන රජෙකු 40,000 පිරිවර ගෙන යා හැකිදැයි ප්‍රශ්නයක් මතුවෙයි. මේ අනුව අශෝක රජු පෑතිස් රජු හා ලිපි ගනුදෙනු මගින් කලින් මනාව සැලසුම් කොට මිහිඳු හිමි හා පිරිවර මිහින්තලාවට එවූ බව පිළිගත යුතුය. රජු 40,000 පිරිවර රැගෙන ගියේ මිහිඳු හිමි පිළිගැනීමට බව පෙනෙයි. ගල්ඔය රජ ගල ලෙන් ලිපියක මිහිඳු හිමිගේ හා ඉට්ඨිය හිමිගේ ධාතු තැන්පත් කර සෑදූ දාගැබේ ලිපියක 'ඉදිය අගතන' ලෙස සඳහන් වෙයි. ඉදිය අගතන > සමෘද්ධිය උදෙසා පැමිණි ලෙස 'ලංකාවේ බ්‍රාහ්මී ලෙන් ලිපි' ග්‍රන්ථයේදී පරණවිතාන මහතා අර්ථ දක්වයි. එහෙත් වංශකතා කියන අදහසින් පැමිණීම අඟවන > අහසින් පැමිණි > සෘද්ධියෙන් පැමිණි යන අර්ථ ලේසියෙන් ඉවත දමිය නොහැක.

වංශකතා කියන මිහිඳු හිමි හා දූත පිරිස මවගේ උවටැන් ලබමින් ගෙවූ මාස තුන මිහිඳු හිමි පිරිවර වෙළෙඳ නැව් මගින් ලංකාවට ඒමට ගතවූ කාලය ලෙස පරණවිතාන මහතා අනුමාන කරයි. පෑතිස් රජු මිහින්තලේදී සංවිධානාත්මකව මිහිඳු හිමි පිළිගෙන ඇත. ලංකාවට වැඩීමට පෙර ලංකාවේ එදා භාවිත වූ සිංහල ප්‍රාකෘත භාෂාව මිහිඳු හිමි හදාරන්නට ඇත. එවිට ලාංකිකයන්ට සිංහල ප්‍රාකෘතයෙන් ධර්ම දේශනා කිරීම වඩාත් අර්ථ සහගත වූවා විය හැක. ථූපාරාමයේ පෑතිස් රජු කල විනය සංඝායනාවක් එදා පැවති බව සමන්ත පාසාදිකාව පමණක් සඳහන් කරයි. පාලියෙන් තිබූ ත්‍රිපිටකයට මිහිඳු හිමිගේ උපදෙස් පිට පෑතිස් රජු කල සිංහලෙන් අටුවා ලීවේ පාලි ත්‍රිපිටකය ලාංකිකයන්ට වටහා ගැනීම පහසු වීම පිණිසයි. මේ හෙළමුවා ලිවීම බුදු දහම ලාංකික කිරීමට වැදගත් කරුණක් විය.

පාත්‍රා ධාතුව හා අකු ධාතුව, බුද්ධ ධාතු ලංකාවට වැඩම කළ සුමන සාමණේර හිමි දිගු කලක් ලංකාවේ ජීවත් වී, ලංකාවේදීම අපවත් වූ බව පෙනෙයි. භණ්ඩුක උපාසක අශෝක රජුගේ බිසවක් වූ වේදිස දේවියගේ නෑයෙකි. අනුරාධපුර අග කළ හතරවෙනි මිහිඳු රජුගේ කාලයට වැටෙන මිහින්තලා ශිලා ලිපියේ මිහිඳු හිමි හා පිරිවරගේ නම් සටහන් වෙයි. එමෙන්ම මෙම මිහින්තලා ශිලා ලිපියේ තොරතුරු අනුව මිහිඳු හිමි නිසා වැවේ ජල රකුසකුද දමනය කළ බව කියවෙයි.

එස්. කේ. ජයවර්ධන

යහපත් අය අකාලයේ මිය යද්දී අයහපත් අය දිගු කල් ආයු ලබන්නේ කොහොමද?

ඉතා ධාර්මික ලෙස ජීවත් වූ යහපත් මිනිසකු අකාලයේ මියගියහොත් ඒ සම්බන්ධයෙන් සෙසු අය මෙසේ කියනු ඇත.

''ඔහොම තමයි ලෝකේ හැටි. හොඳ මිනිස්සු අකාලේ මැරිලා යනවා, පුළුවන් තරම් නරක වැඩ කරන, අනුන්ට වළ කපන, තමන්ගේ දරු පවුලවත් හොඳට නොබලන පව්කාරයෝ ඉහෙන් බහින රෝගයක් නැතුව හොඳට සැපට කාලා බීලා ඉන්නවා.

හොඳ අයට මේ ලෝකේ ගැළපෙන්නේ නෑ. ඒ හින්දා එයාලට ඉක්මනට මේ ලෝකේ අත්හැරලා යන්න වෙනවා.''

ඒ එවැනි මත කීපයකි.

නරක වැඩ කරමින්, අනුන්ට අයහපත කරමින් ජීවත් වූ අයකු අකාලයේ මියගිය විටක ''හොඳ වැඩේ ඔය මනුස්සයාට නම්. ඔය කරපු පව් තමයි එල දුන්නේ'' යැයි ඒ මරණය සම්බන්ධයෙන් තමන්ගේ අදහස ප්‍රකාශ කරනු ඇත.

අපි මේ පිළිබඳව ධර්මානුකූල විග්‍රහයක යෙදෙමු.

තමන්ගේ මුළු ජීවිත කාලයෙන් වැඩි කොටසක් අනුනට වින කැටීම සඳහාම කැප කරන ඇතැම් අය 'ඉහෙන් බහින රෝගයක්' නැතිව දීර්ඝායුෂ භුක්ති විඳිති. මෙහිදී යම් කෙනෙක් 'දැන් කාලේ බුදු බණත් බොරු වෙලා' යැයි උකටලී වන්නට බැරිකමක් නැත. නමුත් සත්‍යය එය නොවේ.

කර්මය යනු මේ ජීවිතයට පමණක් බලපාන දෙයක් නොවේ. මේ සංසාරයේදී අප මොන තරම් කුසල හා අකුසල වශයෙන් කර්ම කර ඇත්දැයි ඔබට යන්තමටවත් සිතාගත හැකිද? ඒ අනුව ඉතා යහපත් ජීවිතයක් මේ භවයේ ගත කළත් පෙර කළ අකුසල කර්ම විපාක දීම නිසා දුක් කරදර විඳින්නට, රෝගී ජීවිතයක් ගත කරන්නට, අකාලයේ මරණයට පත්වන්නට බැරිකමක් නැත.

සුබ නමැති තරුණයා බුදුරදුන් හමුවී මෙසේ විමසීය.

''භාග්‍යවතුන් වහන්ස, මේ ලෝකේ සමහරු දීර්ඝායුෂ විඳිනවා. සමහරු අඩු වයසින් මිය යනවා. මේකට හේතුව කුමක්ද?

සමහරු බොහොම නිරෝගී ජීවිත ගත කරනවා. තවත් අයට මුළු ජීවිත කාලෙම රෝගියකු ලෙස ගත කරන්නට සිදුවෙනවා. මෙසේ වන්නේ ඇයි?

සමහරුන් ඉතා ධනවත්. තවත් සමහරුන් කොපමණ ධනය උපයන්න උත්සාහ කළත් එය සාර්ථක වෙන්නේ නෑ. ඔවුන් හැමදාම දිළිඳුයි. මෙසේ වන්නේ කුමක් නිසාද?'' ආදී වශයෙන් ප්‍රශ්න රාශියක් බුදුරදුන් වෙත ඉදිරිපත් කළේය. ඒ පැනයට බුදුරදුන් දුන් පිළිතුර මෙසේ වෙයි.

''කම්මං සච්චේ විභජති
යදිදං හීන පනීතනාය''

එහි අරුත නම් 'උසස්, පහත් බව ඇති කරන්නේ කර්මය මගිනි' යන්නය. මේ විස්තරය දක්වෙන්නේ චුල්ල කම්ම විභංග සූත්‍රයේය.

ඒ අතීත භාවයන්හි සතුන් (එනම් සියලු ප්‍රාණීන්) මරණයට පත්කරන ලද්දේ නම් මේ ජීවිතය අඩු ආයුෂ ප්‍රමාණයකින් කෙළවර වනු ඇත.



''අනුන්ගේ රළු පරුෂ කතාත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය.''



අතීත භවයන්හි සත්වයන්ට හිරිහැර කළ, වදහිංසා දුන් අයකු මේ භවයේදී නිරෝගී බව අහිමිව නිතර රෝග පීඩාදියට ලක්වීම සිදුවිය හැකිය.

මිනිස්, තිරිසන් ආදී සියලු සතුනට හිරිහැර, කරදර නොකර නිරන්තරයෙන් තමන්ට හැකි අයුරින් ඔවුනට පිහිට වූ පුද්ගලයන් මේ භවයේදී සැප ලබනු ඇත.

මේ සඳහන් කළේ ඔබට වටහා ගත හැකි පරිදි ඉතාමත් සරලවය, ඒ අනුව අවබෝධ කරගත යුත්තක් තිබේ. අප මේ භවයේදී විඳින දුක්, කරදර, පීඩා මේ භවයේදී රැස්කරන ලද කුසල හා අකුසල කර්ම නිසාම ලබන ප්‍රතිඵලයක් ලෙස සිතිය යුතු නොවේ.

"මං මේ තරම් හොඳ වැඩ කරලත්, මෙච්චර පින් දහම් කරලත් මට ලැබෙන්නේ දුකමයි" යනුවෙන් ඔබ තුළ තිබෙන ආකල්පය නිවැරදි නොවන බව දැන් ඔබට වටහා ගත හැකිවනු ඇත. බුදුරජාණන් වහන්සේගේ අග්‍රශ්‍රාවක තනතුර දැරූ මුගලන් මහරහතන් වහන්සේ පිරිනිවන් පාන්නේ සොරුන් විසින් කරන ලද පහර දීමක් මුල්කර ගනිමිනි. පෙර ආත්ම, භවයකදී කළ අකුසල කර්මයක් රහත් ආත්ම භාවයේදීත් පිරිනිවන් පාන්නට ආසන්න අවස්ථාවේදී ඵල දී තිබුණේ එලෙසිනි.



කර්ම ඵල විපාක දෙකක් පිළිබඳව බුදු දහමේ සඳහන් වේ.

උපත ගෙන දීමට බලපාන පටිසන්ධි විපාක ඉන් පළමු වැන්නය.

දෙවැන්න ජීවත් වීමේදී විපාක දෙන ඒවාය. මේවා ප්‍රවෘත්ති විපාක ලෙස දැක්වෙයි.

සාමාන්‍ය අකුසල කර්ම බලවත් කුසල කර්ම කිරීම හේතුවෙන් විපාක නොදී අහෝසි වී යා හැකිය. නමුත් බරපතළ අකුසල කර්ම විපාක ඵල නොදී සිටින්නේ නැත. ඒ අතරිනුත් ආනන්තරීය පාප කර්ම නිසැක වශයෙන්ම පලදීම සිදුවේ.

එය එසේ වුවද සියල්ල සිදුවන්නේ කර්මයට අනුවම නොවේ. සමස්තයක් ලෙස කර්මය පිළිබඳව අප එලෙසම සඳහන් කළත් රෝග සෑදීම සම්බන්ධයෙන් කතා කරන විට ඊට බලපාන හේතු අටක් ගිරිමානන්ද සූත්‍රයෙහි බුදුරජාණන් වහන්සේ විස්තර කළ සේක. කර්මය යනු මෙයින් එකක් පමණි.

මරණය සිදුවීමේ ක්‍රම හතරක් තිබේ.

1. ආයුක්ඛය
2. කම්මක්ඛය
3. උභයක්ඛය
4. උපච්ඡේදක

1. ආයුක්ඛය

කර්ම විපාක තව ඉතිරි වී තිබුණත් ජීවත්වීම සඳහා ලබාගෙන ආ ආයුෂ අවසන් වීම නිසා කෙනකු මරණයට පත්විය හැකිය. උපමාවක් ලෙසින් දක්වුවහොත් පහනක තිරය තිබියදී තෙල් අවසන් වීම නිසා නිවී යාම මෙනි.

2. කම්මක්ඛය

ආයුෂ ඉතිරිව තිබුණත් කර්ම විපාක අවසන් වීමෙන් මරණයට පත්වීමය. එනම් පහනේ තෙල් ඉතිරිව තිබියදී තිරය අවසන් වීම නිසා පහන නිවී යාම බඳුය.

3. උභයක්ඛය

ආයුෂ සහ කර්ම යන දෙකම අවසන් වී පුද්ගලයා මිය යාමයි. පහනේ තෙල් සහ තිරය යන දෙකම දැවී අවසන් වී පහන නිවී යාම මේ සඳහා දැක්විය හැකි නිදසුනකි.

4. උපච්ඡේදක

ආයුෂ සහ කර්ම යන දෙකම තිබියදී හදිසියේම්ය යාමය. පහනේ තෙල් සහ තිරය යන දෙකම තිබියදී සුළඟින් බිම පෙරළීම ආදියෙන් පහන නිවී යාම මීට නිදසුනක් වේ.

ඇතැම් විට මේ ජීවිතය තුළ අධර්මයෙන් දිවි ගෙවන නරක පුද්ගලයකු නිරෝගී බව සහ දීර්ඝායුෂ ලබමින් ජීවත් වන්නට පුළුවන. එසේ වන්නේ පෙර භවවලදී කළ කුසල කර්ම විපාක දීම ලෙසය.

මෙය අපි තවදුරටත් පැහැදිලි කර ගනිමු.

කර්ම වර්ග හතරක් තිබේ.

1. ජනක
2. උපත්තම්භක
3. උපපීඩක
4. උපඝාතක

1. ජනක යනු උපතක් සිදුවීමට බලපාන කර්මයයි. මෙය කුසල කර්මයක් මෙන්ම අකුසල කර්මයක් වුවද විය හැකිය. අකුසල කර්මයකින් නම් දුක්ඛිත ජීවිතයකුත්, කුසල කර්මයකින් නම් සැපවත් ජීවිතයකුත් උරුම වනු ඇත.

අකුසල කර්මයක් නිසා දුක්ඛිත උපතක් ලද කෙනකුට තවත් අකුසල කර්මයක් එකතු වී දුක් විඳින්නට ඉඩ සලස්වන්නට බැරිකමක් නැත. එය උපත්තම්භක කර්මයයි. මෙහි අනෙක් පැත්තත් එසේමය. බලවත් කුසල කර්මයකින් උපත ලබා තවත් බලවත් කුසල කර්මයක් විපාක දීම හේතුවෙන් ඉතාම සැපවත්, පින්වත් ජීවිතයක් ගත කරන්නට අවස්ථාව සැලසීමයි.

උප පීඩක කර්මය යනු මොයයි. අකුසල කර්මයක් හේතුවෙන් දුක්ඛිතව උපත ලබා ඉන්පසු බලවත් කුසල කර්මයක් ඊට හරස්ව විපාක දීමක් ලෙස සැපවත් ජීවිතයක් ගත කිරීම සඳහා මං පෑදීමට පුළුවන. මෙහි ප්‍රතිවිරුද්ධ පැත්ත නම් බලවත් කුසල කර්මයක විපාක ලෙස හොඳ උප්පත්තියක් ලබා ඉන්පසු බලවත් අකුසල කර්මයක් හරස් වීම හේතුවෙන් දුක්ඛිත ජීවිතයක් ගත කරන්නට සිදුවීමයි.

සිව්වැන්න උපඝාතක කර්මයයි. කුසල කර්මයක් නිසා හොඳ උප්පත්තියක් ලැබුවත් බලවත් අකුසල කර්ම ඉදිරිපත් වී කුසල විපාක විනාශ කිරීම උපඝාතක කර්මය වේ. අකුසල විපාල පලදී දුක්ඛිතව උපත ලබා බලවත් කුසල කර්මයක් විසින් ඒ අකුසල කර්ම විනාශ කර සැප විපාක ලබාදීමටද පුළුවන.

දැන් ඔබට මෙහි මුලින්ම සඳහන් කර තිබූ ගැටලුවට පිළිතුරු ලැබී ඇතැයි සිතමු.

පූජ්‍ය ගංතුනේ අස්සජී හිමි

"මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?"

දුටුගැමුණු රජතුමා දෙව්ලොව ගියේ රණබිම කෙලෙස් සතුරන් ජයගත් නිසාද?



ඉඟුරුවත්තේ පියනන්ද හිමියන්ගෙන් අහමු

❐ දුටුගැමුණු රජතුමා රටත්, සම්බුද්ධ ශාසනයත් සතුරන්ගෙන් බේරා ගැනීම සඳහා දියත් කළ මහා සංග්‍රාමයේදී විශාල වශයෙන් මිනිස් ඝාතන සිදුවූ බව දැක්වේ. එහෙත් ඒ සියල්ලට අණ දුන් රජතුමා මරණින් පසු සුගතිගාමී වූ බව කියවේ. මේ පිළිබඳ ධර්මානුකූල පැහැදිලි කිරීමක් කළොත්.

බුද්ධ දේශනාවේ අන්තර්ගත කර්ම විභාගය (කුසලාකුසල කර්ම සහ ඒවායෙහි විපාක පිළිබඳ) බෞද්ධ වූ අප විසින් මැනවින් ඉගෙන ගත යුතු කොටසකි. සිත හා කර්ම විපාක පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැතිකමින් මෙබඳු ගැටලු, ප්‍රශ්න ඇතිවන බව කිව යුතුය. යමෙක් අතීත පවක් අකුසලයක් සිදුවූ පමණින්ම ඔහුට සුගතිය වැසී ඇතැයි කියා හෝ යමෙක් පුණ්‍යකර්මයක් කළ පමණින්ම සුගතිගාමී වන්නේය කියා හෝ සම්මතයක් නැත.

මහා පරිමාණයේ මිනිස් ඝාතන කළ අංගුලිමාල, චෝර ඝාතක වැන්නෝ පවා අකුසල විපාක යටපත් කරමින් ඉදිරිපත් වූ කුසල විපාකයෙන් සුගතිගාමී වූ අවස්ථා මෙන්ම අර්හත්වය පවා පසක් කළ බව පෙනේ. බොහෝ කුසල් කළ මල්ලිකා දේවි, ධර්මාශෝක රජතුමා වැනි අය කුසල විපාකයන් මැඩගෙන ඉදිරිපත් වූ අකුසල විපාක ශක්තියෙන් දුගතියට ගිය බවත් දක්වෙයි. අකුසල පක්ෂයේ ආනන්තරීය කර්ම පස සහ නියත මිත්‍යා දෘෂ්ටිය අනතුරු භවය කෙළින්ම දුගතියට පමුණුවයි. විශේෂයෙන් ආනන්තරිය කර්මයක් කළ තැනැත්තා ඒ ජීවිතයේදී කෙතරම් කුසල කර්මයක් කර තිබුණත් අනතුරු ආත්මභාවය දුගතියට යාමෙන් වැළකිය නොහේ. නියත මිත්‍යා දෘෂ්ටිය මරණයට ආසන්නයේ හෝ අත්හැර සම්‍යක් දෘෂ්ටිකයෙක් වුවහොත් යම් කුසල විපාකයක්ද ඉදිරිපත් වුවහොත් සුගතියට යාමට ඉඩ ඇත. කුසල පක්ෂයෙන් මාර්ග ඵල ලබාගත හොත් එයට පෙර කෙතරම් අකුසල කර්මයන් කර තිබුණද ඒවා යටපත්ව සුගතියට පමුණුවයි. ලබා ගත් ධ්‍යානය නොපිරිහී පැවතුණහොත් (මරණාසන්නය දක්වා) ධ්‍යාන තලයක උපත ලබා දෙයි.

දුටුගැමුණු රජු තමාගේ ආත්ම ලාභය තකා හෝ එබඳු වෙනස් පටු ආකල්ප මත පිහිටා හෝ යථෝක්ථ සංග්‍රාමය සිදු නොකළ බව පෙනේ. රාජ්‍යත්වයට පෙරත්, රජවූ පසුත් බුදු සසුන පිළිබඳ තිබූ උදර අදහස් හා සසුන් කෙත වනසන සතුරන් ගෙන් ලත් බුදු සසුන බේරා ගැනීම එතුමා තුළ වූ උදර අදහසයි. සැදැහැවත් බෞද්ධ නරපතියකු වූ හෙතෙම ආනන්තරීය අකුසල කර්ම කළ අයෙක්ද නොවේ. රාජශ්‍රීයට පත්වූ පසු උදර සසුන් මෙහෙයක් සිදු කළ අතර සියලු ආගමික ජන කොටස් කෙරෙහි දැහැමින්, සෙමින් රාජ්‍ය කළ බවද දැක්වෙයි. එමනිසාම ආචිත්න ආසන්න කර්ම යහපත් විය. සුගතියක ඉපදීමට අවස්ථාව යෙදිණි.

එහෙත් කුමන අරමුණකින් කළද මිනිස් ඝාතනය පවතී. සාංසාරික ජීවිතයකදී හෝ අවස්ථාවක් ලදෙත් ඒවායෙහි කටුක් විපාක විඳින්නට සිදුවෙයි. දුටුගැමුණු රජු මරණින් මතු දෙව්ලොව උපන් නිසා දිව්‍ය ලෝකය මිනිස් ලොව තරමට උපච්ඡේදනය අකුසල විපාක ඉදිරිපත් වීම අඩුය. එමනිසා ඇතැම් විට නැවතත් සුගතියකම උපත ලබාදෙන යට කී අකුසල විපාක අහෝසි වී යයි. රහත් වුවහොත් සියලු කර්ම විපාක අහෝසි වෙයි. දුටුගැමුණු රජු සිදු කළ මහා සංග්‍රාමයේදී ආරම්භයේ සිටම සතුරන් නැසීමේ ක්‍රියාවලියේදී වැඩි දයකත්වයක් ගෙන ක්‍රියා කළෝ දස මහා යෝධයෝය. ඔවුහු රණශූර සේනාපතියෝ වෙති. වැඩි ප්‍රමාණයක් මිනිස් ඝාතන සිදු කරන ලද්දේ එම සෙන්පතියන් සහ ඔවුන්ගේ පිරිස්ය. යුද්ධය ජයග්‍රහණය කිරීමෙන් පසු මහරජුගෙන් අවසර ගෙන ඒ සෙන්පතියන් කිහිප දෙනෙක්ම සසුන් ගතවී අර්හත්වය ලබාගෙන බාහිර සතුරන් මෙන්ම කෙලෙස් සතුරන්ද ජය ගත්හ. පෘතග්ජන පුද්ගලයන් අතින් නොයෙකුත් පාප ක්‍රියා අකුසල් සිදුවේ. නමුත් ඒ ප්‍රාණඝාතාදී පාප ක්‍රියා භාවිත බහුලීකාත වශයෙන් නැවත නැවතත් සිදු කෙරේ නම් දුගතියට බරය. ඒ මක්නිසාද එම කර්මයන් ආචින්න ආසන්න කර්මයන් බවට පත්වන හෙයිනි.

"යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ."



8 නරකින් වැළකුණු පමණින්ම හොඳ කෙනෙක් වෙන්න බැහැ

ගිහි ගෙදරට බුදු බණ

පංචශීල ප්‍රතිපදාව සෑම ආගමකම වාගේ ක්‍රියාත්මක වන ප්‍රතිපත්තියකි. එය බුදු දහමේ ඒ නමින් හැඳින්වුවද වෙනත් ආගම්වල වෙනස් ආකාරවලින් දක්වා තිබිය හැකිය. කෙසේ වුවද සෑම ආගමික නායකයකුම පංචශීල ප්‍රතිපදාව ඉගෙන ගෙන තිබෙන්නේ සමාජය තුළිනි. විශේෂයෙන් පංචශීලයෙන් ඉගැන්වෙන වැළකීමේ අංගය සමාජය තුළින් දකින දෑ අවබෝධ කරගැනීම හරහා එය ආගමික නායකවරු ලෝකයට ඉදිරිපත් කළහ.

අපි නිදසුනක් ගනිමු.

මිනිසා ගල් යුගයේ සිට කෘෂි යුගයට එනවිට කෘෂිකාර්මික කටයුතු සඳහා බෙහෙවින් උපකාරී වූ සත්වයකු වූයේ ගවයාය. ගවයා සමග එහිදී මිනිසා සමීප ඇසුරක් පැවැත්වූ නිසා උගේ බඩගින්න, නිදිමත, වෙහෙස, බිය, සංත්‍රාසය, හිංසාවට දක්වන බිය වැනි දේවල් මිනිසාට



අවබෝධ කරගත හැකි විය. ඒ අනුව අපට දැනෙන හැඟීම්ම උඹටත් දැනෙන බව වටහා ගනිත්ම ගවයා නොමැරිය යුතු බවට සම්මුතියක් සමාජය තුළින්ම ගොඩ නැගිණි. පංච ශීලයෙහි එන පළමු ප්‍රතිපදාව වන සතුන් නොමැරීම ගොඩනැගුණේ එපරිද්දෙනි.

පෞද්ගලික දේපළ පිළිබඳ සංකල්පය මිනිසුන් තුළ ඇති වුණේ කෘෂි යුගයේදීය. කැලයේ ජීවත් වීමේදී කැලය හැමදෙනාටම සමසේ අයිති විය. නමුත් ගොවිතැන් කිරීමේදී මිනිසුන් තමන්ගේ කියා කොටසක් වෙන්කර ගැනීමට පෙළඹුණි. ඒ අනුව තමන් විසින් වෙන්කර ගන්නා ලද කොටස තව කෙනෙක් පැහැර ගන්නවාට මිනිස්සු අකමැති වූහ. ඒ අනුව එය වරදක් බවට සමාජ සම්මුතියක් ඇති විය.

සොරකම් නොකිරීම යන දෙවන ශික්ෂා පදය සමාජය තුළට පිවිසියේ එපරිද්දෙනි.

කෘෂි යුගයේදී ගොවිතැන් කටයුතු සඳහා ගෙහිමියා නිවසින් නික්ම ගිය පසු ගෙදර දොර හා දරුවන් බලා කියාගෙන නිවසේ රැඳී සිටියේ ගෘහණියයි. එවැනි කාන්තාවක් පමණක් සිටින නිවසකට අන් පුරුෂයකු ගොස් කරදර කිරීම නොමනා හා නොකළ යුතු ක්‍රියාවක් බවට සමාජ සම්මුතියක් ඇති විය. තෙවන සිල් පදය වන කාමයෙහි වරදවා නොහැසිරිය යුතුය යන්න බිහිවීමට පාදක වූයේ එයයි.

කෙනකු මහන්සියෙන් උපයා සපයා ගත් දේ තව කෙනකු විසින් හොරෙන් පැහැර ගැනීම නොකටයුතු ක්‍රියාවක් ලෙස සමාජය අවබෝධ කරගත් නිසා සිව් වන සිල් පදය බිහි විය.

කෘෂි යුගයේදී සිරුර වෙහෙසා වැඩ කරන පිරිමින් වැඩ කටයුතු අවසානයේ මත්පැන් ටිකක් ගත්තේ ඇඟේ මහන්සිය යන්නටය. පසුව ඔහු ඉබේම එහි වහලෙකු බවට පත්ව අවසානයේ කායික මානසික කුසීත බව, කල්පනා ශක්තිය මොටවීම, සිරුර වෙහෙසා වැඩ කිරීමේ හැකියාව නැතිවී යාම වැනි බොහෝ අහිතකර ප්‍රතිවිපාක අත්පත් කරගත්හ. සුරාපානය නොකළ යුත්තක් බවට සම්මුතියක් ඇතිවූයේ එලෙසිනි. ඒ පස්වන සිල් පදය බිහිවීමට හේතුපාදක වූ කාරණාවන්ය.

බුදුරජාණන් වහන්සේ ලෝකයේ පහළ වනවිටත් මේ සම්මුතිය සමාජය තුළ පැවතිණි. ඒ අනුව ශීලය යනු සමාජය තුළ එදත් පැවැති දෙයක් මිස බුදුරජාණන් වහන්සේ විසින් පළමු වරට හඳුන්වා දුන් දෙයක් නොවේ.

සෑම ආගමකම පංචශීල ප්‍රතිපදාව යම්තාක් දුරට පැවතියත්, බුදු දහම ඒ ප්‍රතිපදාවන් තුළ තවදුරටත් ඉදිරියට ගිය ඉගැන්වීමකින් යුතුය. ඒ අනුව බුදු දහමේ විරමනය සහ සමාදානය ලෙස කරුණු දෙකක් දක්වා ඇත. විරමනය යනු වැළකීමය. එය ඕනෑම ආගමක තිබිය හැකිය.

සමාදානය යනු කැමැත්තෙන් වැළඳ ගැනීමය.

ඒ අනුව වළකින්නේ නරක දේවල්වලිනි. වැළඳ ගන්නේ හොඳ දේවල්ය. නරක දෙයින් වැළකී සිටියාට මදිය. හොඳ දේ වැළඳ ගැනීමද කළ යුතුය.

''මම සියලු නරක පුරුදුවලින් වැළකිලා ඉන්නේ, ඒ නිසා මං හොඳ කෙනෙක්.''

සමහරු මෙසේ තමා පිළිබඳව ආත්ම වර්ණනා කරති. නමුත් කිසිදු නරක වැඩක් නොකර සිටීම යනු නරක නෑ යන්නය. නරකින් වැළකුණු

''දෙවූ වහාම කිරි නොමිදෙන්නාක් මෙන් කෙනෙකු විසින් කරන ලද පව වහා නොමෝරයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් ඔහු දවමින් අසුපස ලුහු බඳී.''



පමණින් හොඳ වන්නේ නැත. හොඳ වන්නට නම් හොඳ දේවල් කළ යුතුය. නිදසුනක් ලෙස කතා කරන්නට බැරි ගොළු මිනිසකු කවදාවත් බොරු කියන්නේ නැත. ඒ කතා කරන්නට බැරි නිසාය. එය හොඳක් නොවේ. නරක නැතිකම පමණි. නරකින් වැළකීම සහ කැමැත්තෙන් වැළඳ ගත යුතු සාරධර්ම වැළඳ ගැනීම යන මේ දෙකෙන්ම පෝෂණය වීම හොඳ යන්නෙන් අදහස් කෙරේ.

බුදුරජාණන් වහන්සේ සබ්බ පාපස්ස අකරණං යන ගාථාවෙන් දේශනා කළේ එයයි.

''සබ්බ පාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝදපනං
ඒතං බුද්ධානු සාසනං''

''සියලු පව් දුරු කරන්න. කුසලය (සිත දියුණු කරවන, සිත පිරිසිදු කරන, සිතේ දක්ෂතාව ඇති කරන සිතිවිලි) දියුණු කරන්න. ඒ තුළින් පරිපූර්ණ පුද්ගලයකු බිහිවෙයි'' යන්න එහි අදහසය.

ඒ අනුව හොඳක් නැති කරගත් පුද්ගලයකු බිහි වී ඵලක් නැත. එය හරියට පතෝල මෙනි. නරකින් වළකින සේම හොඳ දේ දියුණු කිරීම යන මේ කරුණු දෙක තුළින් පරිපූර්ණ මිනිසකු බිහිවෙයි. පංචශීල ප්‍රතිපදාවෙහි එන නරක දෙයින් වැළකීමේ පැත්ත අනුගමනය කරනු සේම කැමැත්තෙන් දියුණු කරගත යුත්තේ මොන ගුණාංගද යන්න ගැන ඔබට අවබෝධයක් තිබිය යුතුය.

පූජ්‍ය තලල්ලේ චන්දකිත්ති හිමි

''තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය.''

ධර්ම දේශනය



විචාරශීලී සහ තර්කානුකූල වීමේ වැදගත්කම



දේශකයාණෝ : ශ්‍රද්ධාමෝපාලි
මහානිකායේ මල්වතු මහාවිහාර
පාර්ශ්වයේ විංශද්වර්ගික
කාරක සංඝ සභික
පූජ්‍ය නිබ්බටුවාවේ
ශ්‍රී සිද්ධාර්ථ මේධංකර
නේවාවාහාර නායක
ස්වාමීන්දුයන් වහන්සේ

"එවං වුත්තෙ භගවා ජාණුසෙසාණිං බ්‍රාහමණං එතදවොච: 'න බ්‍රො බ්‍රාහමණ, එත්තාවතා හත්ථිපදමො විත්ථාරෙන පරිපූරො හොති. අපි ච බ්‍රාහමණ, යථා හත්ථිපදොපමො විත්ථාරෙන පරිපූරො හොති, තං සුණාහි, සාධුකං මනසි කරොහි, භාසිසසාමී'ති. එවං භොති බ්‍රො ජාණුසෙසාණි බ්‍රාහමණො භගවතො පචචසෙසාසි. භගවා එතදවොච:"

"බුදුරජාණන්වහන්සේ ජාණුස්සොනි බ්‍රාහ්මණයාට මෙසේ වදාළ සේක. 'මෙපමණකින් හස්ථිපදොපමය සම්පූර්ණ නොවේ. එය විස්තර වශයෙන් දේශනා කරමි. ශ්‍රවණය කරන්න. මනාකොට මෙනෙහි කරන්න.' එවිට ජාණුස්සොනි බ්‍රාහ්මණයා, 'එසේය භාග්‍යවතුන්වහන්ස' යනුවෙන් පිළිතුරු දුන් පසු ඔහුට මෙම සූත්‍ර දේශනාව දේශනා කොට වදාළ සේක."

පින්වත්නි,

මෙම චුල්ලහත්ථිපදෝපම සූත්‍ර දේශනාව, භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර අනේපිඬු සිටුවරයා කරවූ ජේතවනාරාමයෙහි වැඩවසන කල්හි, ජාණුස්සොණි බ්‍රාහ්මණයා අමතා දේශනා කොට වදාළ සේක. එහි සඳහන් වන ජාණුස්සොණි බ්‍රාහ්මණයා, සැවැත්නුවර වාසය කළ මහාසම්පත් ඇති අයෙකි. ඔහු හය මසකට වරක් නගර ප්‍රදක්ෂිණාව කරයි. බ්‍රාහ්මණයා නගර ප්‍රදක්ෂිණාවේ යෙදෙන දින, නගරවැසියෝ වීදි ඇමද පිරිසිදු කරති. සුදුවැලි අතුරා මලින් අලංකාර කරති. ඔහු වීදි ප්‍රදක්ෂිණාව සඳහා ගියේ රිදී පැහැ වස්ත්‍රයෙන් සැරසී සුදෝසුදු අසුන් යෙදූ රථයක නැගීගෙනය. ජනතාව ද, ඇමතියෝ ද එසේම සැරසී ගමන්ගත්හ. ඔහු ගමන් ගන්නා මගෙහි පළමුව මගදෙපස රැස්ව සිටින ළමුන්ට පළතුරු බෙදා දෙයි. මසුරන් කහවණු කැමති කෙනෙකුට අසුලා ගැනීමට විසිරුවයි. දිනක් මේ බ්‍රාහ්මණයා මහත් උදාර ලීලාවෙන් නගරය ප්‍රදක්ෂිණා කරන විට පැරණි මිතුරෙකු වූ පිලොතිකා නම් පරිබ්‍රාජකයා මුණගැසිණ. පිලොතිකා පරිබ්‍රාජකයා බුදුරජාණන්වහන්සේ ඇසුරු කොට උන්වහන්සේගේ ගුණනුවණ දැන හැඳින පැහැදී සිටි අයෙකි.

ජාණුස්සොණි බ්‍රාහ්මණයා බුදුරජාණන්වහන්සේ හමුවට පැමිණෙන්නේ, පිලොතිකා නම් පරිබ්‍රාජකයා විසින් බුදුරජුන්ගෙන් ධර්මය අසා පැහැදුනු ආකාරය ඇත් පා සටහන් උපමා කොට ජාණුස්සොණි බ්‍රාහ්මණයාට පහදා දීමෙන් අනතුරුවය. එයින් බුදුරජාණන්වහන්සේ කෙරෙහි පැහැදුණු ජාණුස්සොණි බ්‍රාහ්මණයා පිලොතිකාට ස්තුති කොට බුදුරජාණන්වහන්සේ හමුවී පිළිසඳරෙහි යෙදීමට සිතාගෙන, බුදුරජාණන්වහන්සේ කරා එළඹ එකත්පස්ව හිඳ, පිලොතිකා පිරිවැජියා සමඟ සිදුවූ පිළිසඳර සම්පූර්ණයෙන්ම හෙළිකර සිටියේය. එවිට බුදුරජාණන්වහන්සේ මෙම සූත්‍රදේශනාව දේශනා කොට වදාළ සේක.

බමුණ, හත්ථිපදොපම උපමාව මෙතකින් සම්පූර්ණ නොවේ. එය සපුරා දේශනා කරමි. කිසියම් ඇත් පාලකයෙක් වනයට පිවිස දිග පළලෙන් විශාල ඇත් අඩියක් දුටු පමණින් එය මහඇතෙකුගේ යැයි නොසිතයි. වනයේ මහපාද ඇති වාමනික නම් ඇතිනියක සිටින නිසාය. ඔහු එසේ සිතා ඉදිරියට යන විට දිග පළලෙන් යුත් විශාල ඇත්අඩියක් ද, රියන් අටක් පමණ ඉහළ ගසක ඇඟ ඉලූ සටහන් ද දක්නට ලැබී මෙය මහඇතාගේ යැයි නිගමනයකට නොපැමිණෙයි. නැවත විමසන විට උච්ඡාකාළාරිකා නම් එක දළයක් උස්ව ද එක් දළයක් පහත්ව ද පිහිටි මහඇතිනි විශේෂයක පියවර සටහන් දක්නට ලැබෙයි. එහිදී ද මේ මහඇතෙකුගේ යැයි තීරණයකට නොඑළඹි ඉදිරියට යන ඔහුට මහඇත් පියවර සටහනක් ද උඩ අතුවල ගැටුණු තැන් ද දළ පහර ද ඉදිරියෙහි සිටින මහඇතෙක් ද දක්නට ලැබෙයි. ඒ ඇතා උච්ඡාකණේරුකා නම් උස් සිරුරින් යුත් ඇතින්නිකැයි දැක නිශ්චයකට පැමිණෙයි.

එපරිද්දෙන් ලොව පහල වූ බුදුන්වහන්සේ දහම් දෙසන විට එය අසා බොහෝ දෙනා ගිහිසැප අතහැර සසුන්හි පැහැදී පැවිදි වෙති. සිල් රැක ඉන්ද්‍රිය සංවරසීලයෙන් ද ද්වේෂයන්ගෙන් ද මිදී සුව විඳිති. ඒම යාම ආදී සෑම ඉරියව්වක්ම සිහිනුවණින් යුතුවම සිදුකරයි. නීවරණයන්ගෙන් සිත පිරිසිදු කරගෙන ධ්‍යානයන් උපදවා ධ්‍යානයෙන් පිරිසිදු වී ඥානය පහල කරගනිති. චතුරාර්ය සත්‍යය අවබෝධ කරගෙන සියලු දුක්වලින් මිදුණු රහත් භාවයට පත්වෙති. සියලු දුකින් මිදුණු බුදුරජාණන්වහන්සේ සම්‍යක් සම්බුද්ධය. ධර්මය ස්වාඛ්‍යාතයි. ශ්‍රාවක සංඝයා සුප්‍රතිපන්නයි. ජාණුස්සොණි බ්‍රාහ්මණයාගේ දම්දෙසීම ගැන පැහැදී ඇත් පා උපමාවෙන් සසඳා ඇත්තේ නීවරණ ප්‍රහාණය දක්වා කළ ධර්ම දේශනාව ඇත්වනයයි. එහි දක්ෂ ඇත්වන වැසියා නම් නිවන් පතා පිළිවෙත් පුරන යෝගාවචරයාය. මහ පා ආදී සටහන් නා නා අභිඥාවෝයි. මහඇතා නම් බුදුරජාණන්වහන්සේයි.

දක්ෂ ඇත්වන වැසියෙක් මෙය වාමනික ඇතිනියගේ පා සටහන්ය, මේවා කාළාරිකා ඇතිනියගේ පා සටහන්ය යනුවෙන් දැන මහ පා සටහන් යැයි නිගමනයකට නොඑළඹ, මෙය කණේරුකා ඇතිනියගේ පා සටහන් බවට නිගමනයකට පැමිණියාක් මෙන් යෝගාවචරයා ධ්‍යාන, අභිඥා වෙනත් ශාසනයන්හි ද පවතී යැයි නොපිළිගෙන, අනෙකෙකුගේ යැයි නිගමනයකට නොඑළඹ ආර්ය ශ්‍රාවක අරහත් රහත් භාවයට පැමිණ, සීල, සමාධි, ප්‍රඥා, විමුක්ති, ඥානදර්ශන මගින් මේ බුදුරජාණන්වහන්සේ යැයි හඳුනා ගනියි.

මෙසේ බුදුවරයන් ඉපිද, කෙලෙසුන් නසා, තමන්වහන්සේම අවබෝධ කොටගත් බැවින් සම්මාසම්බුද්ධ වූ, විජ්ජාචරණ සම්පන්න වූ, නිර්වාණය නමැති සුන්දර තැනට ගිය හෙයින් සුගත නම් වූ, ත්‍රිවිධ ලෝකය දත් හෙයින් ලෝකවිදූ නම් වූ, ගුණ නුවණින් තමන් වහන්සේට වැඩි කෙනෙක් නැති හෙයින් අනුත්තර නම් වූ, නොදැමුණු පුද්ගලයන් දමනය කරන හෙයින් පුරිසධම්මසාරථී නම් වූ, දෙවිමිනිසුන්ට අනුශාසනා කරන හෙයින් සත්ථා නම් වූ, සියලු සතුන්ට උතුම් වූ හෙයින් භාග්‍යවත් වූ සර්වඥයන් වහන්සේ දෙව් බඹුන්, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ මේ ලෝකය ස්වඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට දැන ප්‍රකාශ කරති. මුල, මැද, අග යහපත් වූ ධර්මය දේශනා කරති.

භාග්‍යවතුන්වහන්සේ පැසසිය යුත්තන් අතර පැසසුම් ලැබූවේ අනන්ත වූ මුණි ගුණයෙන් බැබළෙන නිසාය. උන්වහන්සේට වෙනත් අයගේ පැසසීමක් අවශ්‍ය වූයේ නැත. සියලු ලෝවැසියෝම උන්වහන්සේගේ අනන්ත වූ බුදුගුණයන් පසසති.



මෙම සූත්‍ර දේශනාවෙහි ඤාණ පද හතරක් හා පණ්ඩිතවරු හතර දෙනෙක් ගැන කියැවේ. ඉන් ක්ෂත්‍රීය පඬිවරු, බ්‍රාහ්මණ පඬිවරු, ගෘහපති පඬිවරු බුදුන් හා වාදයට ගොස් පැරද බුදුන්ගෙන් බණ අසා ශ්‍රාවක බවට පත් වෙති. ශ්‍රමණ පඬිවරු උන්වහන්සේගෙන් බණ අසා පැවිදිව නිවන් අවබෝධකර ගත්හ. බුදුරජාණන්වහන්සේ ඒ සැමට සීල, සමාධි, ප්‍රඥා නම් වූ මුල, මැද, අග යන තුන් තැන්හි යහපත් වූ ධර්මය සමඟ මධ්‍යම ප්‍රතිපදාව නම් වූ ආර්යඅෂ්ටාංගික මාර්ගය ද, ගිහිගෙයින් නික්මීම නම් වූ බ්‍රහ්මචර්යාව ද වදාරති. මේ ධර්මය අසන නුවණැති කුලපුත්‍රයා බුදුරජාණන්වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකර ගනියි. ඔහු ගිහිගෙය සම්බාධක සහිත බැවිනුත්, පැවිදි ජීවිතය සම්බාධක රහිත නිදහස් ජීවිතයක් බැවිනුත් බ්‍රහ්මචර්යාව දැරීම ඉතාම වටිනා බව

අවබෝධ කරගෙන, හිස රැවුල් බා කසාවත් හැඳ පොරවාගෙන උතුම් පැවිද්ද ලබා හුදකලාව සීලයෙහි පිහිටා සිටියි.

සීලය රක්ෂා කරන ඔහු ප්‍රාණඝාතයෙන් වෙන් වෙයි. අදත්තාදානයෙන් වෙන් වෙයි. කාමයෙන් වෙන් වීම නම් වූ බ්‍රහ්මචර්යාවෙහි යෙදෙයි. මුසාබස්, කේලාම්, හිස්වචන, පරුෂ වචන නොකියයි. බොහෝ ජනයාගේ සිතසුව පිණිසම සත්‍ය වචන කථා කරයි. ධර්මයම පවසයි. නිසි දෙය නිසි කලට කියයි. පැළවන දේ හා පැළවුනු දේ නැසීමෙන් වළකී. අවේලාවෙහි වැලඳීමෙන්, නැටුම් ගැයුම් ආදියෙන්, සුවඳ විලවුන් දැරීමෙන්, උසසුන්, මහසුන් දැරීමෙන් වැළකී සිටියි. රන්, රිදී, මුතු, මැණික් දැරීමෙන් හා පිළිග ැනීමෙන් වළකී. නොපිසූ ධාන්‍ය වර්ග මස් වර්ග පිළිනොගනී. දැසි දස් කුමාරියන් හා සතුන් පිළිගැනීමෙන් වළකියි. ගිහියන්ගේ පණිවිඩ ගෙන යාම, අල්ලස් ගැනීම, මංපැහැරීම වැනි නොහොබිනා වැඩ නොකරයි. පා සිවුරු වලින් සෑහීමට පත්වේ.

මෙසේ ආර්ය සීලය සමාදන් වූ භික්ෂුව ලෝකෝත්තර ඥානය ඇති කර ගැනීමට ඉඩ නොදෙන පංචනීවරණයන්ගෙන් මිදී ජීවත් වෙයි. පංචේන්ද්‍රියන් කෙරෙහි බැඳීමක් නොමැතිව ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වෙයි. යාම්, ඒම්, ඉඳුම්හිටුම්, කෑමබීම, මළමූත්‍ර පහකිරීම ආදිය සිහියෙන් යුක්තවම සිදුකරයි. වන සෙනසුන්, රුක්, පර්වත, ගුහා, සොහොන් පිටි ආදිය වාසස්ථාන කොට වාසය කරයි. වීර්යයෙන් යුක්තව කර්මස්ථාන වඩා සමාධිය ඇතිකර ගනියි. සමාධියට යොමු වූ භික්ෂූන් වහන්සේ අභිද්‍යාවෙන්, ව්‍යාපාදයෙන්, ථීනමිද්දයෙන් සිත නිදහස් කර ගනී. ගතේ හා සිතේ ඇති කම්මැලිකම දුරුකර ගනියි. කුසල ධර්මයන් කෙරෙහි සැකයක් ඇති කර නොගනී. පසුතැවීම,



උද්දච්ඡකුක්කුච්චය නැති කර පංච නීවරණයන්ගෙන් සිත නිදහස් කරගන්නා භික්ෂූන් වහන්සේ ප්‍රථමධ්‍යානය ලබයි. ප්‍රථමධ්‍යානය චතුර්ථධ්‍යානය දක්වා මෙසේ ධ්‍යාන වඩන භික්ෂුව බුදුරජාණන්වහන්සේ සම්මා සම්බුද්ධය. ධර්මය ස්වාක්ඛාතය. ශ්‍රාවක සංඝයා පිළිවෙතින් සම්පූර්ණය යන නිෂ්ඨාවට පැමිණෙයි. එයින් නොනවතින ආර්ය ශ්‍රාවකයා පෙර උපන් ජාති දැනීමේ ඥානය, සත්වයන්ගේ නැතිවීම්, ඉපදීම් දත හැකි ඥානය, සියලු කෙලෙසුන් නැතිකිරීමේ ඥානය ලබයි. එයින් නොනැවතී ඉදිරියට යන විට දුක පිළිබඳ නිවැරදි දැනීම, දුක හටගැනීම, දුක නැතිකිරීම, දුක නැතිකිරීමේ මාර්ගය පිළිබඳ නිවැරදි දැනුම ලබයි. එයින් නොනවතින ආර්ය ශ්‍රාවකයා කාමාශ්‍රවයන්ගෙන් සිත නිදහස් කර ගනී. භවාසාව දුරුකර ගනී. අවිද්‍යාවෙන් සිත නිදහස් කර ගනී. මේ සියල්ලෙන් මිදීමෙන් විමුක්ති ඥානය ඇති වෙයි. විමුක්ති ඥානය ලත් විට නැවත ඉපදීමක් නැත.

මෙම පිළිවෙත තථාගත ධර්මය අවබෝධ කිරීමේ පිළිවෙතයි. බුදුරජාණන්වහන්සේ සේවනය කිරීමයි. ඒ නිසා බුදුරජාණන්වහන්සේ සම්බුද්ධ බවත්, ධර්මය ස්වාක්ඛාත බවත්, ශ්‍රාවක සංඝයා පිළිවෙතින් පූර්ණ බවත් මැනවින් දැන, සම්බුදු දහමේ පූර්ණ අවබෝධය ලබයි. ඇත් පා උපමාව ගෙනහැර දක්වා ශ්‍රාවකයන්ගේ කාම, අවිද්‍යා, භව ආශාවන්ගෙන් සිත මුදවා විමුක්ති ඥානය ලැබ උතුම් අර්හත් තත්ත්වයට පත්වෙයි.

එය මනාව අසා සිටි ජාණුස්සෝණි බ්‍රාහ්මණයා ස්වාමීනි ඉතා යහපත්ය. යටිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කරන්නාක් සේ, වසා තබන ලද්දක වැසුම් හරින්නා සේ, මංමුලාවූවෙකුට මග කියන්නා සේ, අඳුර නැසීමට තෙල් පහනක් දරන්නා සේ නොයෙක් ආකාරයෙන් තථාගතයන්වහන්සේ ධර්මය දේශනා කරන ලදහ. ස්වාමීනි, මම භාග්‍යවතුන්වහන්සේ සරණ කොට යමි. ධර්මය හා සංඝයා සරණ කොට යමි. අද පටන් දිවි ඇති තෙක් මම ශ්‍රාවකයෙක් කොට සලකනු මැනවි.

මෙම සූත්‍රදේශනාවට මුල් කොට මහින්ද මහරහතන්වහන්සේ ලක්දිව මිහින්තලාවට වැඩි මුල් අවස්ථාවෙහි දේවානම්පියතිස්ස රජු ඇතුළු පිරිසට දහම් දෙසූ සේක. එම දේශනාව මගින් දකින හැම කරුණක්ම විචාරශීලීව තර්කානුකූලව පිළිගත යුතු බව පැහැදිලි කරයි.

ලක්දිවට බුදුසසුන රැගෙන ආ මහින්ද මහරහතන්වහන්සේ දේවානම්පියතිස්සර රජු ඇතුළු පිරිසට පළමුව කළ ධර්ම දේශනාවට ද මුල්වූ මෙම සූත්‍ර දේශනාව උතුම් පොසොන් පොහෝ දිනයේ දී දැන හඳුනාගෙන උතුම් ත්‍රිවිධ රත්නයේ ගුණකද මැනවින් දැන, එය ජීවිතයට යාකර ගැනීමට අදිටන් කර ගනිමු.

තෙරුවන් සරණයි.

"යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි."

මිහින්තලාව අළුතක කොට සිංහල බෞද්ධ ශිෂ්ටාචාරයක් ගැන කතා කළ හැකිද?

ශ්‍රී ලංකාව රාජධානියක් බවට පත්වූයේ විජය කුමාරයාගේ පැමිණීමත් සමගය. මිහිඳු මහරහතන් වහන්සේගේ පැමිණීමත්, දේවානම්පියතිස්ස මහරජතුමා බුදු දහම වැළඳ ගත් නිසාත් ශ්‍රී ලංකාව බෞද්ධ රාජ්‍යයක් බවට පත්විය. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වසර 236 කට පසුව එළඹුණ පොසොන් පොහොය දිනයේ මිහිඳු මහරහතන් වහන්සේ මිස්සක පව්වට වැඩම කිරීමෙන් පසුව සිංහලයන්ට නව ජීවන දර්ශනයක් මෙන්ම ජීවන මගක් උදාවිය. මිස්සක පව්වෙන් ආරම්භ වූ සිංහලයන්ගේ ප්‍රෞඪ ශිෂ්ටාචාරය දිරිමත් වූ ගමන් මග අද දක්වාම දශක ගණනාවක්ම සිංහලයන් විසින් ඉදිරියට ගෙන ආ ප්‍රෞඪ ඉතිහාසයකි.

ශ්‍රී ලංකාව ථේරවාදී බුදු දහමේ කේන්ද්‍රස්ථානයක් විය. මෙහි ගෞරවය හිමිවිය යුත්තේ අශෝක මහරජාණන්ටය. ඔහු තම පුත් මහින්ද හා දියණිය සංඝමිත්තා ශ්‍රී ලංකාවට එවීමෙන් කර ඇත්තේ මහත් ඓශ්වර්යාත්මක බෞද්ධ වන්දනාවකි. පාඨලීපුත්‍ර නුවර (පැලඔප් නුවර - වර්තමාන පැට්නා නගරය) පැවැත්වූ තුන්වන ධර්ම සංඝායනාවේදී අශෝක අධිරාජ්‍යයා මහතෙරුන් වහන්සේලා වූ මිහිඳු, ඉට්ඨිය, උත්තිය, සම්භල හා බද්දසාල යන මහතෙරුන් අමතා ලක්දිවට ගොස් බුදු සසුන පිහිටුවන ලෙස උපදෙස් දී ඇති බව ඓතිහාසික තොරතුරුවලින් අනාවරණය වේ.

මිහින්තලාව අපගේ ඉතිහාසයේ ඉතා වැදගත් ස්ථානයක් ගන්නා බව ඉතිහාසඥයන්ගේ මතයයි. ඉන් පළමුවැන්න ඉතිහාසයේ පළමු වරට සිංහල බෞද්ධ රජතුමෙකු බිහිවන්නේ මිහින්තලයේදීය. මිහිඳු මහතෙරුන් වහන්සේ දෙසූ ධර්මය තේරුම් ගත් දේවානම්පියතිස්ස රජතුමා බුදු දහම වැළඳ ගත්තේ මිහින්තලේදීය. ශ්‍රී ලංකාව සිංහල බෞද්ධ රාජ්‍යයක් බවට පත්වූයේ මිහින්තලේදීය. බෞද්ධ රාජ්‍යයකට අවශ්‍ය පදනම් වන කාරණා දෙක ලෝකය හා ශාසනයයි. ඒ පදනමද ඇතිවූයේ මිහින්තලේදීය. ඒ නිසා මිහින්තලය මෙරට ඉතිහාසයේ මුල් තැනක් ගනී.

මිස්සක පර්වතය මිහිඳු මාහිමියන් වැඩම කිරීමට පෙර පැවතුණේ පූජා භූමියක් හෝ ශුද්ධ භූමියක් ලෙස නොවේ. එය පවත්වාගෙන ගොස් ඇත්තේ කෙළිබිමක්, ක්‍රීඩා භූමියක් හෝ දඩකෙළි (දඩයම්) බිමක් වශයෙනි. විවිධ නැකැත් කෙළි හා සැණකෙළි පවත්වා තිබී ඇත. මිස්සක පර්වතයේ සත් දිනක් පුරා දියකෙළි, මුව දඩකෙළි හා වෙනත් උත්සව පැවැති බව ඉතිහාසයේ සඳහන් වේ. දඩකෙළියේ යාම (දඩයම) පැරණි රජවරුන්ගේ පුරාණ ක්‍රියාවලියකි. මෙම සැණකෙළිය පැවැතුණේ පොසොන් මාසයේදීය. ඉන්දියාවේ බිහාර් ප්‍රාන්තයේ පොසොන් මස හඳුන්වනුයේ ජේට්ඨමූල මාසය යනුවෙනි. මෙහි අර්ථය වනුයේ වර්ෂාව අපේක්ෂාවෙන් දෙවියන්ට පුද පූජා පවත්වන නක්ෂත්‍ර මාසය යනුවෙනි. උත්සවය ආරම්භ කර ඇත්තේ 'දෙයමල' නම් නැකතේදීය. මේ නිසි දියකෙළිය 'නැකත් කෙළියක්' ලෙසින්ද හඳුන්වා දී ඇත. මෙම නැකත්



"සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහ් හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ."

කෙළිය කරුණු දෙකක් මත පැවැත්වූ බව ආචාර්ය චාල්ස් ගොඩකුඹුර මහතා ප්‍රකාශ කර සිටී. පළමු අරමුණ වන්නේ වැස්ස ලබාගැනීමට දෙවියන්ට පුද පූජා පැවැත්වීමයි. වැස්ස සම්බන්ධ වූ දෙවියන්ට කළ පූජාව නම් දියකෙළියයි. දෙවන අරමුණ වන්නේ ප්‍රජාවගේ බෝවීම වැඩිකිරීම සඳහා දෙවියන් සතුටු කිරීමය. ප්‍රජාවගේ බෝවීම ගැහැනු හා පිරිමි විසින් දෙවියන් උදෙසා කළ පූජාවකි. එය දෙවියන් සතුටු කිරීමකි. එකල ප්‍රජාව බෝකිරීම සමාජමය අත්‍යවශ්‍යම කරුණකි. මිහිඳු මහතෙරුන් දේවානම්පියතිස්ස රජු මුණ ගැසී බුදු දහම වැළඳ ගැනීමෙන් පසු මිස්සක පව්වේ දඩකෙළි, දියකෙළි, නැකත්කෙළි පැවැත්වීම සම්පූර්ණයෙන්ම තහනම් කරනු ලැබීය. ඉන්පසුව බුදුරජාණන් වහන්සේගේ දහමට වෙන්වුණ ස්ථානයක් බවට මිස්සක පව්ව පත්විය. මේ හේතුවෙන් මිස්සක පව්ව බෞද්ධ ශිෂ්ටාචාරයේ නිජභූමිය ලෙස බෞද්ධයන් සලකනු ලැබේ.

මිස්සක පර්වතය පසුව චේතිය පබ්බත හෙවත්, චේතියගිරි හෙවත් සෑගිරි යන්නෙන්ද හඳුන්වා ඇත. මෙයට හේතුවී ඇති පළමු මතය වන්නේ කඳුගැටය මත ස්ථූප කිහිපයක් පිහිටීම



නිසා චේතිය පබ්බත නොහොත් චේතියගිරිය නොහොත් සිංහල සෑගිරිය යන නමින් හැඳින්වී ඇත. දෙවන කරුණ වන්නේ මිහිඳු මාහිමියන්ගේ උපන් ගම වූ ඉන්දියාවේ උජ්ජේනි ප්‍රදේශයේ පිහිටි චේතියගිරි නිසා විය හැකිය. පසු කලෙකදී මිහිඳු මාහිමියන්ගේ ඇසුර නිසා මිහින්තලය වශයෙන් භාවිතයට පැමිණි බවටද මතයක් පවතී. තවත් මතයක් වන්නේ වෛදික මහේන්ද්‍ර දෙවියන් උදෙසා මිස්සක පර්වත මුදුනේ පැවැති දේව ඇදහිලි නිසාත්ය. නිසි කලට වැසි ලබාගැනීම සඳහා ඉන්දු දෙවියන් සඳහා පුද පූජා පවත්වා ඇත. මෙම පුද පූජා පැවැත්වීම සඳහා ජෙට්ඨමූල නැකත් කෙළිය මුල් වූවා විය හැකි බවටද තවත් මතයකි. වංශකථාවලින් හෙළිවන අන්දමට ලක්දිව පැවැති ජෙට්ඨමූල නැකත් කෙළිය පැවැත්වීමේ විශේෂත්වය වූයේ සශ්‍රීකත්වය හඟවන දියකෙළිය යන්නයි.

මිහින්තලයේ දක්නට ඇති ගල්ලෙන් පැවිදි ශාසනයට එක්වූ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා මුලින්ම ඉදිකරන ලද ගොඩනැගිලිය. ඒවා ඉදිකරන ලද්දේ දේවානම්පියතිස්ස රජුගේ නියමයෙන්ය. එලෙස ඇතිවූ ගල් ලෙන් ප්‍රමාණය හැට අට, (68 කි.) මෙම ගල් ලෙන්වල සඳහන් බ්‍රාහ්මී අක්ෂරවලින් ලියා ඇති වගන්තිවලින් ක්‍රිස්තු පූර්ව තුන්වන ශත වර්ෂයේ පැවැති බුදු දහම පිළිබඳව කරුණු අනාවරණය වීමක්ද සිදුවේ. සිංහල අක්ෂර මාලාවේ භාෂා ක්‍රම විකාශනයේ ආරම්භය පිළිබඳව කරුණු අනාවරණය කිරීමටද මෙම වගන්ති ඉවහල් වේ. මෙම සටහන්වලින් දේවානම්පියතිස්ස රජු, පවුලේ සාමාජිකයන්, ප්‍රාන්ත රජවරු හා රාජ්‍ය ප්‍රභූන් පිළිබඳවද කරුණු අනාවරණය කෙරේ.

මිහින්තලාවෙන් අපට ලැබුණු මහා බෞද්ධ සංස්කෘතිය මත ඇතිවූ යහපත් බලපෑම් බොහෝය. ඉන්දියාවේ ධර්මාශෝක රජතුමාගේ සිත් දිනාගැනීමට සමත් වූ එකම සිංහල රජතුමා දේවානම්පියතිස්සය. ඔවුන් දෙදෙනා අතර පැවැතියේ පුදුමාකාර මිත්‍ර සම්බන්ධයකි. එහෙත් අශෝක මහාධිරාජයා හෝ දේවානම්පියතිස්ස රජතුමා කිසිදිනෙක එකිනෙකාට මුණ ගැසී නොමැත. එහිසා මේ දෙදෙනාගේ මිත්‍රත්වය හැඳින්වූයේ 'අදෘෂ්ඨ මිත්‍රයෝ' යනුවෙනි. මෙම අදෘෂ්ඨ මිත්‍රත්වයෙන් සතුටට පත්වූ අශෝක මහාධිරාජයා ඉන්දියාවේ පැවැති සම්ප්‍රදායානුකූලව දෙවන වරට දේවානම්පියතිස්ස රජතුමා රාජාභිෂේක කරන ලදී. රාජාභිෂේකයේදී දේවානම්පිය, එනම් දෙවියන්ට මනාප වූ අර්ථයෙන් දේවානම්පිය නම ඇතුළත් කොට දේවානම්පියතිස්ස යනුවෙන් රජතුමා අභිෂේක කරන ලදී. ඔහු දේවානම්පියතිස්ස හෝ දෙවන පෑතිස වශයෙන්ද ව්‍යවහාරයට පත්විය. මෙම රාජාභිෂේකය හිසා දේවානම්පියතිස්ස රජතුමා ඉන්දියානු දේශපාලන බලය පිළිගත් අයකු ලෙසටද මතයක් ඇතිවිය.

ලෝක ඉතිහාසයේ පැරණිතම බුද්ධි පරීක්ෂණය පවත්වා ඇත්තේ මිහින්තලයේ අම්බස්තල ස්ථානයේදීය. එය ලෝක ඉතිහාසයේ අතිශයින්ම ඓතිහාසික වැදගත්කමකි. බුද්ධි පරීක්ෂණයක් පවත්වනුයේ කෙනකුගේ බුද්ධි මට්ටම පරීක්ෂා කිරීම සඳහාය. ලෝකයේ ප්‍රථම බුද්ධි පරීක්ෂණය පැවැත්වූයේ මිහින්තලේදී බව ලෝකයේ හෝ ශ්‍රී ලංකාවේ බොහෝ දෙනකු දන්නේ නැත. මිහින්තලේදී බුද්ධි පරීක්ෂණය පැවැත්වූයේ මිහිඳු මහරහතන් වහන්සේය. මෙම බුද්ධි පරීක්ෂණයට මිහිඳු මහරහතන් නැගූ ප්‍රශ්නවලට දුන් පිළිතුරුවලින් දේවානම්පියතිස්ස රජතුමා ඉතා බුද්ධිමත් බව මිහිඳු මහරහතන් වහන්සේට වැටහිණ. උන්වහන්සේත්, දේවානම්පියතිස්ස රජතුමාත් අතර ඇතිවූ මෙම සංවාදය නොහොත් බුද්ධි පරීක්ෂණය, බුද්ධි පරීක්ෂණවලට පෙනී සිටින අයට මහත් ආදර්ශයක් හා මග පෙන්වීමකි. මෙම බුද්ධි පරීක්ෂණය පැවැත්වූයේ ක්‍රිස්තු පූර්ව 250 කට පෙරදීය. ලෝක ඉතිහාසයේ පැවැති පැරණිතම බුද්ධි පරීක්ෂණය අප රටේ මිහින්තලයේදී පැවැත්වූ බව නොදැනීම පිළිබඳව අප ලැජ්ජාවට පත්විය යුතුය.

මිහිඳු මහරහතන් වහන්සේ පළමු ධර්ම දේශනාව පැවැත්වූයේ මිහින්තලයේදීය. එකී ධර්ම දේශනාවට පදනම් කරගෙන ඇත්තේ බුදුන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩ සිටිද්දී දේශනා කළ 'චූල හත්ථී පදෝපම' සූත්‍රයයි. මිහිඳු මහරහතන් වහන්සේ දේවානම්පියතිස්ස රජතුමාට චූල හත්ථී පදෝපම සූත්‍රය දේශනා කර ඇත්තේ රාජ්‍ය පාලනයේදී කටයුතු කළ යුත්තේ කෙසේදැයි අවබෝධ කරගනු පිණිසය. මෙම සූත්‍රයෙන් කියවෙන්නේ රාජ්‍ය පාලකයකුට ඕනෑම කාරණයකදී වැදගත් තීරණ ගන්නට සිදුවන හෙයින් එවැනි තීරණයක් ගැනීමට කලින් ප්‍රශ්නයට අදාළ සෑම පැත්තක් ගැනම සොයා බැලීම අත්‍යවශ්‍යය යන්න අවබෝධ කර දීමටය.

මිහින්තලය කසාවතින් බැබළී ගියේ මිහිඳු මහතෙරුන්ගේ පැමිණීමෙන් පසුවය. මහණදම් පිරීම පිණිස විශාල වශයෙන්

පුද්ගලයන් පැවිදි බිමට ඇතුල් විය. මෙසේ ඇතුළු වූ සමහරෙක් මිහින්තලයේම නැවතී බණ භාවනා කිරීමට පටන්ගෙන තිබුණි. සැදහැවතුන් විසින් තමන්ට හැකි ආකාරයෙන් ගල් ලෙන් ඉදිකර දානමාන ආදිය මෙසේ මහණදම් පිරූ භික්ෂූන්ට පිළිගන්වා ඇත. භික්ෂූන් වහන්සේලා වැඩ වාසය කළ ලෙන් 'තෙරස ලෙන' හා භික්ෂුණීන් වහන්සේලා වාසය කළ ලෙන් 'සමණිය ලෙන' යනුවෙන් හඳුන්වා දී ඇත. උපාසකවරුන් 'උපාසක' හා උපාසිකාවන් 'උපාසික වශයෙන්ද හඳුන්වා ඇත.

මිහින්තලයෙන් අපට උරුම වූ ගෘහ නිර්මාණ ශිල්පය සිංහල සංස්කෘතියකට එක්වූවකි. 'සර', 'ශාලා', 'ආවාස', 'පරිවේර' යන නම්වලින් හැඳින්වෙන ගොඩනැගිලි මිහින්තලය භූමියේ විසිරී ඇති චෛත්‍ය (දගැබ්), ගොඩනැගිලි කැටයම්, සත්ව රූප කැටයම් ඇතුළු බිතු සිතුවම්, කලා ශිල්ප මිහින්තලයෙන් ආරම්භ වී පසුව දේශීය ලක්ෂණද එක්වෙමින් අද දක්වාම වර්ධනය වී ඇත. ඉන්දියාවේ පැවැති දගැබ්වලට වෙනස් ආකාරයෙන් මිහින්තලයේ ඇති දගැබ් ඉදිවී ඇති බව දක්නට ඇත. අනුකරණයන්ට වඩා දේශීය ලක්ෂණ එක්වෙමින් සියලුම කලාවන් අද දක්වාම වර්ධනය විය.

මිහින්තලයට මිහිඳු මහරහතන් වහන්සේ වැඩම කළ දින සිදුවූ තවත් වැදගත් සිද්ධියක් වන්නේ 'නාග' හා 'සුපන්න' යන ගෝත්‍රික කොටස් මිහිඳු මහරහතන් වහන්සේගෙන් බණ ඇසීමය. මිහිඳු මහරහතන් වහන්සේ මිහින්තලාවට වැඩම කළ දිනයේ එහි නැවත 'සමචිත්ත' සූත්‍රය පදනම් කොටගෙන ධර්ම දේශනාවන් පවත්වා ඇත. මෙහිදී සිදුවූ විශේෂය වන්නේ බණ ඇසූ දෙවිවරු සියලු දෙනාම නිවන් දැකීමය. අනෙක් විශේෂත්වය වූයේ 'නාග' හා 'සුපන්න' යන ජන කොටස් දෙක පංච ශීලයේ පිහිටුවීමය. මෙම ජන කොටස් දෙකේම කිසිවකු නිවන් සුව අත්කර ගත් බවට කිසිදු සඳහනක් නොමැත. පූජාවලිය හා ථූපවංශ කතුවරුන්ට අනුව නාග හා සුපන්නයන් පංචශීලයේ පිහිටු වූ බව සඳහන් කෙරෙතත් ඔවුන් නිවන් දුටු බවට කිසිදු සඳහනක් නොමැත. නාග යනු සර්පයන් නොව එවකට විසූ ජන කොට්ඨාසයකි. මින් අදහස් වන්නේ මිහින්තලය අවට නාග නමින් ජන කොටසක් ජීවත් වූ බවයි. මිහින්තලයේ ඉදිකළ ගොඩනැගිලි බොහෝමයක නාග රූප දක්නට ඇත. මේ අතරින් ප්‍රධාන තැන ගන්නේ නාගයකුගේ රූපයක් සහිත නාග පොකුණයි. මිහින්තලයේ පුවරු ලිපියේ 'මනිලාල් දෙවිඳුන්' වශයෙන් හඳුනා ගත් ගොඩනැගිල්ල නාගයන්ගේ දේවාලයක් බවට විශ්වාස කෙරේ. මින් තවදුරටත් හැඟෙන්නේ මිහින්තලය නාගයන්ට විශේෂිත වූ ස්ථානයක් වූ බවය.

ථෙරවාද බුදු දහම ශ්‍රී ලංකාව තුළ බිහිවූයේ මිහින්තලාවෙනි. එය සිංහල බෞද්ධ ශිෂ්ටාචාරයේ තිහිරිගෙයයි. මිහින්තලය පසු කලෙකදී මහායාන බලපෑම්වලටද ලක්වූ බව ඉතිහාසඥයන් අදහස් කරයි. ථෙරවාදය යනු බුදුරජාණන් වහන්සේගේ ධර්මයට ඉතා කිට්ටු බුදු දහමයි. වෛදික නොහොත් හින්දු ආගමේ බලපෑම නිසා වෙනස් වූ බුදු දහම මහායාන බුදු දහමයි. මිහින්තලයෙන් ආරම්භ වූ ථෙරවාද බුදු දහම මහායාන බුදු දහමේ බලපෑමට යටත් වූයේ කෙසේද? මහසෙන් රජතුමා මහායාන ධර්මයට පූර්ණ අනුග්‍රහය දැක්වූ අයෙකි. මහාවිහාර භික්ෂූන් වහන්සේලා මහසෙන් රජතුමාට විරුද්ධව කටයුතු කිරීම නිසා ඔහු ථෙරවාද භික්ෂූන් සමග උරණව සිටියේය. මහසේන රජතුමාගේ උපදේශකයකු වශයෙන් කටයුතු කර ඇත්තේ ඉන්දියානු ජාතික මහායාන භික්ෂුවක් වන සංඝමිත්තා නමැති අයෙකි. රාජ්‍ය පාලනයේදී මහසෙන් රජතුමා කටයුතු කළේ මෙම මහායාන සංඝමිත්තා භික්ෂුවගේ උපදෙස් මතය. මහසෙන් රජතුමාගේ පාලන සමයේදී මහාවිහාරයට (ථෙරවාදී) අයත්ව තිබූ මිහින්තලයේ සංඝාරාමය මිහින්තලය මුල්කර ගත් අභයගිරි විහාරයට යටතට පත්කරන ලදී. මහසෙන් රජු අභයගිරි විහාරයට විශේෂ සැලකිල්ලක් දැක්වූ අයෙකි. මහායාන බලපෑම් වැඩි වශයෙන් දක්නට ඇත්තේ මිහින්තලයේ ඉදිකටු සෑයත්, ඒ අවට ගොඩනැගිලිවලත් දක්න ඇති ලක්ෂණයන්ගෙනි. මේ දගැබ්වලින් සොයාගත් ලිපි ලේඛනවලිනුත් හෙළිවී ඇත්තේ මහායාන බුදු දහමේ බලපෑමයි. මිහින්තලාවෙන් ථෙරවාද බුදු දහම මැකී යාමට මහායාන බුදු දහමේ බලපෑමත් හේතුවූයේදැයි තවදුරටත් මේ සම්බන්ධයෙන් සලකා බැලීම වැදගත් වන්නේය.

මිස්සක පව්ව නමින් හැඳින්වූ මිහින්තලය නිකම්ම කන්දක් හෝ සිද්ධස්ථානයක් හෝ නොවේ. එය සිංහල මහා බෞද්ධ ශිෂ්ටාචාරයට පදනම දැමූ පුණ්‍ය භූමියකි. පොසොන් පොහෝ දා දහස් ගණනක් බැතිමතුන් දහස් ගණනක් ගල් පඩි නගිමින් පිවිසෙන්න් කදු නැගීමේ විනෝද චාරිකාවකට නොවේ. විනෝද ගමනක්ද නොවේ. සිංහල වර්ගයා බුද්ධිමත්ව හා ප්‍රඥාවෙන් ඉහළ තලයකට ගෙන ආ පුණ්‍ය භූමියකටය. බුදු දහම නිසා අප ලබාගන්නේ සිංහල වර්ගයා බුදු දහමට දුන් මුහුණුවරයි. අනෙක බුදු දහම සිංහල වර්ගයාට දුන් මුහුණුවරයි. මේ නිසා



මිහිඳු මහතෙරුන් ශ්‍රී ලංකාවට වැඩම කළ දිනයේ සිට ශ්‍රී ලංකා ඉතිහාසය බුදු දහමේ ඉතිහාසය වශයෙන් සැලකිය හැකි බව මහාචාර්ය එස්. අර්ශරත්නම්ගේ ශ්‍රී ලංකාව (සිලෝන්) නමැති ග්‍රන්ථයේ සඳහන් කර ඇත. බුදුරජාණන් වහන්සේ වදළ දහම අනුව සකස් වූ ගුණධර්ම මාලාවකින් බෞද්ධයන්ගේ ජීවන රටාව හැඩ ගැසිණ.

සිංහල වර්ගයාට උරුම වූ වෙහෙර, විහාර, කලා ශිල්ප, සම්ප්‍රදායන් පමණක් නොව බෞද්ධ සාරධර්ම පද්ධතියක පදනම බිහිවූයේද මිහින්තලාවේදීය.

(මෙම ලිපිය සකස් කිරීමේදී මහාචාර්ය ජේ. බී. දිසානායක හා මහාචාර්ය අනුරාධ සෙනෙවිරත්නයන්ගේ ලිපි ලේඛන හා පොත් පත් ඇසුරු කළ බව කරුණාවෙන් සලකන්න.)

ලයනල් විජේසුන්දර
ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ ලේකම්, ශ්‍රී දළදා මාලිගාව

දෙවියන්ගේ උපකාර ලබාගන්නේ කොහොමද?

රාජගිරියේ ආරියඤ්ඤ ස්වාමීන් වහන්සේ තමන් මුහුණ දුන් අත්දැකීමක් විස්තර කරති

ධර්ම මාර්ගය තුළ ගමන් කරද්දී කාටත් දෙවියන්ගෙන් උපකාර ලැබෙනවා. දෙවියන්ගේ උපකාරය කියන්නේ මම අදත් බුදුන් වඳිද්දී දෙවියන්ට පින් දෙනවා. මම හැමදම කොයි කුටියක හිටියත් පැය කාලක් හරි බුද්ධ වන්දනාවක් කරනව, කවදවත් බුද්ධ වන්දනාවක් නොකරපු දවසක් මගේ ජීවිතයේ නැහැ. කොහි හිටියත් අවම වශයෙන් පැය කාලක් හරි බුද්ධ වන්දනාව කරනවා. දෙවියන්ට පින් දෙනවා. ඒක මම අතහැරලා නැහැ. මම කාටවත් ඒක අතහරින්න කියන්නෙත් නැහැ. අපි අපේ ආරක්ෂාව සඳහා තිබිය යුතු දේවල් අපි අපේ ආරක්ෂාව සඳහා තියාගන්න ඕනේ.



නමුත් ආරක්ෂාව උදෙසා නෙමෙයි මම එතනදී පින් දෙන්නේ. දෙවියන් අපේ මේ පින් දීම නිසා ඒ අය සතුටු වෙනවා කියන කාරණය තුළ ඉඳගෙන පින් දෙන්න ඕනේ. නමුත් අපි තාම යම් අවබෝධයකට පත්වෙලා නැත්නම් අපි පැමිණිලා නැති තැන ඉඳලා අපේ ආරක්ෂාවට තියෙන දේවල් අපි නැතිකර ගන්න ඕනේ නැහැ. ඒක තේරුම් ගන්න ඕනේ. දැන් එතකොට මේ වෙලාවේ මම දෙවියන්ට පින් දෙන්නේ මගේ ආරක්ෂාවක් උදෙසා නෙමෙයි. අනේ ඒ පිරිස මේ පිනෙන් සතුටු වෙනවා කියන කාරණය තුළ ඉඳගෙන පමණයි. නමුත් අපි අවබෝධයක් ලබලා නැත්නම් අපි කවදවත් අපේ ආරක්ෂාවට තියෙන දේ හැම දෙයක්ම අත්හරින්න අපි කැමති වෙන්න ඕනේ නැහැ. මොකද ඒවා අපේ ආරක්ෂාව උදෙසා තියෙන්න ඕනේ.

මම එක්තරා කුටියක ඉන්න කොට, දැන් අවුරුදු 4 කට ඉස්සෙල්ලා ඒ මේ හසලක පැත්තේ තිබුණු කුටියක්. නමුත් ඒකේ ස්වාමීන් වහන්සේ කෙනෙක් හිටියෙත් නැහැ. ඒ ගමත් බොහොම දුප්පත් ගමක්. ඒගොල්ලන්ට එච්චර පිණ්ඩපාතයක් ගැන වැඩසටහනක් තිබ්බේ නැහැ. නමුත් එළවළු දෙකක් තුනක් එක්ක බත් තමයි හැමදම ලැබුණේ. සීනි, පැණි රස ලැබුණේ නැහැ. නමුත් මගේ සාමාන්‍ය ස්වභාවයක් තිබුණා මට සීනි අඩුවෙනවා. මට සීනි අඩුවීමේ ස්වභාවයත් අර පැණි රසත් නැති නිසා, මොනවත් ගිලන් පසක් නැති නිසා මගේ සීනි ප්‍රමාණය අඩු වුණා. අඩුවෙලා දැන් කොහොම හරි එද හයහමාරට වගේ රෑක දැන් මට දඩි කලන්තයක් ආවා. දැන් කලන්තේ එනකොට මම දන්නවා ශරීරයේ සීනි අඩුවෙලා කියලා මම දන්නවනේ මම සීනි ගත්තේ නැහැ කියලා. මේ ටිකේම මට තේරෙනවා මේ සීනි ප්‍රමාණය අඩු වෙලා තමයි කියලා. එතකොට අර පරණ සීනි බෝතලය තිබ්බා. ඒකේ තිබුණා ඇලිච්ච සීනි වගයක්. දැන් මට හොඳටම අපහසුයි. ඉන්න බැහැ. මම අර ඇලිච්ච සීනි බෝතලයට වතුර ටිකක් දලා කලවම් කරලා ඒක පානය කළා. පානය කළා කියලා ඒක දැනුණේවත් නැහැ. දැන් මට අටට විතර වෙනකොට ඉන්න බැහැ. අමාරුයි. මට ඔයිට ඉස්සෙල්ලත් ඕක හැදිලා තියෙනවා. මට ඉන්න බැහැ. ඒ වෙලාවට මට කලන්තය වගේ එනවා. ඊට පස්සේ මම දෙවෙනි වතාවටත් සීනි බෝතලේ හෝදලා වැළඳුවා. ඒත් දැනුණේ නැහැ. චුට්ටක් පැණි රහ තිබ්බා. මට ඊට පස්සේ කරන්න දෙයක් නැහැ. ස්වාමීන් වහන්ස, මට එස්. ආර්. දත් බෙහෙත් ටියුබ් එක තිබුණා. මේක පැණි රසයි කියන කාරණය තුළ මේක චුට්ටක් කෑවා. බඩ දැවිල්ල ගන්න ගත්තා. ඊට පස්සේ රෑ 10 ට විතර මට දැන් හොඳටම තේරෙනවා මම හෙට උදේ වෙනකොට මැරිලා ඉදියි කියලා.

මම අවංකවම දෙරේ (දෙර තියෙන කුටියක්) තියෙන ලොක් එක පැන්නුවා. ඒ කියන්නේ උදේට මම මැරිලා හිටියොත් දයක වැසියෝ හොයන්න ආවොත් දෙර කඩයි කියලා හිතලා. මම අවංකවම හිතුවේ උදේට මැරෙයි කියලා. මොකද ඒ සා අසාධ්‍ය තත්ත්වයෙන් මම හිටියේ. නමුත් ඒ වෙලාවේ භික්ෂුවකට කරන්න දෙයක් නැහැ. භික්ෂුවකට කරන්න තියෙන්නේ එකම දෙයයි. මම ඇදේ හාන්සි වෙලා මේ වේදනාව මගේ නෙවෙයි, මේ රූපයත් මගේ නෙවෙයි කියලා මම එකපාරට අතහැරියා. ඒ කියන්නේ නාම ධර්මයත් මගේ නෙවෙයි කියලා මම අතහැරියා. අතහැරිච්ච තැන මගේ තිබිච්ච මේ වේදනාවන් සියලු දේ මට නොදැනී ගියා. අතහැරීම තුළයි නොදැනී ගියේ. එහෙම්මම මට නින්ද ගියා.

"ඇත්ත කිව යුතුය. අනුන්ට නොකිපිය යුතුය. අනිකකු යමක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතුය. මේ තුන් කරුණෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකිය."



ඒක සමාධිමත් නින්දක්. ඒ සමාධිමත් නින්දේදී එකපාරටම මම සමාධියෙන් අත මෙහෙම දික් කෙරුවා. මම ඕනෑකමින් අත දික් කළා නෙමෙයි. මෙහෙම දික් කරනකොට මගේ අතට රත්තරන් පාට සීනි අහුරක් ලැබුණා. රත්තරන් පාටයි ඒ සීනි. රත්තරන්වලටත් වඩා දිලිසෙනවා. මේ රත්තරන් පාට සීනි අරගෙන මම මෙහෙම තොල ගෑවා. මේ තොල ගාලා ඒක ඉවර වුණා. එච්චරයි. ඊට පස්ස ඒක ඉවරයි.

නමුත් උදේ පාන්දර 4 ට ඇහැරුණා. මට අර තිබුණ කිසිම අමාරුවක් නැහැ. පාන්දර 6 ට විතර කිලෝ මීටර් තුනක් ගමට පිණ්ඩපාතය ගිහිල්ලා පිණ්ඩපාතයත් කරගෙන කුටියට ආවා. නමුත් කිසිම අමාරුවක් තිබ්බේ නැහැ. එතකොට ඇ මට මොකක්ද ලැබුණේ. දිව්‍ය ඕජාවයි ලැබුණේ. දෙවියන්ගේ ඕජාව.

ඒකයි මාර්ගය තුළ ලබන කෙනාට දෙවියෝ කවදාවත් අසරණ වෙන්න දෙන්නේ නැහැ. දෙවියන්ගේ ඕජාවයි ඒ ලැබුණේ. සීනි අහුරක් තමයි මට එතනදී ලැබුණේ. නමුත් මම එදා ගමට ගිහිල්ලා කවුරුත් සීනි පූජා කළෙත් නැහැ. මම සීනි කටෙන් ඉල්ලුවෙත් නැහැ. මගේ ඒ තරම් සීලයක් ඒ කාලෙත් තිබ්බා. ඒ සාමණේර කාලෙත් සීනි කටෙන් ඉල්ලුවේ නැහැ. කවුරුත් දුන්නෙත් නැහැ. මම ඊට පස්සේ එදත් සීනි නැතිව එළවළුයි, බතුයි විතරක් අරගෙන ආවා.

නමුත් මට දවල් 12.30 වෙනකොට ආයෙමත් අමාරුව ආවා. දැන් 12.30 යි. මම හසලක ඉස්පිරිතාලෙට ගියහම මට ග්ලූකෝස් 4 ක් දුන්නා. මේක ගිහිල්ලා දෙකක් බොන්න කියලා. නමුත් මම ගමේ අයට කිව්වේ නැහැ. ගමේ අය ඇහුවෙත් නැහැ. මම තුන්වෙනි දවසේ ගමට පිණ්ඩපාතේ එනකොට ඒ ගමේ හිටිය කැපකරු ඇහුවා ස්වාමීන් වහන්ස, ඔබවහන්සේ මීට දවස් තුනකට ඉස්සෙල්ලා හසලක ඉස්පිරිතාලේ ඉඳලා තියෙනවා. ඔබවහන්සේ ඇයි ඉස්පිරිතාලෙට ගියේ කියලා. මම කිව්වා මහත්තයෝ, (එතකොට දැන් මගෙන් ඇහුවනේ ඒ නිසා මම කිව්වා) මට සීනි ප්‍රශ්නයක් මතුවුණා. ඇඟේ සීනි අඩුයි. ඒ නිසයි මම ඉස්පිරිතාලෙට ගියේ කියලා. ඒත් සීනි ඉල්ලුවේ නැහැ. එයා සීනි දුන්නෙත් නැහැ.

මම එදත් කුටියට ගිහිල්ලා පහුවදා පිණ්ඩපාතේ යන්න ඉස්සෙල්ලාම යන්නේ කැපකරුගේ ගෙදරට. කැපකරු භාජන දෙකකුත් තියාගෙන පාර අයිනේ ඉන්නවා නෝනත් එක්ක. දැන් ඇත්තටම මොනවද කැපකරු පූජා කළේ කියලා ඔබ දන්නවද? මොනවද පූජා කරන්න ඇත්තේ? පූජා කළේ කරවිලයි, බතුයි. ඇයි ඒගොල්ලන්ට සීනි ගැන දැනීමක් නැහැ. ඒගොල්ලන් දියවැඩියාව ගැන දන්නේ නැහැ. ඒ මනුෂ්‍යයා ඒ මනුෂ්‍යයාගේ අසරණකමට කරවිලයි, බතුයි පූජා කළේ. මම ඒක පිළිඅරගෙන දැන් බැලුවා. දැන්නම් හරියන්නේ නැහැ. මම අල්ලපු ගෙදරට ගියා. පිණ්ඩපාතේ බෙදනකොට මම අත වැහුවා. එතකොට ඇහුවා ඇයි කියලා. මම කිව්වා පුතේ මට දනේ අවශ්‍ය නැහැ, සීනි ටිකක් අවශ්‍යයි කියලා. දවස් හතරක් යනකම් සීනි ටිකක් ගත්තේ නැහැ. ඒක තමයි සීලය කියන්නේ. බලන්න කොයිතරම් අත්හැරීමක් කරලද අපි ඉස්සරහට ආවේ කියලා. ඒ අත්හැරීම තුළ ඇතිවෙන්නා වූ සතිය ගැන අපි අමුතුවෙන් කියන්න අවශ්‍ය වෙන්නේ නැහැ. විතර්ක ඔක්කොම අයින් කරලා දනවා.

අපි වේදනාවක් දැනෙන වෙලාවට නාම රූප දෙස අත හැරලා ඇස් දෙක පියා ගන්නවා කියන්නේ දිව්‍ය ලෝකය කම්පා වෙනවා. ඒවා දෙවියන්ට දැනෙනවා. ඔය හිමාලයේ සමහර ඍෂිවරු ඉන්නවා. එයාලා ආහාරයක් ගන්නේ නැහැ. ඒ දිව්‍ය ඕජාවෙන් ඒගොල්ලෝ ජීවත් වෙන්නේ. අර රත්තරන් සීනි අහුර දිව්‍ය ඕජාව. එච්චර පයින් ගිහිල්ලා නැවත කුටියටත් ආවා. ඇඟේ කිසිම අමාරුවක් නැහැ. ඒ කියන්නේ ඒක තමයි බුදුරජාණන් වහන්සේගේ මාර්ගය. ඒ තරම් දෙවියන්, බ්‍රහ්මයන් බලාගෙන ඉන්නවා අපි ගමන් කරන ඒ මාර්ගය දිහා.

බුදුරජාණන් වහන්සේ කියනවානේ භික්ෂුවක් පැවිදි වෙන්න යනකොට මාරයා එක්ක සටන් කරන්න යනවා කියලා. පැවිදි වුණාට පස්සේ මාරයත් එක්ක සටන් කරනවා කියලා දෙවියන් හිතනවා කියලා. ධර්මය අවබෝධ කරගත්තහම මාරයා පරාජය කළාය කියා දෙවියන් හිතනවා කිව්වා. දෙවියෝ හැමවෙලාවෙම අපි ඉස්සරහා ඉන්නවා. ඒ විශ්වාසය අපිට තියෙන්න ඕනේ.

ඩී. එස්. ඩබ්. ගුණවර්ධන

"යකඩයෙන් නැගුණ මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි."

මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාලිගය
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk

පොසොන් පැතුම

මහින්දගමනයත් සමග මෙරට ඇතිවූ බෞද්ධ සංස්කෘතිය තවමත් අඛණ්ඩව නොනැසී පැවතීම ගැන සිංහල බෞද්ධයන් වූ අපි සොම්නසට පත්විය යුතුමය. අනුබුදු හිමියන් එද මිස්සක පව්වේ සිට පෑ පෙළහර හා දෙසා වදළ බුදු දහමින් මෙරට සංස්කෘතියේ අඩිතාලම වැටුණ බව ඉතාමත් පැහැදිලිය.

පොසොන් පුන් පොහෝ දිනය අනුබුදු මිහිඳු හිමියන්ට පමණක් කෙරෙන පුද සත්කාරයක් නොවන බව අප නුවණින් වටහා ගත යුතු වෙමු. රටේ සිව්දිගින් අනුරාධපුර පුදබිමට හා මිහින්තලාවට ඇදෙන ජන ගංගාව අතරින් සමහර දෙනෙක් එය විනෝදාස්වාදයකට හරවාගෙන තිබීම නම් කනගාටුදායකය. මෙම උතුම් දිනය තම සිත, කය, වචනය නමැති තුන්දෙර සමනය කරගැනීමට යොදා ගන්නේ නම් එහි අගය කියා නිම කළ නොහැකි තරමිය. තවමත් අපේ රටේ බොහෝ දෙනා ප්‍රතිපත්ති පූජාව නිවැරදිව වටහාගෙන තිබෙන බවක් අපට නොපෙනේ.

වෙසක් පුන් පොහෝද මෙන්ම පොසොන් පුන් පොහෝ දිනයද සිල් සමාදන් වීම, භාවනා කිරීම, බුදු බණ ශ්‍රවණය කිරීම, දන්දීම වැනි ප්‍රතිපත්ති පූජා සඳහා යොදා ගතහොත් අප සැබැවින්ම අනුබුදු හිමියන්ට ගෞරව පුද සත්කාර කළාහු වෙති. එහෙත් බොහෝ දෙනා දෙමික යොමුවන්නේ දන්සල් දීම, තොරණ ඉදිකිරීම, බැති ගී ගායනා කිරීම වැනි ආමිස පූජාවලටය. අපි එහි වරදක් නොදකිමු. එහෙත් බුදු බැතිය දනවන ඒ සියලු ක්‍රියාවන් සිදුවිය යුත්තේ අනිකුත් ශ්‍රද්ධාවන්ත අයට කරදරයක් නොවන අන්දමටය. විශේෂයෙන් මෙදින සිල් සමාදන් වී සිටින උවැසි උවැසියන් ගැන මෙහිදී තම විශේෂ අවධානය යොමු කිරීම වැදගත්ය.

ශ්‍රී ලාංකීය බෞද්ධ ජනතාව තුළ බුදු බැතිය හා ආගමික ප්‍රබෝධය උද්දීපය කරවන පොසොන් දිනයේ සැබෑ අරුත තේරුම් ගෙන එය නිවැරදිව හා හරිහැටි සමරන්නට ඔබ සැම සැදී පැහැදෙන්නේ නම් මේ වටිනා පොහෝ දිනයේ උතුම් බව මුළු ලෝකයම දැක බලා ගන්නවාට සැක නැත. ■



අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ සියලු බෞද්ධයන් සලකන්නේ දෙවන බුදුන් ලෙසටය. උන්වහන්සේ ලක්දිව මිස්සක පව්වට වැඩම නොකරන්නට ලංකාවේ අද දක්නට ඇති බෞද්ධ ප්‍රබෝධය මෙන්ම හෙළ සංස්කෘතිය හා සභ්‍යත්වයද උදා නොවන්නට ඉඩ තිබිණ. එමනිසා අනුබුදු මහින්දගමනය බෞද්ධයන් වූ අප සැමට අතිමහත් පූජනීය හා අමරණීය සිදුවීමකි.

එද චිත්ත ප්‍රීතිය උදෙසා දඩ කෙළියේ ගොස් සිටි දේවානම්පියතිස්ස මහරජුට මිහිඳු හිමියන්ගේ ශාන්ත රූපය දැකගන්නට ලැබුණේ අද වන් උතුම් පොසොන් පොහෝ දිනකදීය. මෙබඳු උතුම් දවසක රජතුමා දඩ කෙළියේ ගියේ ඇයිද යන ප්‍රශ්නය

කෙනකුගේ හිත
අනුමාන වශයෙ
වන්නේ එද පෙ
දිනයක් ලෙසට ඒ
සලකන්නට නැති
අවබෝධයක් දෙ
ඔහු එදින සතුන්
නොයනු ඇත. ඒ
අශෝක මහරජු
යම්කිසි හැඟීමක්
මිහින්තලා ගල මු
දුනු ඊතල බිම දැ
බෞද්ධ මූලාශ්‍රය
රජතුමාගේ ධ

''අසවලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙනෙ

අසිරිමත් මහින්දගමනය





දේවානම්පියතිස්ස රජු බුද්ධ ධර්මය කෙරෙහි අතිශයින් පැහැදුණ අතර බුදු දහම ශ්‍රී ලංකාද්වීපය තුළ පිහිටුවන ලෙසට අනුබුදු හිමිගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටියහ. දන් වැළඳීමෙන් අනතුරුව මිහිඳු හිමිපාණෝ රජ මැදුරේ රැස්ව සිටි පිරිසට ධර්ම දේශනා කළහ. මේ සඳහා උන්වහන්සේ තෝරා ගත්තේ 'විමානවත්ථුවේ' හා 'ප්‍රේත වස්තුවේ' එන කතාය.

අනුබුදු මිහිඳු හිමියන් දින 21 ක් අනුරාධපුර මහමෙව්නාවේ වැඩ සිටි බව වංශකථාවල සඳහන්ය. අවිද්‍යාවෙන් ගිලී සිටි ජනතාවට බුදු දහම පිළිබඳව නිසි අවබෝධයක් ලබාදෙන්නට උන්වහන්සේ ධර්ම දේශනා රැසක්ම ගමින් ගමට වැඩම කරමින් දේශනා කළහ. මෙම දින 26 පසුව උන්වහන්සේ වස් විසීම සඳහා මිහින්තලාවට වැඩම කළ අතර ඒ සඳහා රජතුමා අවශ්‍ය පහසුකම් සලසා දුන් බව වංශකථාවල සඳහන් වේ. ඒ අනුව මිහින්තලේ භාණ්ඩක චෛත්‍යය අවට ගල් ලෙන් පවිත්‍ර සංඝයාට ආවාස සකසා දුන් බවද එහි වැඩිදුරටත් දක්වේ.

ලංකාවේ මෙහෙණි සසුන ඇතිවූයේ මහින්දගමනයෙන් පසුවය. අනුබුදු මිහිඳු හිමියන් අප රටට ගෙනාවේ නිර්මල බුදු දහම පමණක් නොවේ. අක්ෂර විද්‍යාව, කලා ශිල්ප, ගෘහ නිර්මාණ කලාව, භාෂා සාහිත්‍යය වැනි දේවල්ද අපට ලැබුණේ මහින්ද හිමියන්ගේ ශ්‍රී ලංකාව පිළිබඳ මනසේ ප්‍රතිඵලයක් වශයෙනි.

මහ ඝන කැලෑවල පිහිටි යෝධ ගල් පර්වතවලට බුදුන් වහන්සේගේ මෙත් කරුණාගුණ කැටි කරමින් අපරිමිත භක්තියෙන් හදවූ බුද්ධ ප්‍රතිමා වහන්සේලා හෙළ කලාකරුවන් අතින් නිමවූ ශ්‍රේෂ්ඨ නිර්මාණයන්ය. 'සමාධි' සහ 'අවුකන' බුදු පිළිම වහන්සේලා දෙනමට ඊට කදිම නිදසුනකි. එම ප්‍රතිමා අනුබුදු හිමියන් ශ්‍රී ලංකාවට ගෙන දුන් මහඟු දායාදයක් ලෙසට හැඳින්විය හැකිය. අද පොසොන් පොහෝ දින අනුරාධපුරයට හා මිහින්තලයට යන ඔබට මෙබඳු වටිනා බුදු පිළිම වහන්සේලා හා අසිරිමත් කලා නිර්මාණ දක බුදු බැතිය වඩවා ගත හැකිය. 'ඉසුරුමුණි පෙම් යුවළ' හා 'සඳකඩ පහණ' ඒ අතරින් සුවිශේෂිතය.

අහස් කුස සිඹින රුවන්වැලි මහා සෑය, ජේතවනාරාමය, මිරිසවැටිය, අභයගිරිය, සෝමාවතිය වැනි මහා චෛත්‍ය රාජයාණන් ඉදි කිරීමට එකල රජ කළ රජවරු පියවර ගත්තේ මිහිඳු හිමියන්ගෙන් ලද සංස්කෘතික, ආගමික හා කලාත්මක ආභාෂයන් සමඟය. මිහිඳු සංස්කෘතිය අප සියලු බෞද්ධ ජනී ජනයාගේ හෘදස්පන්දනයයි.

නිව්ටන් ගුණසේකර

අටියෙන් මිහිඳු හිමියන් ප්‍රකට 'අඹ ප්‍රශ්නය' හා 'ඥති ප්‍රශ්නය' අසන්නට ඇති බව අපට අනුමාන කළ හැකිය. මෙය එක්තරා විදියකට ප්‍රථම මනෝමය බුද්ධි පරීක්ෂණයක් ලෙසටද අර්ථ ගැන්විය හැකිය. මෙම ප්‍රශ්නවලට රජතුමා ඉතා සාර්ථක ලෙස පිළිතුරු දීම නිසා මිහිඳු හිමියන් එම අවස්ථාවේ රජු ඇතුළු පිරිසට 'චුල්ලහත්ථීපදෝපම' සූත්‍රය දේශනා කරන්නට තීරණය කළහ. මෙකී සූත්‍රයෙන් විස්තර කරනු ලබන්නේ යම් අයෙක් බුදු දහම පිළිගෙන භික්ෂුවක් වන ආකාරයයි.

එසේම භික්ෂුවකගේ අපිස් ජීවිත පැවැත්මට අවශ්‍ය මූලික කරුණුද උතුම් වත්පිළිවෙත් ගැනද මෙම සූත්‍රයෙන් කරුණු දක්වේ. බුද්ධ, ධම්ම, සංඝායන තුන්රුවන පිළිබඳව මනා අවබෝධයක්ද ගෙන දෙන මෙම වටිනා සූත්‍රය ඒ අනුබුදු මිහිඳු හිමියන් තම ප්‍රථම ධර්ම දේශනාව ලෙසට එදා තෝරාගන්නට ඇතැයි අපට උපකල්පනය කළ හැකිය. බුදු මගේ ප්‍රධානතම ඉලක්කය වන රහත් ඵලය පිළිබඳවද ඉතා වටිනා කරුණුවලින් චුල්ලහත්ථීපදෝපම සූත්‍රය සමන්විත වේ. චතුරාර්ය සත්‍යය වැනි බුදු දහමේ ඉගැන්වෙන වැදගත් ආර්ය මාර්ග සියල්ලම පාහේ මීට ඇතුළත් වේ. මෙහිදී මිහිඳු හිමියන්ගේ මූලික අරමුණ වූයේ බුදු දහම හා භික්ෂු ජීවිතය පිළිබඳව රජතුමා තුළ මනා අවබෝධයක් ඇතිකරලීම බව ඉතා පැහැදිලිය. මෙම දේශනාවට මහත් භක්තියෙන් සවන් දුන් දේවානම්පියතිස්ස රජතුමා බුදු දහම වැළඳ ගන්නට කැමැත්ත පළ කළේ අනුබුදු මිහිඳු හිමියන් ඉදිරියේ දෙහොත් මුදුන් දී වැඳ වැටීමෙනි.

ඉන්පසු හෙතෙම මිහිඳු හිමි ඇතුළු මෙම පිරිසට අනුරාධපුර මහමෙව්නා උයනට වඩින ලෙසට ආරාධනා කළ අතර, එය පිළිගත් මිහිඳු හිමිපාණෝ ස්වකීය පිරිසක් සමග අනුරාධපුරයට වැඩම කළහ. අපේ බෞද්ධ ජනතාව දහස් ගණනින් පොසොන් පොහෝ දින මිහින්තලාවට හා අනුරාධපුර අටමස්ථානය වන්දනාමාන කරන්නට විශාල වශයෙන් යන්නේ මිහිඳු හිමියන්ට කරන ගෞරවයක් වශයෙනි.



ඔබට ඉර්සියාකාරයන් කීදෙනෙක් ඉන්නවාද?

'අන්‍යයන්ට ඇඳුම් පැළඳුම්, ගෙවල්, වතු, කුඹුරු තානතුරු ආදිය ලැබීම නොඉවසනා වූද, අන්‍යයන් පූජා සත්කාර, ගරු බුහුමන්, කීර්ති, ප්‍රශංසා ආදිය නොඉවසන්නා වූද ස්වභාවය ඉස්සා නම් වෙයි. ඊර්ෂ්‍යා නම්‍ද වේ. ඊර්ෂ්‍යා ඇතියහුගේ කැමැත්ත අනුන්ගේ සම්පත්තිය නැති කිරීමටයි. එසේ කළ නොහැකි කල්හි එහි දෙසක් බලා සැනසීමයි.'

දේරුකානේ චන්දවිමල හිමි - කෙළෙස් එක්දහස් පන්සියය, පිට 68.

'මට නම් ඊර්ෂ්‍යාකාරයෙක් නැතුවම බැහැ. ඔහු මට කරන්නේ හරිම යහපතක්. ඔහු මට කරන ඊර්ෂ්‍යා දිහා බලන මං මගේ අඩුපාඩු හඳුනන්න උත්සාහ ගන්නවා. වීර්යය කරනවා. අද මම මේ දක්වා ඉදිරියට ඇවිත් තියෙන්නේ මං වටේ සිටි ඊර්ෂ්‍යාකාරයන් නිසා. මං ඒ අයට ණයගැතියි.'

මේ ඊර්ෂ්‍යාකාරයන් පිළිබඳ සමාජයේ ඉහළ ස්ථරයකට පැමිණි කෙනකු දැක්වූ අදහසක්. ඉහත දැක්වූ ප්‍රකාශ දෙස අවධානයෙන් බලන විට ඔබට හැඟෙන්නේ මොන වගේ අදහසක්ද්‍යයි සිතා බලන්න. බුදු දහම නම් දක්වන්නේ ඉර්සියාව අකුසල ධර්මයක් හැටියට. එය පුද්ගලයා සතුව නොපැවතිය යුතු දෙයක් හැටියට. ඉර්සියාව මානසිකයි. එය වඩාත් වර්ධනය වීමෙන් මිනිසා කයද, වචනයද යොදවා අකුසල සිද්ධ කරගනු ලබනවා. විවිධ සමාජ සමාන සමාජ ස්ථරයන් තුළ මෙම ලක්ෂණ දකින්නට පුළුවන්. ප්‍රාණ ඝාතකයාට මස් ලැබේ. සොරාට ධනය ලැබේ. මිථ්‍යාචාරයේ යෙදෙන්නාටද සුවයක් ලැබේ. තාවකාලික වශයෙන් හෝ ඔවුන් එබඳු දෙයක් ලැබුවද ඊර්ෂ්‍යා කරන්නාට ලැබෙන දෙයක් නැත. ඔහු ලැබන්නේ මානසික අවුල් සහගත බව සහ මානසික රෝගී තත්ත්වයකට මුහුණ දීම පමණි.

ඔබ වැඩිපුරම ප්‍රිය කරන්නේ අන්‍යයන්ට ඊර්ෂ්‍යා කරන්නද? මෛත්‍රී කරන්නද? දැයි කෙනකු ඇසුවහොත් පිළිතුර හැටියට දෙන්නේ කුමක්ද? අනුන්ට මෛත්‍රී කරන්න මං කැමැතියි යනුවෙන් ඔබ ඇතැම් විට පිළිතුරු දෙයි. එසේ ඔබ කීවත් සැබෑවමත් එයද යන ප්‍රශ්නය තමා සමගම විසඳා ගත යුතුයි. සමාජයේ වැඩිපුරම දකින්නට ලැබෙන්නේ ඉර්සියාවෙන් පරිපීඩිත මිනිසුන්ද නැතිනම් අන්‍යයන් කෙරෙහි මෛත්‍රිය පළ කරන අයද යනුවෙන් සොයා විමසා බැලිය යුතුයි. එය තමන්ගෙන්ම ආරම්භ කරනවා නම් තමයි හොඳ. මන්ද බොහෝ අය අනුන් ගැන පරීක්ෂණ පවත්වන්න ඔවුන්ගේ අඩුපාඩුම දකින්න බහුල වශයෙන් ප්‍රියතාවක් දක්වන්නේ තමා පිළිබඳව නිවැරදිතාව එළි කරන්න අකමැති නිසා. ඉර්සියාව බහුල වශයෙන් ඇති වන්නේ අදක්ෂයන්ටය කියන මතයක් සමාජයේ ඇතැමුන් අතර ඇති බව පෙනෙනවා. එහි සාවද්‍ය නිරවද්‍යතාව පිළිබඳවත් සිතා බලන්නට අවශ්‍යයි. ඔබට ඔබේ ජීවිතයේ යම් දවසක මෙබඳු සංකල්පනාවක් පහළ වී ඇති. ඒ අවස්ථාව පැන නැගුණේ කුමන හේතුවක් නිසාද කියා සොයා බලා තිබෙනවාද? සෑම මානසික ප්‍රපංචයකටම හේතුවක් පවතින බව බුදු දහමින්

අවධාරණය කරන නිසා යම් අවස්ථාවක ඊර්ෂ්‍යාවක් හටගත්තා නම් එයට හේතුවක් නොතිබෙන්න හේතුවක් නැහැ.

ඊර්ෂ්‍යාව හටගන්නේ සමාන මට්ටමක සිටින අයට. එයට හේතුව තෘෂ්ණාධික බව සහ පළවෙනියා වීමේ තරගයයි. තරගකාරී මානසික බවින් තොර කිසි කෙනකුට එබඳු තත්ත්වයක් ඇති වන්නට විදිහක් නෑ.

ඊර්ෂ්‍යාව භවයෙන් භවයට අරගෙන යන එකක් හැටියට දහමෙහි උගන්වනවා. බෞද්ධ සාහිත්‍යයේ එන බොහෝ කතාවලින්ද පුනරුත්පත්ති පර්යේෂණවලින්ද එය හෙළිවී තිබෙන කාරණාවක්. නිතර ඊර්ෂ්‍යා කරන කෙනා දුප්පත් වී උපත ලබන බව දහමෙහි උගන්වා තිබෙනවා. අපිරිසිදු බව ඇතිවන්නේත්, පරිවාර සම්පත්තිය අඩුවන්නේත් ඊර්ෂ්‍යාව නිසා ලබන විපාක හැටියට. අනුන්ට ලැබෙන ලාභය නැතිකර දමන්නේ ඊර්ෂ්‍යාව නිසා. විවිධ ක්‍රමවලින් අන්‍යයන්ගේ චරිත ඝාතනය කරන්නට පුද්ගලයා නැඹුරු වන්නේත් මේ කරුණ නිසා. අන්‍ය හැම රෝග ව්‍යාධියක්ම තමන්ට ඇති බව දැනගන්නට හැකි වුණත් ඊර්ෂ්‍යාව සහිත පුද්ගලයාට එය දැනෙන්නේ නැහැ. ඔහුට නිතරම පෙනෙන්නේ අනුන්ගේ අඩු ලුහුඬුතා. ඒ වැරදි අඩුපාඩුවලට එරෙහිව කටයුතු කරන්න යනවා. නමුත් තමා තුළ පවතින අකුසලය තමන්ට අවබෝධ වන්නේ නැහැ. අන්‍යයන්ගෙන් තමන්ට විපත් සිදුවන බව තමයි ඔහුට දැනෙන්නේ. ඒ ඊර්ෂ්‍යාවේ හැටි.

ඔබට වුණත් ඕනෑතරම් මෙබඳු පුද්ගලයන් හමුවී ඇති. මට විරුද්ධකාරයෝ වැඩියි. මං කිසි වරදක් කර නැතුවත් මට එරෙහිව ඔවුන් කටයුතු කරනවා, ඔය ආදී වශයෙන් කටයුතු කරන බොහෝ අය ඊර්ෂ්‍යා පරවශ බවින් පිරිපුන් අය බව හොඳින් ඔවුන් අධ්‍යයනය කළහොත් වැටහේවි. එබඳු පුද්ගලයන් කවදාවත් තමන්ගේ අඩුවක් පිළිගන්නේවත්, හදුගන්නේවත් නැහැ. එයට හේතුව තමන් නිවැරදිය යන මතයේ ගැලී ඉන්න නිසා.

කොපමණ සිල් ගත්තත් දහමෙහි උතුම් හරය දකින්නට ඔවුනට බැහැ. කොතරම් සමාජ යහපත කළත් ඉන් තෘප්තියක් ලබන්නට බැහැ.

සෑම පුද්ගලයකුටම ඊර්ෂ්‍යාව තිබෙන්නට පුළුවන්. ඒත් එය සමාජ ව්‍යාධියක් බවට පත්කර ගන්නා පිරිස සිටින්නේ අල්ප වශයෙන්. මානසික සංකල්පයක් වූ එය සමාජ ක්‍රියාවක් බවට පත්කර ගනු ලබන පිරිසයි. ඒ එබඳු පුද්ගලයන් තමාගේ ජීවිතයත් සමාජයේ තව බොහෝ දෙනාගේ ජීවිතත් අවුල් සහ අපිළිවෙළ කරනවා.

බුදු දහම ප්‍රධානත්වය ලබාදෙන්නේ මනසට. මනස තමයි සියල්ලටම පෙරටුව ගමන් කරන්නේ. එනිසාම පුද්ගලයා සිත සකස් කරගත යුතුය යන පණිවුඩය මිනිසාට ලබාදෙනවා. එයට හේතුව සමාජයෙන් සිදුවිය හැකි අන්‍ය සියලු විපත්තිවලට වැඩිය ඊර්ෂ්‍යා සහගත මනස විසින් තමාට වඩාත් බරපතළ විපතක් ඇතිකරනු ලබනවා. නමුත් එබඳු පුද්ගලයා කිසිවිටෙකත් එය සමාජයෙන් සිදුවූ වරදක් හැටියට හිතනවාද?

තමන්ට ඉරිසියා කරන අය සිටිනවා යැයි සිතුවහොත් ඒ ප්‍රමාණය එන්න එන්නම වැඩි වෙනවා. ඒ කෙනා දෙසම බලන්නේ වපර ඇසින්. එහෙම අය නැතිය කියා හිතාගෙන ඔබ කටයුතු කළහොත් එබඳු අය අඩු වෙනවා. එය සමාජයේ ඔබට වුණත් අත්හද බලන්න පුළුවන්. දහමෙහි උගන්වන කරුණු ජීවිතයේ අත්හද බලා පිළිගන්න අය අද සමාජයේ වැඩියි. ඔබ තුළ පවතින ඊර්ෂ්‍යාව ඔබගේ යහපත සඳහා හේතුවී තිබේද, නැතිනම් අනිකක් සිදුවිණිදැයි සොයා විමසා බලන්නත් අවශ්‍යයි.

මහාචාර්ය පාතේගම ඥානිස්සර හිමි



මිස්සක පව්වේ යටගියාව

මිහින්තලය පිහිටා ඇත්තේ අනුරාධපුර නගරයේ සිට කිලෝමීටර් 13 ක් උතුරු දෙසින් අනුරාධපුර ත්‍රිකුණාමලය පාරට නුදුරුව පිහිටි "මිස්සක පව්ව" නම් අඩි 1000 ක් පමණ උස කඳුගැට කිහිපයකින් යුක්ත කඳුවැටියකින් ආවරණය වෙමිනි. මෙයට චේතිගිරිය, සෑගිරිය යන නම්ද ව්‍යවහාර වූ නමුත් මිහින්තලය යනු වඩාත් ප්‍රසිද්ධ නාමයයි.

මිහින්තලය හඳුන්වන පැරණි නම් පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ. කකුසඳ බුදුන් වහන්සේගේ කාලයේදී මිහින්තලය දේවකූට නමින්ද, කාශ්‍යප බුදුන් වහන්සේ කාලයේදී අඹස්තලා යන නමින්ද හැඳින්වූ බව මහා වංශයේ 15 වන පරිච්ඡේදයේ සඳහන් වේ. මිහිඳු මහරහතන් වහන්සේ අම්බස්තපයට වැඩම කරවීමෙන් අනතුරුව එය මිහින්තලාව නමින් ප්‍රසිද්ධ විය.

1896 වර්ෂයේදී ආර්. ඩබ්ලිව්. අයිවන් මහතා කැණීම් ආරම්භ කළේය. මෙම වසර මුළුල්ලේම හිරකරුවන් යොදා ගනිමින් මහා සෑයේ සංරක්ෂණ කටයුතු ආරම්භ කළ බව පුරාවිද්‍යාත්මක වාර්තාවන්හි සඳහන් වේ. මිහින්තලේ කන්ද හා පූජනීය ස්ථාන, මිහින්තලේ රජමහා විහාරයට අයිති බව 1910 දී වැඩ වාසය කළ භික්ෂූන් වහන්සේලා විසින් රජයට දන්වන ලදී. යළිත් මිහින්තලේ විහාරාධිපතීන් වහන්සේලා හා පුරාවිද්‍යා කොමසාරිස්තුමා අතර ඇතිවූ සම්මුතිය හේතුවෙන් 1912 වසරේ අගෝස්තු මස 16 වන දින රජයේ ගැසට් පත්‍රයේ නිවේදනය කිරීමෙන් අනතුරුව මිහින්තලේ පුරාවිද්‍යාත්මක කැණීම් ආරම්භ කරනු ලැබීය.

"තමාගේ තරමට වඩා උඩඟුව කටයුතු කිරීමෙන් පිරිහේ - විනීල ජාතකය"



පොසොන් සඳේ තෙමෙන්නයි අටමස්ථානේ වඳින්නයි

අනුරපුර වන්දනාවේ යන ඔබටයි මේ





දහම් ආලෝකය රැගෙන බු.ව. 236 අනුබුදු මිහිඳු හිමි සිරිලකට වැඩම වීම මෙරට ආගමික, ශාසනික, සංස්කෘතික, සෞන්දර්යාත්මක හා කලාත්මක ප්‍රබෝධයක් ඇතිවූ බව ශාසන වංශකතාවල සනිටුහන් වී ඇත. ශ්‍රී ලංකාවට ''සදහම් දිවයින'' නැතහොත් ''ධර්මද්වීපය'' යන කීර්ති නාමයන් පටබැඳුණේ මහින්දගමනයේ සාධනීය ප්‍රතිඵලයක් වශයෙනි. අනුරාධපුර ඓතිහාසික මහමෙවුනා පුණ්‍ය භූමිය කේන්ද්‍ර කරගෙන ඇතිවූ අටමස්ථානය ඇතුළු පූජනීය ස්ථාන බිහිවන්නේ මෙම සදහම් ආලෝකයේ ප්‍රතිඵලයක් වශයෙනි. අනුරාධපුර පූජා භූමියට ඇතුළු වන ඔබ අනිවාර්යයෙන්ම මෙම පූජනීය ස්ථානවල ඇති ඓතිහාසික වැදගත්කම දැනගෙන සිටීම ඉතා වැදගත් වෙයි. අනුරාධපුර පුණ්‍ය භූමියේ අටමස්ථාන හා පූජනීය ස්ථාන කවරේදැයි ගෙනහැර දැක්වීම මෙම ලිපියේ අරමුණ වෙයි.

අනුරාධපුර අටමස්ථාන වන්නේ ජය ශ්‍රී මහා බෝධිය, ථූපාරාමය, රුවන්වැලි සෑය, ලෝවාමහාපාය, අභයගිරිය, ජේතවනාරාමය, මිරිසවැටිය හා ලංකාරාමයයි.

ජය ශ්‍රී මහා බෝධිය

දඹදිව බුද්ධගයාවේ සිට ජය ශ්‍රී මහා බෝධි ශාඛාව සිරිලකට වැඩම කරවන ලද්දේ සංඝමිත්තා මෙහෙනින් වහන්සේ ප්‍රධාන රාජකීය පිරිවර විසිනි. බෝධි ශාඛාව තථාගතයන් වහන්සේ සම්මා සම්බුද්ධත්වය ලැබූ ස්ථානයේ පිහිටි බෝධියේ අංකුරයකි. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ රෝපණය කරන ලද්දේ පෙර තුන් බුදුවරුන් වහන්සේලාගේ බෝධි වෘක්ෂවල දක්ෂිණ ශාඛා පිහිටුවන ලද තැන්වලම බව සමන්ත ප්‍රාසාදිකා නම් විනය අටුවාවේ සටහන්ව ඇත. එද ආර්යාවර්තයේ උරුවෙල් දනව්වේ පිහිටි තිලෝගුරු බුදුරජාණන් වහන්සේට බුද්ධත්වය ලබාග ැනීමට සෙවන දුන් මහා ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ විර්තමාන බුද්ධගයාවේ පවා දක්නට නැත. එහෙයින් එම මව් බෝධියේ එකම සජීවී ශාඛාව අනුරාධපුර මහා මෙව්නාවේ පමණක් විද්‍යමාන වන බැවින් එය සමස්ත බොදුණු දණන්ගේ ගෞරවයට පාත්‍ර වන්නේ ජීවමාන බුදුන් වහන්සේ මෙන් සැලකීමෙනි. ජය ශ්‍රී මහා බෝ සෙවණේ මල්, පැන්, පිරිකර පුද වන්දනාමාන කරන ඔබගේ චින්තනය තුළ ජීවමාන බුදුන් වහන්සේට වන්දනාමාන කරන්නාක් බඳු බැතිබර හැඟීමක් ඇතිවීම නොවැළැක්විය හැකිය. හරිත වර්ණයෙන් බැබළෙන ශ්‍රී මහා බෝධිය පොසොන් පෝය දින සතර දිග්භාගයෙන් ඇදී එන සැහැදුවත් බොදු බැතිමතුන්ගෙන් පිරී ඉතිරී යයි. ශ්‍රී මහා බෝධිය තුළ දකිය හැකි රන්වැට, බෝධියේ නැගෙනහිර පාර්ශ්වයෙහි පිහිටි ප්‍රතිමා ගෘහය අලුතින් ඉදිකරන ලද නිර්මාණ වෙයි. බෞද්ධයාගේ මුදුන් මල්කඩ වන ශ්‍රී මහා බෝධිය ජීවමාන බුදුන් වහන්සේ හා සමානව පුද පූජා ලබති. වරින් වර ද්‍රවිඩ ආක්‍රමණයන් වෙහෙර විහාර විනාශ කළත් ශ්‍රී මහා බෝධියට හානි නොවූයේ එහි සුවිශේෂී පූජනීයත්වය හා අදෘශ්‍යමාන බලවේගය නිසාය. 1948 ශ්‍රී මහා බෝධිය අවට කලාපය පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්විය.

''සුපතිට්ඨිත රට්ටනුරාධපුරේ - සම දිට්ඨිකා දක්ඛිණ ශාක භවං
සුභ මේඝ වනම්බර මේඝ දීඝං - ජයබෝධි මහං පනවාමි වරං''

ථූපාරාමය

ලක්දිව ගොඩනගන ලද ප්‍රථම ඓතිහාසික ස්ථූපය වශයෙන් අනුරාධපුර ථූපාරාමය ඉතිහාසයට එක්වී තිබේ. මහාවංශයට අනුව ක්‍රි.පූ. 3 වන සියවසේදී මෙරට ප්‍රථම බෞද්ධ රජතුමා වූ දේවානම් පියතිස්ස මහරජතුමා විසින් මෙය ඉදිකළ බව සඳහන්ව ඇත. ධාන්‍යාගාර ආකෘතියේ හැඩයෙන් සාදා ඇති මෙම දර්ශනීය දාගැබ තුළ බුදුරදුන්ගේ දකුණු අකුධාතුව හා පාත්‍රයක් පමණ සර්වඥ ධාතු තැන්පත් කර ඇති බව පුරාණ මූලාශ්‍රවල දක්වේ. තථාගතයන් වහන්සේගේ තෙවන ලංකා ගමනේදී බුදු පා පහසින් පාරිශුද්ධියට පත් භූමියක පිහිටි මෙම දාගැබ පරිමාණයෙන් එතරම් විශාල නොවන අතර එහි භාදයේ විෂ්කම්භය අඩි 59 කි. උස අඩි 63 කි. වටප්‍රමාණය අඩි 194 කි. අඩි 11 අඟල් 4 උස වේදිකාවක දාගැබ ගොඩනගා ඇත. ශ්‍රී ලාංකික බෞද්ධයන්ගේ පූජනීයත්වයට බඳුන් වූ මෙම චෛත්‍යය වරින් වර ප්‍රතිසංස්කරණවලට භාජනය වීමෙන් අද සුන්දර දර්ශනීය කලා නිර්මාණයක් වශයෙන් මූර්තිමත් වනු ඇත. දාගැබ සමීපයේ බසවක්කුලම වැව පිහිටා තිබීමෙන් එයට මනස්කාන්ත පරිසරයක් ලැබී තිබේ. මෙහි ඉදිකොට ඇති සංඝාරාම සුවිශේෂී ලක්ෂණයකි. එය ථූපාරාමය නමින් ප්‍රසිද්ධ විය. ථූපය වටා ඇති අලංකාර ගල් කුලුන මෙහි පැරණි වටදාගෙයක නශ්ටාවශේෂ බව පුරාවිද්‍යාඥයන්ගේ අදහසයි. වසභ රජ මෙහි වටදාගෙය නිර්මාණය කර ඇති අතර

II දප්පුල, I පරාක්‍රමබාහු රජ දරුවන් මෙහි ප්‍රතිසංස්කරණය කරවා ඇත. ගල්බඳුන, සඳකඩපහණ, මුරගල්වලින් ස්තූපය අලංකාර වී ඇත.

රුවන්වැලි මහා සෑය

බෞද්ධ ලෝකයේ ඉමහත් ගෞරවයට පාත්‍ර වී තිබෙන මහා ථූපය හෙවත් රුවන්වැලි මහා සෑය සමකාලීන ලෝකයේ තිබූ විශාලම චෛත්‍යය යයි කියනු ලැබේ. මෙම දාගැබ ජයශ්‍රී මහා බෝධියට නුදුරින් දර්ශනීය පරිසරයක පිහිටා ඇත. ස්වර්ණමාලි දිව්‍යාංගනාව විසූ ස්ථානයේ ඉදිකරන ලද නිසා එයට ''රුවන්වැලි'' යන නාමය පටබැඳී ඇති බව ජනප්‍රවාදවල කියැවේ. මිල කළ නොහැකි රන්, රිදී, මුතු මැණික් ලක්දිව රාමගාම ස්තූපයේ නිධන් කොට තිබූ සර්වඥ ධාතූන් වහන්සේලා රුවන්වැලි මහා සෑයේ නිධන් කොට ඇතැයි සඳහන් වේ. වාස්තු විද්‍යාත්මකව බුබ්බුලාකාර හැඩයකින් යුතුව මෙම දාගැබ බු.ව. 383 දී දුටුගැමුණු මහරජතුමා විසින් නිර්මාණය කරන ලද්දකි. දාගැබේ වටප්‍රමාණය අඩි 950 ක් වන අතර උස අඩි 338 කි. රන් ආලේපිත සහ චූඩා මාණික්‍යයේ උස අඩි 25 කි. සඳ පායා ඇති නිසල රාත්‍රියක මහා පරිමාණයේ සෑය වටා ඇති සලපතල මළුව වටා පැදකුණු කරන මොහොතක සිත නිවී ශාන්ත හැඟීමක් ඇතිවෙයි. චෛත්‍යය වටා අභිනවයෙන් සාදන ලද ඇත්පවුර දර්ශනීය ලක්ෂණයක් ගෙන දෙයි. සිරිලක එතෙක් පැවැති විශාල ස්තූප වීම, මහා විහාර භූමියේ පිහිටීම, හෙළ වීරයකු වූ දුටුගැමුණු රජ විසින් ගොඩනැංවීම නිසා මෙහි සංස්කෘතික වැදගත්කම තවත් වැඩිවී ඇත. දැනට වර්ෂ 2172 ක් පැරණි මෙය රුවන්වැලි චෛත්‍ය වර්ධන සමාගම මගින් ප්‍රතිසංස්කරණය කොට වාහල්කඩ සාදවා දර්ශනීයත්වයට පරිවර්තනය කොට ඇත.





අභයගිරිය

මහාථූප වංශකතාවේ කියවෙන බෞද්ධ ජනතාවගේ ගෞරව ප්‍රසාදයට පාත්‍රවී ඇති ඓතිහාසික සිද්ධස්ථානයක් ලෙස අභයගිරිය සැලකේ. මහා විහාර සීමාවෙන් බැහැරව පිහිටි මෙම දාගැබ උසින් අඩි 245 කි. වට ප්‍රමාණය අඩි 365 කි. ක්‍රි.ව. 112-134 රජ කළ වට්ටගාමිණී අභය (වලගම්බා) මහරජතුමා විසින් ගිරි නිගන්ටයාගේ අසපුව විනාශකොට එම සුන්බුන් මත අභයගිරි ථූපය ඉදිකළ බව මහා වංශයේ සඳහන් වේ. කිත්සිරි මෙවන් රජ දවස අභයගිරිය ප්‍රමාණයෙන් විශාල කොට එහි බෝධි වෘක්ෂයක්ද රෝපණය කර ඇත. මහා පරාක්‍රමබාහු රජතුමාද මෙම පූජනීය ස්ථානයේ අනාගත අභිවෘද්ධියට විසල් මෙහෙවරක් සිදුකොට තිබේ. ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ හා පාත්‍රා ධාතූන් වහන්සේ කලින් අයත්ව තිබුණේ අභයගිරිය විහාරයට බව පැවැසේ. මහා පැරකුම් රජ දවස මෙම දාගැබ විශාලත්වයට පත්කරන ලද බව සඳහන් වේ. දාගැබට ප්‍රවේශ වන ස්ථානයේ දකිය හැකි බහිරව රූපය අති විශිෂ්ට කලා නිර්මාණයක් ලෙස නම් කොට ඇත. රත්න ප්‍රාසාදයද මේ සමීපයේ පිහිටා ඇත. මෙම දාගැබෙහි සර්වඥ ධාතූන් තැන්පත් කළ රන් ගව රූපයක් සහිත රන්පත් ඉරුවල ලියූ ත්‍රිපිටකය නිධන් කොට තිබේ. දැනට වර්ෂ 2100 ක් පැරණි මෙම දාගැබ අනුරාධපුරයේ දර්ශනය වන තරමක කඳුගැටයක් වන ජරාවාස වූ වෙහෙරකි. 5 ශතකයේ ශ්‍රී ලංකාවට පැමිණි පාහියන්ගේ වාර්තාවේ අභයගිරියේ භික්ෂූන් 5000 ක් සිටි බවද, වාර්ෂිකව දළදා පූජාවක් පැවැත්වූ බව සඳහන් වීමෙන් බෞද්ධ මධ්‍යස්ථානයක් වශයෙනුත්, කලා කේන්ද්‍රස්ථානයක් වශයෙනුත් අභයගිරියේ වැදගත්කම සිතා ගත හැකිය.

මිරිසවැටිය

දුටුගැමුණු මහරජතුමා ප්‍රථමයෙන් ඉදිකරන ලද චෛත්‍යය මිරිසවැටිය බව මහා වංශයේ සඳහන් වේ. ක්‍රි.ව. 161-137 කාලය තුළ මහා සංඝරත්නය සිහි නොකොට අනුභව කළ මිරිස් ව්‍යංජනයක් සිහිවීමට කරන ලද දාගැබක් වූ හෙයින් එය මිරිසවැටිය නමින් ව්‍යවහාර වූ බව කියවේ. මෙය අටමස්ථානවලින් එකකි. බුදුරදුන්ගේ ශ්‍රී පාද ස්පර්ශයෙන් අති පාරිශුද්ධ වූ ස්ථානයක ගොඩ නැගූ මිරිසවැටි සෑයෙහි සර්වඥ ධාතූන් සහ රජතුමාගේ රාජකුන්තායුධය නිදන් කොට ඇති බව ඓතිහාසික මූලාශ්‍රවල සඳහන් වේ. 19 කෝටියක් ධනය වියදම් කොට ගොඩනැගූ මෙම ථූපය උස අඩි 200 කි. වටප්‍රමාණය අඩි 560 කි. පාදයේ විශ්කම්භය අඩි 168 කි. චෛත්‍යය ඉදිකොට පූජා කිරීමේ උත්සවයේදී භික්ෂූන් වහන්සේලා 1,90,000 ක් වැඩම වීමෙන් මෙය අති පූජනීය පින් බිමක් ලෙස සැලකේ. මෙහි දර්ශනීය විහාරයක්ද ඉදිකොට ඇත. වෝහාරතිස්ස රජ දවස මිරිසවැටි සෑයෙහි චිත්‍රකර්ම සහ ප්‍රාකාරයද කරවූ බව කියවේ. පරසතුරු උවදුරු නිසා ක්‍රි.ව. 1883 දී මෙය ගරා වැටීමකට පත්විය. භූමි පරිශ්‍රයේ වල්බිහි විය. මෑතකදී ශ්‍රී ලංකාවට පැමිණි සියම් ජාතික කුමාරයකුගේ පවුම් 1200 ක විශේෂ ධන පරිත්‍යාග යෙන් යළිත් ප්‍රතිසංස්කරණය කර ඇත. මෙම ස්ථානය පවත්වාගෙන යාම සඳහා අක්කර 50 ක භූමි භාගයක් පූජා කර ඇත. දැනට වර්ෂ 2172 ක් පැරණි මිරිසවැටි චෛත්‍ය රාජයා චෛත්‍ය සංවර්ධන කමිටුව ශ්‍රමදාන පදනමින් සංවර්ධනය කිරීම භාග්‍යයකි. වර්තමානයේ අප වන්දනාමාන කරන්නේ ප්‍රතිසංස්කරණය කරන ලද මිරිසවැටි චෛත්‍යය බව මෙහිලා සඳහන් කළ යුතුව ඇත.

ජේතවනාරාමය

අනුරාධපුර අටමස්ථාන අතර විශාලම චෛත්‍යය ලෙස සැලකෙන ජේතවනාරාමය ක්‍රි.ව. 274-301 රජ කළ මහසෙන් මහරජතුමා විසින් ඉදිකළ බව සඳහන් වේ. ජෝතිවන නම් උද්‍යානය තුළ කරවන ලද මෙය කිත්සිරි මෙවන් රජ විසින් අංග සම්පූර්ණ කර ඇත. සිංහල සාහිත්‍ය වංශකථා හා සෙල්ලිපිවල දෙනානකය, දෙනාවෙහෙර යනුවෙන් මෙම ථූපය ව්‍යවහාරයට පත්වී ඇත. පාදයේ වර්තමාන විශ්කම්භය අඩි 367 කි. උස අඩි 232 කි. වටප්‍රමාණය අඩි 11,000 කි. මෙම දැවැන්ත ස්තූපය දෙවැනි වන්නේ මිසරයේ පිරමීඩයකට පමණි. ගෞතම බුදුරජාණන් වහන්සේගේ පටිධාතුවෙන් කොටසක්ද, සර්වඥධාතුද මෙහි තැන්පත් කොට ඇත. මෙම දාගැබ නිරීක්ෂණය කරන ඔබට ඉහළ කැඩී බිඳී ගිය ස්වභාවයක් දැකගත හැකිය. දාගැබ උඩ කැලෑ රොදකි. ගඩොල් බදාමයෙන් යුක්තය. උඩ කොත් කොටස කැඩී ඇත. ථූපය අක්කර 3 කින් සමන්විත වන අතර මළුව අක්කර 8 කින් යුක්තය. මෙහි පෞරාණිකත්වය රැකගැනීම සඳහා ඒ තත්ත්වයෙන්ම පවතින බව දක්විය යුතුය.

ජේතවන විහාරය ගත්විට පිරිවෙන් ප්‍රාකාරය, ප්‍රතිමාකාර ආදියෙන් සමන්විතව ඇත. දැනට වර්ෂ 1677 ක් පැරණි මෙම දාගැබ අනුරාධපුර පූජා නගරවරයෙහි උසින් දිස්වෙන ලෝකයේ උසම ස්තූපය ලෙස ප්‍රසිද්ධ පෞරාණික චෛත්‍යයකි.

ලංකාරාමය

අටමස්ථාන අතරින් මහා මෙව්නා උද්‍යානයට තරමක් දුරින් පිහිටා ඇති ලංකාරාමය බු.ව. 455 දී රාජ්‍යශ්‍රීයට පත් වලගම්බා රජතුමා කලක් සැඟවී සිටි ස්ථානයක් වූ 'ගල්හෙබකඩ' නම් ස්ථානයේ ලංකාරාම සෑය කළ බව මහාවංශයේ සඳහන් වේ. මෙම පූජනීය ස්ථානය පුරාණයේ 'මණිසෝමාරාමය' නමින් හැඳින්වූ බව වංශකථාවල දැක්වේ. එමෙන්ම මෙය අභයගිරියට සම්බන්ධව සිටි භික්ෂුණීන්ගේ ආරාමය වශයෙන්ද පැවැති බවට වාර්තා ඇත. අඩි 38 ක විශ්කම්බයකින් නිර්මිතව ඇති මෙම ථූපයේ වලගම්බා රජුගේ බිසව වන සෝමා දේවියට අයත් අගනා මැණික් මෙහි නිදන් කළ බව කියවෙන නිසාත් එම දාගැබ මණිසෝමාරාය හෙවත් 'මණිථූපාරාමය' නමින්ද භාවිත වූ බව පුරාණ මූලාශ්‍රවල දක්වේ. ලංකාරාමය වටා අලංකාර වටදාගෙයක් පැවැති බවට එහි විද්‍යමාන ගල්කණු සාක්ෂි දරයි. මෙය ඇතුළු මළුව හා පිට මළුව යනුවෙන් මළු දෙකකින් සමන්විතය. වර්ෂ 2010 ක් පැරණි මෙම චෛත්‍යය වත්මන් ප්‍රතිසංස්කරණය නිසා එහි පෞරාණික ස්වරූපය තරමක් විනාශ වී ඇත.





ලෝවාමහාපාය

ජය ශ්‍රී මහා බෝධිය වන්දනාමාන කර ස්වර්ණමාලි දාගැබ දෙසට ගමන් කරන ප්‍රවේශ මාර්ගයේ අතරමගදී දකුණු පස ලෝවාමහාපාය දිස්වනු ඇත. මිහිඳු හිමියන් දේවානම්පියතිස්ස රජතුමා සමග ප්‍රකාශ කළ අන්දමට එම ස්ථානයෙහි ප්‍රාසාදයක් ඉදිකරවීමේ අවස්ථාව දුටුගැමුණු රජතුමාට ලැබුණේය. ලෝවාමහාපාය ඉදිකොට ඇත්තේ විශාල උස් ගල් කණු මතය. සිංහල කලාවේ උච්චස්ථානයක් හිමිකර ගැනීමට මෙම බෞද්ධ නිර්මාණ ශිල්පය සමත් විය. භික්ෂූන් වහන්සේලාගේ විහරණය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකරවීමට දුටුගැමුණු රජ ඉදිරිපත් වූ පසු එහි සැලැස්ම එක් රහතන් වහන්සේ නමක් ඉදිරිපත් කළ බවත් එය දෙව් විමනක ආකෘතියක් බවත් වංශකථාවල සඳහන් වේ. දුටුගැමුණු රජතුමා මෙම ප්‍රාසාදය නව මහලක් කොට ඉදිකර එහි ස්වර්ණාලේප කළ ලෝහ උළු සෙවිලි කළ බවත් එනිසාම ලෝවාමහා ප්‍රාසාදය යන නාමය යොදා ඇති බවද පැවසේ. විශාල සංඛ්‍යාවක් ගල් කුලුනු යෙදීමෙන් චිරාත් කාලයක් පවතින ලෙස ඉතා ශක්තිමත්ව හා අලංකාර ලෙස නිර්මාණය කළ බවද සඳහන්ව ඇත. මෙය ගින්නෙන් විනාශ වීමෙන් පසුව හෙළ රජ දරුවන් කීපදෙනකු මෙය යළි සත්මහල් කොට ඉදිකළ බවද පුරාණ මූලාශ්‍රවල සඳහන් වේ. මෙම සුවිසල් මහා ප්‍රාසාදය මහා විහාරීය භික්ෂූන් වහන්සේලාගේ පොහොය ගෙය වශයෙනුත්, මහා විහාරයේ භාණ්ඩාගාරය වශයෙනුත් පරිශීලනය වූ බව සඳහන්ය.

ඉසුරුමුණි විහාරය

අනුරාධපුර අටමස්ථානවලින් එකක් වන ඉසුරුමුණිය ඉසුරුමත් ප්‍රභූවරුන් පන්සියයක් පැවිදි වූ ස්ථානයේ කරන ලද හෙයින් එය ඉසුරුමුණි විහාරය නමින් හැඳින්වේ. සර්වඥ ධාතු සහ රන්පත්වල ලියන ලද ත්‍රිපිටකයද නිදන්ව ඇති මෙම පැරණි විහාරය බු.ව. 236 දී දේවානම්පියතිස්ස රජතුමා විසින් කරවන ලදැයි සැලකේ. තිසාවැවේ සුළං ධාරාවල සිසිලස ලබමින් මනරම් තැනිතලා භූමියක මෙය පිහිටා ඇත. බුදු පිළිමයක්, අෂ්ඨඵල බෝධියක්, ගල්තලාව මත දිස්වන දාගැබක්, පොකුණ, විහාර ගෙයක් මෙහි නිරීක්ෂණය කළ හැකිය. පෙම් යුවළ, රජ පවුල, ගල් ආසනය, රඟන වාමන රූප, අප්සරාවන්, දේවතා රූප, කැටයම් ගල්, කිඳුරු රැඟුම් මෙම විහාර පරිශ්‍රයේ දැකගත හැකිය. මෙම විහාරයේ සංස්කෘතික වැදගත්කම මූර්තිමත් වන්නේ එහි ඇති දර්ශනීය ගල් කැටයම නිසාය. ඉසුරුමුණි පෙම් යුවළ ලෙස ලෝ පසිදු මෙම ගල් පුවරුව උස අඩි 3 අඟල් 1 කි. පළල අඩි 2 අඟල් 3 1/2 කි. බොහෝ දෙනකුගේ මතය අනුව මෙය ක්‍රි.ව. 6 සියවසේදී ඉදිකළ බව සඳහන්ය. මෙම යුවල ශිව දෙවියා හා පාර්වතී බවද, තව කෙනෙක් සිදුහත් හා යශෝධරා බවද දක්වයි. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ මතය වන්නේ මෙම යුවළ සාලිය කුමරා හා අශෝකමාලා විය හැකි බවය.

දක්ෂිණ මේඝගිරි විහාරය ලෙසද නම් කළ මෙම ස්ථානය ප්‍රථමයෙන් දන්ත ධාතූන් වහන්සේ වඩා හිඳුවා ඇති බව දළදා වංශයේ දක්වේ. නිසි කලට වැසි ලබාගැනීමට මෙහි පුද පූජා පැවැත්වූ බවද වාර්තාගත වේ. එහෙයින් ලෝක ප්‍රකට කලා මධ්‍යස්ථානයක් වශයෙනුත්, පෞරාණික සිද්ධස්ථානයක් වශයෙනුත් ඉසුරුමුණිය වැදගත් වේ.

මහා මෙව්නාවේ සමාධි පිළිමය

සිරිලක කලාකරුවන්ගේ කලා කෞශල්‍යයක් ප්‍රතිභාපූර්ණත්වයත්, දේශීය ඌරුවත් ප්‍රකට කරන ප්‍රතිමාව ලෙස මහා මෙවුනාවේ සමාධි ප්‍රතිමාව හැඳින්විය හැකිය. එම ප්‍රතිමාවෙන් ප්‍රකට වන ශාන්ත සුන්දර බව, ශ්‍රද්ධාව, ආධ්‍යාත්මික පාරිශුද්ධිය, බුදුරදුන්ගේ ආධ්‍යාත්මික සමතුලිතතාව, මහා කරුණාව, මහා ප්‍රඥාව, වෙනත් පිළිමවල නොමැත. අති විශිෂ්ට කලා නිර්මාණයක් වන මෙම ප්‍රතිමාව දකින ඔබගේ සිත මෙත් සිසිලෙන් තෙමාලන්නට සමත් අති මානුෂ බලවේගයක් මෙහි දැකිය හැකිය. මේ තුළින් දේශීය කලාකරුවා දැක්වූ ස්වීයත්වය හා ප්‍රකාශන ශක්තිය මොනවට පැහැදිලි වෙයි. මහා කරුණා සමාපත්තියෙන් ධ්‍යානයට වැඩ හිඳින මෙහි තථාගතයන් වහන්සේගේ ශාන්ත ඉරියව්ව ප්‍රකට වනු ඇත. සමාධි ප්‍රතිමාව දෙස් විදෙස් කලාකරුවන්ගේ, වියතුන්ගේ විචාරයට හා පුදුමයට පාත්‍ර වූ කලා නිර්මාණයක් ලෙස ඇගයීමට ලක්ව තිබේ. හෙළ රජ දවස මෙම ප්‍රතිමාව පිටුපස බෝ වෘක්ෂයක් තිබූ බවටද සාක්ෂි ඇත.

අනුරාධපුර පූජනීය භූමිය තුළ පිහිටි අටමස්ථානය වැඳ පුදා ගැනීමට එක්වන බොදු බැතිමතුන්ට එම සිද්ධස්ථානවල ඇති ඓතිහාසික වැදගත්කම, ආගමික හා සංස්කෘතික අගය පිළිබඳව නිවැරදි අවබෝධයක් ඉහත විස්තර වාර්තාවලින් ලැබෙන්නට ඇතැයි සිතමි.

මෙම අටමස්ථානය හැරුණු විට පෞරාණික වැදගත්කමකින් යුත් ශ්‍රේෂ්ඨ ස්ථාන රැසක් අනුරාධපුරයට ප්‍රවේශ වන ඔබට නැරඹිය හැකි අතර ඒවා වන්දනාමාන කිරීම බෞද්ධ බැතිමතුන්ට මහත් ආශීර්වාදයක්ද වන්නේය.

ටී. කුලසිරි ප්‍රනාන්දු ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, (ශ්‍රී ලංකා පරිපාලන සේවය),
කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය



භය - ලැජ්ජාවෙන් අකුසල ධර්මයන් නොකොට ජීවත් වීමේ අනුසස් කියැවෙන

දෙවධර්ම ජාතකය

බ්‍රහ්මාතිබ්‍රහ්ම වූ, දේවාතිදේව වූ, ත්‍රෛලෝක්‍යතිලක වූ සම්මා සම්බුදුරජාණන්වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා බහුභාණ්ඩික භික්ෂූන්වහන්සේ නමක් අරභයා දෙවධර්ම ජාතකය දේශනා කොට වදාළ සේක. සැවැත්නුවර එක් කෙළෙඹි පුත්‍රයෙක් තම භාර්යාව මිය ගිය පසු මහණ වූයේය. ආහණ වන්නට පෙරාතුව තමාට මුල්තැන්ගෙයක්, ගබඩා ගෙයක් සමඟ පන්සලක් කරවා, ඒ ගබඩාවේ ගිතෙල්, තලතෙල් ආදිය පුරවා මහණ වූ පසු තමා සන්තක කෙල්ලන්, කොල්ලන් කැඳවා කැමති ප්‍රිද්දෙන් බත් මාළු පිසවාගෙන අනුභව කරමින්, විහාරයේ කෙළවරක වාසය කළේය. සිවුරු ආදී බොහෝ පිරිකර රැස් කළේය. රාත්‍රියෙහි එක් අඳනයක් හා පොරවනයක් දැරීය. දිවා කාලයෙහි වෙනත් අඳනයක් හා පොරවනයක් පොරවන්නේය.

එක් දවසක් මේ භික්ෂූන්වහන්සේ සිවුරු හා ඇතිරිලි ආදිය මළුවෙහි අව්වට එළා තැබුවේය. ඒ අසළින් වැඩම කළ ඒ ජනපදවාසී භික්ෂූන්වහන්සේ මේ මළුවේ එළා ඇති සිවුරු කාගේදැයි විමසූහ. එවිට ඒ බහුභාණ්ඩික මහණුන්වහන්සේ මගේයැයි පැවසූහ. මේ සිවුරුත්, මේ අඳනත් ඔබගේම දැයි අසා, බුදුරජාණන්වහන්සේගේ ශාසනයෙහි මහණ වී මෙසේ පිරිකර බහුලව තබාගන්නේ ඇයිදැයි විමසා ඒ භික්ෂුව කැඳවාගෙන බුදුරජාණන්වහන්සේ සමීපයට ගියහ. ඈත සිට එන මහණුන්වහන්සේලා දුටු බුදුරජාණන්වහන්සේ මේ භික්ෂුව නොකැමැත්තෙන් කැඳවාගෙන එන්නේ ඇයිදැයි විමසා වදාළ සේක. එවිට භික්ෂූන්වහන්සේලා මේ භික්ෂුවට බහුපරිස්කාර ඇත්තේයැයි දැන්වූහ. එය ඇසූ බුදුරජාණන්වහන්සේ, සැබෑවක්දැයි විමසා, මම නොයෙක් කාරණයෙන් අල්පේච්ඡ බව හා සංතුෂ්ඨිය, කායවිවේකය, චිත්තවිවේකය, විදර්ශනා භාවනාවෙහි ද, හැසිරීමෙහි ගුණ දේශනා කොට තිබෙන්නේ නොවේදැයි වදාළ සේක. මෙසේ විමසීම පිළිබඳ උරණ වූ භික්ෂුව ලැජ්ජා නැතිව පොරවනය ඉවත දමා අඳනය පිටින් සිටියේය.

මහණ තොප පෙර භය, ලැජ්ජා ඇත්තෙහි නොවේදැයි දිය රකුස්ව උපන්නා වූ කාලයේ භය ලැජ්ජා දෙක සොයමින් දොළොස් අවුරුද්දක් විසුවේ නොවේදැයි, එසේ වූ ඔබ මේ සඟ පිරිස් මධ්‍යයේ පොරවනය ඉවත් කොට භය ලැජ්ජා හැර සිටින්නේ

"වැඩිහිටියන්ට අකීකරු වීම විපතට හේතුවේ - ඉන්දගුත්ත ජාතකය"

කෙසේදැයි වදාළ සේක. එබස් ඇසූ මහණ තෙමේ, භය ලැජ්ජා දෙක ඇතිකර ගෙන දමාලූ සිවුර නැවත හැඳ පොරවාගෙන බුදුන්ට වැඳ එකත්පස්ව සිටියේය. එම අවස්ථාවෙහි අනෙක් භික්ෂූන්වහන්සේ පෙර අවස්ථාවේ අර්ථය ප්‍රකාශ කරන්නැයි ඉල්ලා සිටියහ. එවිට බුදුරජාණන්වහන්සේ පෙර භවයෙහි කරුණු ප්‍රකාශ කරන්නට වන් සේක.

යටකී දවස කසී රට බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජකෙනෙක් රාජ්‍යය කරන විට මහබෝසතාණන්වහන්සේ අගමෙහෙසුන් කුස පිළිසිඳගත්හ. කුමාරයාට මහිංසාස කුමාරයෝ යැයි නම් තැබූහ. ඒ කුමාරයන් දුවපැන ඇවිදින සමයෙහි අනෙක් කුමරෙක් ද උපන්නාහ. ඒ කුමාරයාට චන්ද කුමාරයෝයැයි නම් තැබූහ. ඒ කුමාරයන් ඇවිදින කාලයෙහි බෝසත් මෑණියෝ කලුරිය කළාය. ඉන් අනතුරුව රජුට ප්‍රිය මනවඩන බිසවක් සරණපාවා ගත්තේය. ඇයට උපන් කුමරුන්ට සූර්ය කුමාරයෝයැයි නම් තැබූහ. රජ්ජුරුවෝ ඒ කුමාරයන් දැක සතුටු සිත් ඇතිව බිසවට ඔබට කැමති වරයක් ඉල්ලන්න යැයි කීවේය. ඒ කැමති වරය වෙනත් අවස්ථාවක ගන්නෙමැයි කියා තැබුවාය. ඒ බිසව තම පුතණුවා වැඩිවියට පැමිණි කල්හි පුත් කුමාරයා උපන් පසු පොරොන්දු වූ වරය දෙන්නැයි ඉල්ලුවාය. මාගේ පුතණුවන්ට රාජ්‍යය දෙනු මැනවැයි ඈ කීවාය. රජ්ජුරුවෝ එම වරය දීමට නොපිළිවනැයි නැවත නැවත කියා ඒ බිසව තමන්ගේ පුතණුවන්ට රාජ්‍ය නැවත නැවතත් ඉල්ලන නිසා දරුවන්ට අනර්ථයක්, අවැඩක් සිදුවෙතැයි සලකා මහිංසාස කුමාරයාට හා චන්ද කුමාරයා අමතා, සූර්ය කුමරු උපන් දිනයෙහි ඔවුන්ගේ මෑණියන්ට වරයක් දුනිමි. දැන් එම මෑණියෝ රාජ්‍යය ඉල්ලති. ස්ත්‍රියෝ නම් පාපියෝය. ඔබලාට නපුරක් විය හැකියැයි කියා වනයට ගොස් මා ඇවෑමෙන් තොප සන්තක මේ නුවර රාජ්‍යය කරවයි අඬා වැළප සිඹ සනසා යැවූහ.



ඔවුන් දෙදෙනා පිය රජතුමාට වැඳ මාළිගාවෙන් පිටතට යන අවස්ථාවෙහි සූර්ය කුමාරයා එය දැක, අනික් කුමාරවරුන් දෙදෙනා සමඟ තමන් ද වනයට යෑමට එකඟව ගියාහුය. බෝධිසත්වයෝ මාර්ගයෙන් යන අතර, වනයෙහි රුකක් අසල තිබූ විලක් ළඟ දී සූර්ය කුමාරයාට කථා කොට අර පෙනෙන විලට ගොස් නා පැනුත් බී පියුම්පතින් අපටත් පැන් ගෙනෙන්නැයි කියා යැවීය. මෙම විල වෙසමුණු රජ්ජුරුවන්ගෙන් වර ලත් එක් දිය රකුසෙකු විසින් ලබන ලද්දේය. විලට බැස්ස අය පමණක් කෑමට ඔහුට වරය ලැබී තිබිණ. සූර්ය කුමාරයා ඒ විලට ගොස් පරීක්ෂා නොකොට බැස්සේය. එවිට එහි රාක්ෂයා කුමාරයා අල්ලාගෙන දේවධර්මය දන්නේදැයි විමසා එය කියන ලෙස පැවසීය. එවිට කුමාරයා දේවධර්මය නම් චන්ද, සූර්ය දෙදෙනායැයි පැවසීය. එවිට දියරකුසා, ඔබ දේවධර්මය නොදන්නේයැයි කියා, දියෙහි ඔබා තැබීය. බෝධිසත්වයන්වහන්සේ කුමාරයා ප්‍රමාද බැවින්, චන්ද කුමාරයා යැවීය. දියරකුසා චන්ද කුමාරයා අල්වාගෙන දේවධර්මය ඇසූ විට දේවධර්මය නම් සතරදිග යැයි පැවසීය. රාක්ෂයා ඔහු ද අල්වාගෙන දියෙහි සඟවා තැබීය.

බෝධිසත්වයෝ මෙම කුමාරවරුන්ට එක්තරා අන්තරායක්යැයි සිතා විලට බැස්ස පියවර සටහන් දැක මේ රාක්ෂයෙකු අරක්ගත් විලක් යැයි සිතා, කඩුව හා දුනු අමෝරා විලට ළං විය. එවිට යක්ෂයා තමන්ගේ ස්වරූපය වෙනස් කොට පින්වත, තොප ගමන් විඩාවෙන් පෙළෙන බැවින්, මේ විලට බැස නාපියා මල් පැළඳ නෙළුම්දඬු කා නොයන්නේ දැයි විමසීය. බෝධිසත්වයෝ, මොහු මාගේ මළනුවන් දෙදෙනා අල්ලාගත් යක්ෂයෙක් යැයි සිතා, මේ සියලුම දෙනා දේවධර්මය නිසා කෑමෙන් ඔබට ප්‍රයෝජන ඇත්දැයි විමසූ විට, එසේයැයි පැවසූයෙන් බෝසතුන්වහන්සේ දේවධර්මය කීමට එකඟ විය. බෝධිසත්වයන්, තට දේවධර්මය කීමට කිළිටුව සිටින බැවින් නොහැකියි කී විට, රාක්ෂයා බෝධිසත්වයන් නහවා, පැන් පොවා, මල් පළඳවා, උතුම් පර්යංකයක් තනවා දුන්නේය.

රාක්ෂයා පාමුල සිට දේවධර්මයට කන් යොමා සිටින විට, මේ ලෝකයේ යම් කෙනෙක් බයෙන් හා ලැජ්ජාවෙන් අකුසල ධර්මයන් නොකොට අවශේෂ ලෝක චාරිත්‍රයන් දැන, භය ලැජ්ජා දෙකෙන් යුතුව වාසය කරයි ද, කුසල ධර්මයන්හි හැම කල්හිම ඇල්මෙන් වාසය කරත් ද, උතුම් සත්පුරුෂ ගුණ ඇත්තෝ ද, එසේ වූ සත්වයන්ගේ ප්‍රවෘත්තිය මේ ලෝකයෙහි දේවධර්මය වෙයි.

යක්ෂයා මේ ධර්ම දේශනාව අසා ප්‍රසන්න සිතින් මම ඔබ කෙරෙහි ප්‍රසන්න වෙමි. ප්‍රසන්න වූ මම එක් මළනු කෙනෙක් තොපට දෙමි. කවුරුන් ගෙනෙන්න දැයි ඇසීය. ඒ ඇසූ බෝධිසත්වයෝ, බාල මලණුවන් ගෙනෙන්න යැයි කීවේය. එවිට යක්ෂයා, ඔබ උගත් දේවධර්මය දන්නා කෙනෙක්මය. දේවධර්මයේ පවතින කෙනෙක් නොව යැයි කීය. කවර කාරණයක්දැයි කී කල්හි, වැඩිමහලු තැනැත්තා සිටිය දී බාල තැනැත්තා ගෙන්නන හෙයින් තොප ජ්‍යෙෂ්ඨ ධර්මය නොකරයි. එබස් ඇසූ බෝධිසත්වයන්වහන්සේ, එම්බල යක්ෂය, මම දේවධර්මය දනිමි. දේවධර්මයෙහි පවතිමි. අපි මේ වලට නික්මුණේ මේ බාල මලනුවන් නිසාය. මොහුට මොහුගේ මෑණියන්, අපගේ පියාණන්ගෙන් රාජ්‍යය ඉල්ලීය. රජතුමා ඒ වෙනුවෙන් වූ වරය නොදී අපට වනයෙහි වසන්නට දැන්වූහ. ඒ බස් ඇසූ බාල මලණුවන් නතර නොවී අප හා පැමිණියේය. අප ඒ කුමාරයා වනයෙහි යක්ෂයෙක් අනුභව කළේයැයි කීවෝනම් අප කී බස් අදහාගන්නා කෙනෙක් නැත. එසේ බැවින් මම නින්දාවට භයින් බාල මලණුවන් ගෙන්වීමට අදහස් කළේයැයි කීවේය. එබස් ඇසූ යක්ෂයා සාධුකාර දී, ප්‍රසන්නව අනෙක් මලණුවන් ද ගෙනැවිත් බෝධිසත්වයන්ට හාරදුන්හ.

එවිට බෝධිසත්වයෝ යක්ෂයාට අවවාද කරමින්, තෝ පෙර කළ අකුසල කර්මයෙන් අනුන්ගේ මස් කන්නට යක්ෂව උපන්නේය. දැන් නැවතත් අකුසල කර්මයේ යෙදී වාසය කිරීමෙන් සතර අපායට වැටීමෙන් නිදහස් විය නොහැකිය. එබැවින් මෙතැන් සිට අකුසල් හැර කුසල් කරවයි අවවාද කළේය. මෙසේ යක්ෂයා දමනය කරන්නට බෝධිසත්වයන්ට හැකි විය. එතනම වෘක්ෂ කල්හි දවසක් නැකැත්තරු බලා රජතුමා මියගිය බව දැන යක්ෂයා කැඳවාගෙන බරණැස් නුවරට ගොස් රාජ්‍යය ගෙන, චන්ද කුමරුට යුවරජ තනතුර දී, සූර්ය කුමරුට සෙනරත් තනතුර දී, යක්ෂයාට සිත්කලු තැනෙක දේවාලයක් කර දී බත්, මල්, පහන් ආදිය දිනපතා ලැබෙන්නට සලසා, දැහැමින් රාජ්‍යය කොට මියපරලොව ගියේය.

තිලෝගුරු බුදුරජාණන්වහන්සේ මේ දෙවධර්ම දේශනාව නිමවා, චතුස්සත්‍යය දේශනා කළ කල්හි බහුභාණ්ඩික භික්ෂුව ඒ දේශනාව අසා සෝවාන් වූහ. මේ දෙවධර්ම ජාතකයේ උදක රාක්ෂයා නම් දැන් බහුභාණ්ඩික මහණය. සූර්ය කුමරු නම් ආනන්ද ස්ථවිරයෝය. චන්ද කුමාරයා නම් සාරිපුත්ත ස්ථවිරයෝය. මහිංසාස කුමාරයා නම් තිලෝගුරු බුදුරජාණන්වහන්සේය.

මෙම ජාතක කථාවෙන් හෙළිවන පරිදි අපිදු ලැජ්ජා - භය ඇතිව කෙලෙස් මලින් දුරුව, දැහැමිව ජීවත් වීමට සිතා ගනිමු.

කේ. මිගහකුඹුර

දෙසැත්තෑ විය සපිරූ, සසුන් හොඳ සරුකාරන

මල්වතු මහානාහිමිපාණන්වහන්සේ



"යො ච වන්තකසාව'සස
සීලෙසු සුසමාහිතෝ
උපෙතෝ දමසචේචන
ස වේ කාසාවමරහති"

ධම්මපදයේ යමකවග්ගයේ එන යථොක්ත ගාථා පාඨය අනුව 'දුරු කළ කෙලෙස් කසට ඇතිව, ශීලයෙහි මනාව පිහිටා, ඉන්ද්‍රිය දමනයෙන් හා ඇත්ත කීමෙන් යුක්තව පැවිදි දිවිය සරුකර ගත් හෙයින්, කසාවත දැරීමට සාකල්‍යයෙන්ම යෝග්‍යව' වැඩවාසය කරන මහාවිහාරවංශික සුත්තාමොපාලි මහානිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ අතිගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහනාහිමිපාණන්වහන්සේ, සිත, කය, වචනය යන තිදොරින් හික්මී, ධර්මයේ ඇලුණු සිත් ඇතිව, පරාර්ථචර්යාවෙන් යුක්තව, සංඝශෝභන ගුණයන්ගෙන් ශෝභිතව, සසුන් දිවියේ සුරක්ෂාව හා ගෞරවය පිණිස ස්වකීය ශාසනික ජීවිතය හා පෞද්ගලික ජීවිතය කැප කොට ඇති, ගිහි පැවිදි කාහටත් ආදර්ශයට ගත හැකි මහාසංඝපිතෘවරයාණන්වහන්සේ නමකි. ව්‍යක්තභාවයෙන්, පාණ්ඩිත්‍යයෙන්, විශාරද නුවණින් හා නවලොවිතුරු ධර්ම ප්‍රතිපදාවෙන් යුක්ත වූ උන්වහන්සේ සංවරශීලයෙන් යුක්තව ලෝකශාසනික සේවාවෙහි නිරතව වැඩසිටින්නාහ. පසුගිය මැයි 30 වන දිනට දෙසැත්තෑ විය සපිරූ උන්වහන්සේට ආයුරාරෝග්‍ය සම්පත්තිය ප්‍රාර්ථනා කොට, ශිෂ්‍ය භික්ෂූන්වහන්සේ හා දායක කාරකාදීන් එක්ව දානමානාදී පින්කම් රැසක් චාම් හා සරලව ආදර්ශවත් පරිදි සිදුකළහ.

පරාර්ථචරියාව කෙරෙහි ඇලී ගිය සිත් ඇතිව, ගිහිපැවිදි සැමගේ යහපත පිණිස සුඛිත, මුදිත දැහැමි සත්පුරුෂ සමාජයක් නිර්මාණය කරගැනීමේ පරම චේතනාවෙන් ක්‍රියා කරන, සමාජ අසාධාරණත්වය දෙස බලා නිහඬව නොසිටින, පාලක භාරකාරවරුන්ගේ පක්ෂ පාට කිසිවක් නොසිතා, කිවයුක්ත නොපැකිළිව පවසන අප මහනාහිමිපාණන්වහන්සේ උදාර භික්ෂු ජීවිතයක් ගතකරන්නාහ. භික්ෂු ජීවිතයකින් අපේක්ෂා කරන පරිදි ලෞකික ආශාවන්ගෙන් බැහැරව, ශාන්ත වූ ඉඳුරන් ඇතිව, ශීල, සමාධි, ප්‍රඥාදී ගුණයන්ගෙන් පෝෂිතව, නිවන් මග සාක්ෂාත් කරගැනීමෙහි ලා නිතර යොමු වී සිටින්නාහ. තමන් සතු දේ නිර්ලෝභීව දානය කරන අතර, විශේෂයෙන් ස්වකීය විහාර පාර්ශ්වයේත්, සමස්ත ත්‍රෛනිකායික භික්ෂු සමාජයේත්, ගෞරවය, ශාසනික සුරක්ෂිතභාවය හා අභිවර්ධනය රැකගැනීමෙහිලා ඇප කැප වී සිටින ගෞරවණීය මහානායක මාහිමිපාණන්වහන්සේ නමක් වශයෙන් නොපැකිළව හඳුන්වාදිය හැකිය.

පළමුවන රාජසිංහ රජුගෙන් පසු මහත් පරිහානියට පත්වීමෙන් අනතුරුව, ශාසනික හා ධර්ම ශාස්ත්‍රීය පුනරුදය ඇතිකොට, ලක්බුදුසසුන නගාලූ බෝධිසත්ව ගුණෝජ්ජ්‍ය වැලිවිට අසරණ සරණ සරණංකර සඟරජ මාහිපාණන්වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යරත්නය වූ, මල්වතු මහාවිහාරයේ ප්‍රථම මහානායක මහපදවියෙන් හා ඉපැරණි රිදී විහාරයේ අධිපතිත්වයෙන් පිදුම් ලැබූ, අතිගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ඛිතාභිධාන (රා.ව. 1753 - 1773) මහානායක මාහිමිපාණන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ සඟ පරපුරෙන් පැවත එන වර්තමාන මහනුවර උපෝසථ පුෂ්පාරාම විහාරද්වයාධිපති අතිගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන සුත්තාමොපාලි මහා නිකායේ මල්වතුමහාවිහාර පාර්ශ්වයේ විසි හයවන මහානායක මහාස්වාමීන්ද්‍රයන්වහන්සේ, වත්මන් සසුන්කෙත සරුකරන උදාර මහසඟරුවනකි.

'සම්බුදු දහම මැනවින් දැන උගෙන නිහතමානී චාම් සරල භික්ෂු ජීවිතයක් ගතකරන, ස්වකීය පාර්ශ්වයට හා සමස්ත සඟසසුනට ද, දායක කාරකාදීන්ට ද සුභසෙත හා ගෞරවය ඇතිකර දීමට, නොපැකිළිව කටයුතු කරන, නිරහංකාර සංවරශීලී මහතෙරනමක් වශයෙන් කටයුතු කරන අතර, තථාගතයන්වහන්සේගේ පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන ත්‍රිවිධ ශාසනයේ මනා පැවැත්මට සරිලන සේ ශික්ෂාවන්හි හැසිරෙමින් මෙලොව පරලොව උභයාර්ථසාධනය පිණිස පරහිතකාමීව වැඩකිරීම උන්වහන්සේගේ සිරිතයි. සංඝ ගෞරවය කෙළෙසන ආකාරයෙන් තැන නොතැන නොබලා සෑම සියලු දෙයටම අසංවරශීලීව ප්‍රකාශ නිකුත් කිරීම උන්වහන්සේගේ සිරිත නොවේ.

පරාර්ථචර්යාවෙන් හා සුපටිපන්න, උජුපටිපන්නාදී සංඝ ශෝභන ගුණයන්ගෙන් ශෝභිතව, සුපේශල ශික්ෂාකාමීව ස්වකීය සසුන් දිවිය සරු කර ගත් අතිගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන වර්තමාන මහනාහිමිපාණන්වහන්සේ මෙලොව එළිය දුටුවේ රාජ්‍ය වර්ෂ 1944 ක් වූ මැයි මස 30 වන දිනයේදීය. වර්ෂ 1957 ජූනි මස 10 වන දින මල්වතු මහාවිහාරයේ මංගල උපෝසථාගාරයේ දී පැවිදි දිවියට ඇතුළත්ව පියවරෙන් පියවරට ශාසනික පදවි ලැබූ උන්වහන්සේ, පූර්වාකෘත පුණ්‍ය බල මහිමයෙන් මල්වතු මහාවිහාර රාජපූජිත විංශද්වර්ගික කාරක සංඝසභාවේ ඒකඡන්දයෙන් ව්‍යවහාර වර්ෂ 2004 ජූනි මස 20 වන දින මල්වතු මහාවිහාරයේ මංගල උපෝසථාගාරයේ දී උපෝසථ පුෂ්පාරාම විහාරද්වයාධිපති හා මල්වතු මහාවිහාර පාර්ශ්වයේ අතිපූජනීය මහපදවියෙන් පුදනු ලැබ, රාජ්‍ය වර්ෂ 2004 අගෝස්තු මස 16 වන දින ඓතිහාසික මඟුල් මඬුවේ දී මල්වතු මහාවිහාර පාර්ශ්වයේ විසි හයවන මහපදවියට නියමිත ශ්‍රී සන්නස් පත්‍රය ලැබූහ.

කසාවත හා මහපදවිය දැරීමට සාකල්‍යයෙන්ම යෝග්‍ය වූ අප මහනාහිමිපාණන්වහන්සේට සම්බුද්ධ ශාසනයේ හා භික්ෂු සමාජයේ චිරස්ථිතිය, ගෞරවය හා ශාසනික ආරක්ෂාතභාවය තවදුරටත් ඇතිකොට දීමට ත්‍රිවිධ රත්නයේ හා ශ්‍රී දන්ත ධාතූන් වහන්සේගේ ආශිර්වාදයෙන් ආයුරාරෝග්‍ය සම්පත්තිය නොඅඩුව ලැබේවායි දළදා වරුණ ප්‍රාර්ථනා කරයි.

කේ. මිගහකුඹුර

"මරුවාගෙන් පහර ලද්දහුගේ රැකවරණය පිණිස එන අරුවෝත් නැත. මවුපියෝත් නැත. නෑයෝත් නැත. නෑදෑ ආදී කිසිවකුට මහු බේරාගත නොහැක."

සදහම් ප්‍රහේලිකා අංක - 96

ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ග්‍රන්ථයක් තිළිණ කෙරේ... **දුරකථනය - 011-2695773**

උපදෙස් :

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ලිපිනය - සදහම් ප්‍රහේලිකාව (94), 112, දයාවංශ ජයකොඩි පොත් සමාගම, පූජ්‍ය ඇස්. මහින්ද හිමි මාවත, මරදන.
3. පිළිතුරු භාරගන්නා අවසාන දිනය ජූලි මස 10 වෙනිදා බව සලකන්න
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේලිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. ත්‍යාගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.

▶ හරහට

1. දඟැබක නිර්වාණය සංකේතවත් කරන කොටස.
2. ලංකාවේ වැඩ විසූ අවසන් රහතන් වහන්සේ.
6. මෙබඳු ගෝත්‍රිකයන්ද එදා මෙරට වාසය කළ බව කියැවේ.
10. අනුරාධපුර පූජා නගරය පරිශ්‍රයේ නිතර දක්නට ඇති සත්ව කොටසකි.
11. ධන යන වචනයට විරුද්ධ පදය.
14. මෙම කන්නයටද වී ගොවිතැන් කෙරේ.
15. පොහෝ දිනවලදී මෙම සුවඳින් විහාරස්ථාන පිරී යති.

▼ පහළට

3. අලි ඇතුන් බැඳ දමීම සඳහා මේවා උපයෝගී කර ගනේ.
4. මෙය දිය පිපාසය නිවාලයි.
5. බුදු සසුනේ වැඩිම ආයුෂ ගත කළ භික්ෂුව.
7. මිහිදු හිමියන් පිරිනිවන් පෑ ස්ථානය.
8. ලංකාවේ ප්‍රථම වරට පැවිදි වූ රජ අමාත්‍යවරයා.
9. බෞද්ධයන් විසින් මේවා නොකළමැ යුතුය.
12. නාගරික ජනතාවට ජලය බෙදහැරීම සඳහා මේවා උපයෝගී කර ගනේ.
13. තුන්බෑ ජටිලයන් දමනය කිරීම සඳහා බුදුන් උරුවෙල දනව්වට වැඩි පොහොය.



ප්‍රහේළිකා අංක 96
ජයග්‍රාහී වාසනාවන්තයින් නම් ලබන කලාපයේ පළවේ

පල්ලේකැලේ ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමියේ වාර්ෂික සමාජසේවා ව්‍යාපෘතියට සමගාමීව සිදු කරන

දම්සර පොසොන් වැඩසටහන් මාලාව

ශ්‍රී දළදා මාලිගාවේ උසස් අධ්‍යාපන ව්‍යාපෘතියක් වන පල්ලේකැලේ ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමිය බෞද්ධ නායකත්වය පිළිබඳව මෙන්ම බෞද්ධ අධ්‍යාපනය පිළිබඳව විශේෂ උපාධිය හා සාමාන්‍ය උපාධි සහ උපාධි පාඨමාලාවක් මෙන්ම බෞද්ධ උපදේශනය, පරිගණක සහ ඉංග්‍රීසි නවීන භාෂා පිළිබඳ ඩිප්ලෝමා සහතික පත්‍ර පාඨමාලාවන් ගණනාවක් ප්‍රදානය කරනු ලබන්නා වූ උසස් අධ්‍යාපන ආයතනයකි.

අප ආයතනය මගින් වාර්ෂිකව සමාජ සේවා ව්‍යාපෘතියක් පොසොන් පොහෝ දිනට සමගාමීව සිදු කරන අතර මෙවර එය ජූලි මස 3 වන දින පෙ.ව. 8 සිට ප.ව. 4 දක්වා SIBA ආයතන පරිශ්‍රයේදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. එදින සිදු කිරීමට නියමිත වැඩසටහන් වන්නේ,

පූර්ව විවාහ උපදේශන වැඩමුළුව, බෞද්ධ මනෝවිද්‍යා උපදේශන වැඩසටහන්, ලේ දන්දීමේ වැඩසටහන, ආයුර්වේද වෛද්‍ය සායනය, ඇස් දන්දීමේ වැඩසටහන, උදෑසන කිරිබත් දන්සල, උදෑසන මල් දන්සල.

මෙම ව්‍යාපෘතිය මගින් එක් දින පූර්ව විවාහ උපදේශන වැඩමුළුවක් පවත්වන අතර එයට සහභාගි වන තරුණ තරුණියන් සඳහා වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කරනු ලැබේ. මේ සඳහා ඕනෑම අයකුට එදිනට පැමිණ සහභාගි විය හැකිය.

"නිතර අනුන්ගේ දෙස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙත්. ඔහු රහත් ඵලයෙන් ඈත්ය."

30

බුද්ධ ධර්මයෙන් හෙළිවන නව චින්තනය



ගතවර්ෂ ගණනාවක් මුළුල්ලේ වර්ධනය වෙමින් පැවති භාරතීය ආගමික දර්ශනය තුළ පවත්නා නව්‍ය ස්වරූපය කුමක්ද යන්න විමසා බැලීම මෙම ලිපියෙහි අරමුණයි. ලෝකයේ කවර හෝ රටක ආගමක් හෝ සංස්කෘතියක් හෝ ආයතනයක් හෝ පහළවනුයේ සමකාලීන සාමාජික අවශ්‍යතාවයන් මුල්කොටගෙනයි. සාමාජික අවශ්‍යතාවයන්ගෙන් තොරව ඉදිරිපත් කරනු ලබන ආගම හෝ සංස්කෘතිය හෝ සමාජ ආයතන සමාජ ප්‍රගමනයට හේතු නොවේ. එසේම එකී සමාජයේ පිළිගැණීමට හා විශ්වාසයට ද පාත්‍ර නොවේ. බුදුරදුන් දඹදිව පහළවූ කාලය ආගමික මතවාද රැසක් ක්‍රියාත්මක වෙමින් පැවති අවධියකි.

ඒ නිසා බුදුදහමේ ප්‍රභවය යුගකාරක සිද්ධියක් හෙවත් අභිනව යුගයක උදාවක් වශයෙන් හඳුන්වා දිය හැක. සුළු කාලයක් තුළ සෙසු ආගම් මැඩගෙන බුදුදහම භාරතීයන් අතර ව්‍යාප්ත වී ගියේ එහි පැවති නව චින්තනය නිසාය. බුදුන් වහන්සේ බ්‍රාහ්මණ ආගම විසින් ඉදිරිපත් කර තිබූ ඇතැම් ආගමික ඉගැන්වීම් කෙලින්ම ප්‍රතික්ෂේප නොකොට බෞද්ධ ආකල්ප මිශ්‍රකොට ඉදිරිපත් කිරීම නිසා ක්‍රමයෙන් එම ඉගැන්වීම් ජනතාව අතර පැතිරවීමට හැකිවිය. මේ වන විට සමාජයේ පැවති බහු දේවාවාදී සංකල්පය ඒ සඳහා එක් නිදසුනක් වශයෙන් දැක්විය හැක. කොටින්ම පැරණි මත නව ආකල්පයට ගන්වා ඉදිරිපත් කිරීම බෞද්ධ චින්තනයේ විශේෂ ලක්ෂණයක් ලෙස දැක්විය හැකිය. උන්වහන්සේ බහු දේවවාදී සංකල්ප සම්පූර්ණයෙන්ම බැහැර කර නැත.

බුදුන් වහන්සේ දිව්‍ය ලෝක නැති බව කොතනක හෝ සඳහන් කර නැත. සංයුක්ත නිකායේ දේවතා සංයුක්තයට අනුව දිව්‍ය ලෝක මෙන්ම දෙවිවරු ද සිටින බව බුදුරදුන් පිළිගත් බව පෙනේ. එහෙත් ඒ දෙවිවරු, බුදුවරු හෝ රහතන්වහන්සේ හා සමාන වී නොමැත. බෞද්ධ දේව සංකල්පය විස්තර වන මූලාශ්‍ර අතර ධජග්ග සූත්‍රය, මහාසමය සූත්‍රය සහ ආටානාටිය යන සූත්‍ර ප්‍රධානය. මේ සෑම තැනකම සඳහන් වන දෙවිවරුන්ගෙන් ආරක්ෂාවක් හෝ විමුක්තියක් නො ලැබිය හැකි බව පජාපති, ඊසාන යන දෙවිවරුන්ගෙන් පමණක් නොව දෙවියන්ගේ ප්‍රධානියා වශයෙන් සැලකෙන ශක්‍රයාටවත් මිනිසුන්ට ආරක්ෂාවක් ලබාගත නොහැකි බව පෙන්වා දෙයි. " සකෙකා භික්ඛවේ අවිතරාගො, අවිතදොසො, අවිත මොහො" කෙලෙස් ප්‍රහීන නොකළ ශක්‍රයා පවා බිය වන තැති ගන්නා සුළු පුද්ගලයකු නම්, එබඳු පුද්ගලයකු සිහිපත් කිරීමෙන් කෙසේ නම් ආරක්ෂාවක් ලබාගත හැකි දැයි පෙන්වා දී ඇත.

නමුත් බුදුන් වහන්සේ වෛදික දේව සංකල්පය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප නොකොට එය වෙනත් ආකාරයකින් සමාජයේ සදාචාරාත්මක වර්ධනය මෙන්ම සදාචාර ධර්ම පෝෂණය කිරීමට ඉවහල් කරගෙන ඇති ආකාරය ශක්‍රයා සහ මාතලී දිව්‍ය පුත්‍රයා අතර ඇති වූ සංවාදයෙන් දක්නට ලැබේ. මෙහි දැක්වෙන පරිදි ශක්‍රයා ගුණ ධර්ම ගරුක මිනිසුන්ට නමස්කාර කරයි. මේ සිද්ධිය මිනිසුන් සදාචාර මාර්ගයට අවතීර්ණ වීමට හේතුවක් වේ. මගමානවක ජාතකයේ සඳහන් වන පරිදි ශක්‍රයා ශක්‍ර ආත්මභාවය ලබාගත්තේ මිනිසෙකු වශයෙන් මිනිස්ලොව ජීවත් වූ අවදියේ දන්, සිල්, බවුන් වැඩීම, මව්පියන්ට හා වැඩිහිටියන්ට ගරුකිරීම, ලිං, මංමාවත් සහ පොකුණු තැනීම වැනි පුණ්‍ය ක්‍රියාවන්හි නිරත වීමෙනි. ධම්මපද පාලියේ සඳහන් වන "සචචං භනෙ නකුජෙජයවි...." යන ගාථාවෙන් පෙන්වා දී ඇත්තේ සත්‍ය වචන කථා කිරීම, නොකිපීම සහ පරිත්‍යාගශීලීත්වය යන ගුණ ධර්ම වැඩීමෙන් කෙනෙකුට දෙව්ලොව ඉපදිය හැකි බවයි. මෙසේ දේවත්වය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් නිරායාසයෙන්ම මිනිසුන් පාපයෙන් වැලකී පිං කිරීමට යොමුවේ. එම නිසා පැවති ආගමික සංකල්පයන් බැහැර නොකොට එය මිනිස් සමාජයේ අමුතුම

''යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇළුණේද, ඒ ගෝතම ශ්‍රාවකයෝ හැමදෑම සුවසේ නිදූ, පුබුදිත්.''

ආකාරයකින් ගුණ ධර්ම පෝෂණය සඳහා යොදා ගැනීමට බුදුන් වහන්සේ ඉදිරිපත් කළ දර්ශනය නවක ආගමික චින්තනයක් වශයෙන් හැඳින්විය හැක.

මෙසේම අනිශ්වරවාදී සංකල්පය ද බුදුන් ඉදිරිපත් කළ නව ආගමික සංකල්පයක් වශයෙන් හඳුන්වා දිය හැකිය. මෙමගින් බුදුන් වහන්සේ උගන්වා ඇත්තේ මිනිසාගේ ස්වාමිත්වයයි. එකල බ්‍රාහ්මණ සංස්කෘතියේ පැවති ඊශ්වරවාදී සංකල්පය අනුව විශ්වය සහ සත්වයා නිර්මාණය කරන ලද්දේ සර්බලධාරී දෙවි කෙනෙකුන් විසිනි. සෘග් වේදයේ දහවෙනි මණ්ඩලේ අනූවෙනි පුරිස සූත්තයේ ප්‍රථම වරට මේ ඊශ්වරවාදී සංකල්පය ඉදිරිපත් කර ඇත. මෙහි දැක්වෙන පරිදි ප්‍රථමයෙන් ලෝකය මැවූ දෙවියන් අනතුරුව ඔහුගේ එක් එක් ශරීර අවයවයන්ගෙන් මිනිස් සමාජයේ කුල හතරක් නිර්මාණය කර ඔවුන්ට හිමි ජීවින වෘතීන් පවා පෙන්වා දී ඇත. ලෝකයේ පැවැත්ම සිදුවන්නේත් සත්වයාගේ අභිවෘද්ධිය පරිහානිය පමණක් නොව ඔහුගේ පාරලෞඛික මෝක්ෂය සැලසෙන්නේ ද ඔහුගේ කැමැත්ත අනුවයි.

එහෙත් මේ ඊශ්වරවාදී නිර්මාණ සංකල්පය බුදුදහමින් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප වේ. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයෙන් බුදුන් වහන්සේ පෙන්වා දී ඇත්තේ ලෝකය හෝ සත්වයා සර්බලධාරී දෙවියකුගේ නිර්මාණයක් නොවන බවයි. ඒ අනුව හේතු ඵල වාදය මුල්කරගෙන ලෝකයත්, සත්වයාත් සත්වයින්ගේ ප්‍රබෝධයත් ඇතිවූ ආකාරය පෙන්වා දී ඇත. මජ්ඣිම නිකායේ අස්සලායන සූත්‍රයට අනුව මිනිසා මවන ලද්දේ දෙවියන් විසින් නොවේ. ඒ අනුව සත්වයාගේ ප්‍රභවයට හේතු වී ඇත්තේ මව සෘතු ගැනීම, මව්පිය දෙපලගේ එකතුව සහ ගන්ධම්භ නමින් හැඳින්වෙන උත්පත්තිය අපේක්ෂා කරන පුද්ගලයාගේ පැමිණීම යන කරුණු තුන සම්පූර්ණ වීමෙනි. ඒ හැර දෙවියකු විසින් මවන ලද බවක් ගැන සඳහන් නොවේ. මජ්ඣිම නිකායේ රට්ඨපාල සූත්‍රයේ සඳහන් වන "අත්තානෝ ලෝකෝ අනිහිස්සරෝ" යන්නෙන් පෙන්වා දී ඇත්තේ ද බ්‍රාහ්මණයන් පෙන්වා දී ඇති පරිදි ලෝකය දෙවියන් විසින් නිර්මාණය කරන ලද්දක් නොවන බවයි. අංගුත්තර නිකායේ තිත්ථායතන සූත්‍රයේ දී මෙය ඊස්වර නිර්මාණ වාද යනුවෙන් මිත්‍යා දෘෂ්ටියක් ලෙස හඳුන්වා දී ඇත.

බුදුන් වහන්සේ ඊශ්වර නිර්මාණ වාදය මිත්‍යා දෘෂ්ඨියක් වශයෙන් බැහැර කළේ එය පුද්ගලයාගේ සහ සමාජයේ පරිහානියට හේතුවන බවයි. දෙවියන්ගේ කැමැත්ත අනුව සියල්ල සිදුවෙතැයි විශ්වාස කරන පුද්ගලයා නිෂ්ක්‍රීය රූකඩයක තත්ත්වයට පත්වේ. ඔහු තුළ ඇතිවන එම අනුත්සුඛ භාවය ඔහුගේ ලෞඛික සහ පාරලෞඛික ජීවිතය පරිහානියට පත්වේ, අනිත් අතින් එය සාමූහික වශයෙන් සමාජ සදාචාරයට බාධාවක් වේ. ඊශ්වර නිර්මාණවාදී සංකල්පය පිළිගන්නා, තමන් අතින් සිදුවෙන සෑම වැරදි ක්‍රියාවක්ම ස්වෙච්ඡාව නිසා නොව ඊශ්වර ඉච්ඡාව අනුව සිදුවන බව සලකයි. ඒ නිසා ඔහු ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිත්‍යාචාර සහ මසාවාද ආදී පස්කම් දස අකුසල් වැලකීමට උත්සාහ නොගනියි. එහි ප්‍රතිඵලය වන්නේ සමාජයේ මිනීමැරීම, සොරකම් ආදී දුරාචාර ධර්ම පැතිර යාමයි. ඒ නිසා මේ ඉගැන්වීම පුද්ගලගත පරිහානිය මෙන්ම සමාජගත පරිහානියට හේතු වෙතැයි පෙන්වා දුන් බුදුන් වහන්සේ මිනිසාගේ ස්වාධීනතාවය අවධාරණය කර ඇත.

මේ අනුව බුදුන් වහන්සේ තවත් අවස්ථාවක විභජ්ජවාදී න්‍යාය ඉවහල් කර ගන්නේ සත්ව පුද්ගල ආත්ම සංකල්පය බන්ධනය කිරීම සඳහාය. සංයුත්ත නිකායේ බන්ධන සංයුක්තය අනුව සත්වයා යනු ස්කන්ධ පංචකයේ එකතුවයි. බුද්ධ දේශනාවට අනුව ලෝකයේ මූලික පදාර්ථ හතරක් ඇත. එනම් පඨවි, ආපෝ, තේජෝ, වායෝ යනුවෙනි. මේ චතුර් භෞතික පදාර්ථ පදනම් කරගෙන රූප, වේදනා, සංඥා සංකාර, විඤ්ඤාන යන ස්කන්ධ පංචකය ගොඩනැඟී ඇත. මේ එක් එක් ස්කන්ධයක ස්වභාවය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණයට ගොදුරු වේ නම් එබඳු ශරීරයක් තුළ සදාකාලික ආත්මයක් නොතිබිය හැක. සංයුක්ත නිකායේ භික්ඛුණී සංයුක්තයේ සඳහන් වන "සතෙතා සතෙතාති පවෙචසි, කිනනු දිටඨිගතනනු තෙ....." යන දේශනාවෙන් පෙන්වා දී ඇත්තේ සත්ව නාමෙන් ගැනෙන පුද්ගලයකු ඇතැයි විශ්වාස කිරීම තනිකර මිථ්‍යා දෘෂ්ඨියකි. සත්වයා යනු සංස්කාර පිඩක් පමණි. නාගසේන හිමියන් විසින් මිලින්ද ප්‍රශ්නයේ දී මිලිඳු රජුට දේශනා කළ "යථාහි අංග සම්භාර හොති සදෙදා රථෝ ඉති....." යන්නෙන් පෙන්වා දී ඇත්තේ ද ඒ ඒ අංගෝපාංග එක් වීමෙන් රථ යන ප්‍රඥප්තිය



ඇතිවන්නාක් මෙන් රූපාදී ස්කන්ධ පංචකයේ එකතුව ඇති කල්හි පමණක් සත්වයා පුද්ගලයා යන පැනවීම ඇතිවන බවයි. මේ අයුරින් ත්‍රිලක්ෂණ සිද්ධාන්තය අනුව ස්කන්ධ පංචකය විශ්ලේෂණ කර බලන කල්හි සදාකාලික ආත්මයක් නැති බව පෙන්වා දී ඇත. මජ්ඣිම නිකායේ අලගද්දූපම සූත්‍රයේ දී ද මෙම විභජ්ජවාදී න්‍යාය ඇසුරු කරගෙන සත්වයා තුළ සදාකාලික ආත්මයක් නැති බව බුදුන් විසින් පෙන්වා දී ඇත. මේ අනුව පටිච්ච සමුප්පන්න ධර්මතාවය අනුව සත්වයාගේ සහ ලෝකයේ පැවැත්ම සහ විනාශය සිදුවන බව පෙන්වා දී ඇත. බුදුන් වහන්සේ මේ පටිච්ච සමුප්පන්න ධර්මතාවය ඉවහල් කර ගත්තේ සත්වයාගේ සංතානගත දුක විග්‍රහ කිරීමට පමණක් නොවේ. මීට පෙර සිට කිසිම දාර්ශනිකයෙක් විසින් මෙවැනි හේතු ඵල වාදී දර්ශනයක් ඉදිරිපත් කර නැති නිසා සාපේක්ෂ සිද්ධාන්තය පදනම් කරගත් පටිච්ච සමුප්පාදය බුදුන් විසින් ඉදිරිපත් කළ නවක ආගමික චින්තනයක් වශයෙන් හඳුන්වා දිය හැකිය.

ශාස්ත්‍රවේදී පූජ්‍ය තිබ්බටුවාවේ සිද්ධත්ථ හිමි

පණ්ඩිත උරුලෑවත්තේ ධම්මරක්ඛිත නාහිමියෝ මහියංගන රජමහා විහාරාධිපති පදවියෙන් පිදුම් ලබති



මහනුවර අස්ගිරිය මහා විහාරයීය විංශත් වර්ගික කාරක මහා සංඝ සභාවේ ජ්‍යෙෂ්ඨ කාරක සභික අස්ගිරි මහා විහාරයීය උරුලෑවත්ත පන්සල, අලව්ව හුම්බුළුව රජමහ විහාරය, මාතලේ යටවත්ත උරුලෑවත්ත පන්සල පුරාණ විහාරය, ගිරාඳුරුකෝට්ටේ ගින්නෝරුව ශ්‍රී විජයසුන්දරාරාමය යන සිව් මහා විහාරයන්හි අධිපති ඓතිහාසික මහියංගන රජමහ විහාරයේ භාරකාර, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාසල් අධ්‍යාපන අංශයේ විශ්‍රාමික ආචාර්ය පණ්ඩිත උරුලෑවත්තේ ධම්මසිද්ධි ශ්‍රී අත්ථදස්සි ධම්මරක්ඛිත නාහිමියෝ ඓතිහාසික මහියංගන රජමහා විහාරාධිපති පදවියට අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අතිපූජ්‍ය මහානායක බදුළු මුතියංගන රජමහ විහාරාධිපති වරකාගොඩ ශ්‍රී ඤාණරතන මාහිමි ප්‍රමුඛ සාතුනායක කාරක මහා සංඝ සභාව විසින් පත්කර ඇත.

ධම්මසිද්ධි ශ්‍රී අත්ථදස්සි යන ගෞරව නාමය සහිතව මහියංගන රජමහ විහාරාධිපති පදවියට පත්කරනු ලැබූ පණ්ඩිත උරුලෑවත්තේ ධම්මරක්ඛිත නාහිමියෝ සිය විහාරාධිපති පදවිය පිළිබඳ ශ්‍රී සන්නස් පත්‍රය අස්ගිරිය මහා විහාර මංගල උපෝසථාගාරයේදී පවත්වන ලද සංඝ සභා රැස්වීමේදී අස්ගිරිය පාර්ශ්වයේ මහානායක වරකාගොඩ ශ්‍රී ඤාණරතන මාහිමියන් වෙතින් ලබාගත්හ.

අපවත් වී වදළ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ මහානායක ගලගම ශ්‍රී අත්ථදස්සි මාහිමිගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය රත්නය වන ධම්මරක්ඛිත නාහිමියෝ මහියංගන සිද්ධස්ථානයේ වක්මන් ශාසනික හා ආගමික දියුණුව වෙනුවෙන් විශාල ශාසනික සේවාවක් සමගම මහියංගන ප්‍රදේශයේ විහාරස්ථාන මූල්කරගෙන ආගමික හා සමාජ සංවර්ධන පොදු සත්කාර සේවාවන් ගණනාවක් සිදුකර ඇත.

ශ්‍රී සන්නස් පත්‍ර ප්‍රදනෝත්සවයට ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දෑල මහතා ප්‍රධාන මහනුවර සිව් මහ දේවාල බාර නායක නිලමේවරුන් ඇතුළු ගිහි පැවිදි පිරිසක් සහභාගි වූහ.

කේ. ඛණ්ඩාරනායක

බොදු පුවත්

පූජාපිටිය ශ්‍රී පූර්වාරාමයේ 91 වැනි පොසොන් පෙරහර මෙවරත් මහ ඉහළින්

පූජාපිටිය පලිපාන ශ්‍රී පූර්වාරාමයේ 91 වැනි පොසොන් මහා පෙරහර ජූනි 19 වැනිදට යෙදෙන පොසොන් පෝදා පැවැත්වේ. මෙදින විහාර මළුවෙන් සවස දෙකට පිටත් වන පෙරහර පූජාපිටිය වීදි සංචාරය කර සවස විහාර මළුවෙන් ගෙවදී.

පොසොන් පොහොය නිමිති කොට කීර්ති ශ්‍රී රාජසිංහ පොත්ගුල් විහාරයේ ආගමික වැඩසටහන් මාලාවක්

මහනුවර අනගාරික ධර්මපාල මාවතේ කීර්ති ශ්‍රී රාජසිංහ පොත්ගුල් විහාරයේ පොසොන් වැඩසටහන උදේ 6.30 ට විහාරාධිපති ශාස්ත්‍රපති යටිනුවර සුමන නාහිමි විසින් සැදැහැවතුන් ශීල සමාදානයෙහි පිහිටුවීමෙන් ආරම්භ කෙරේ.

අකුරටිබොඩ ධම්මවිලාසී යෝගාවචර, දිවුලන්කඩවල සීලානන්ද, උඩුරාවණ නාලක, දුල්වල රතනසාර, අලුත්ගම පඤ්ඤාසාර යන හිමිවරුන්ගේ ධර්ම දේශනා ඇතුළත් වන අතර යෝජිත සංඝාරාමය පිළිබඳව මෙහිදී දායකයන් අතර සාකච්ඡාවක්ද සුමන නාහිමිගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

කේ. ඛණ්ඩාරනායක

මහනුවර ශ්‍රී පුෂ්පදාන සමිතියේ පොසොන් මහා පෙරහර ජූනි 19 වැනිදා

මහනුවර ශ්‍රී පුෂ්පදන සමිතියේ වාර්ෂික පොසොන් මහා පෙරහර ජූනි 19 වැනිදට යෙදෙන පොසොන් පුර පසළොස්වක පෝය දින පැවැත්වේ. මිහිඳු මාහිමිගේ ප්‍රතිමාව වැඩමවා ගත් පෙරහර මෙදින උදේ 8.30 ට සමිති මූලස්ථානයෙන් පිටත් වී මහනුවර සතර මහා වීදිවල සංචාරය කෙරේ.

මෙවරද පුෂ්පදන සමිතියේ පොසොන් මහා පෙරහර වෙනුවෙන් වෙනත් අවුරුදු මෙන් ශ්‍රී දළදා මාලිගාවේ සංස්කෘතික අංශවල සහය ලබාදෙන බව ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දෑල මහතා සමග කරන ලද සාකච්ඡාවකින් ප්‍රකාශ කළ බව සමිතියේ ප්‍රධාන සභාපති වෝල්ටර් රණසිංහ මහතා පැවැසීය.

මෙදිනම පොසොන් පෝය වැඩසටහනට සමගාමීව ප්‍රදේශයේ දිළිඳු පවුල් සියයකට වියළි ආහාර ද්‍රව්‍ය පාර්සල් බෙදා දීමටද සමිතිය කටයුතු යොදා ඇත.

''ද්වේශ රහිත වූ යමෙක් බැණීම් ගැහීම් හා වධ බන්ධනත් ඉවසා ද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් ඔහු උත්තමයෙකි.''



මොකක්ද මේ සැකය?

අනවශ්‍ය හෝ නිෂ්ප්‍රයෝජන දෙයක් ළඟ තබාගැනීම හිරිහැරයකි. එනිසාම එවැනි දේ බැහැර කිරීමට අපි හුරුවී සිටිමු. භෞතික වස්තූන් පිළිබඳ මෙය අනුගමනය කළත් බොහෝ දෙනකු නොදන්නා කරුණ නම් අපි හැම කෙනකුගේම සිත්වලත් එවැනි අනවශ්‍ය, නිෂ්ප්‍රයෝජන දෑ තිබෙන බවයි. බුද්ධ දේශනාව පැහැදිලි කරන ක්‍රමයට අප හැමදෙනාගේම සිත්වල අවශ්‍ය හා අනවශ්‍ය යන දෙආකාර සිතිවිලි උපදී. ඒවා වෙන්කර හඳුනා ගත හැක්කේ ප්‍රත්‍යවේක්ෂණය හෙවත් සිතිවිල්ලක් ඇතිවූ විට ඒ සිතිවිල්ල දෙස නුවණින් විමසා බලන්නෙකුට පමණි.

සිත කිලිටි කරන, අපිරිසිදු කරන සිතිවිලි කොලෙස් යනුවෙන් දහමෙහි සඳහන් වෙයි. ඒ අතරින් ඉතා භයානක සිතිවිලි පහක් නීවරණ යනුවෙන් දක්වෙයි. ඒවා කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීන මිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා යනුවෙන් උගන්වයි. මේ අතරින් විචිකිච්ඡා යනුවෙන් දක්වෙන්නේ සැකයයි. අට්ඨ කතාව සැකය පිළිබඳ ඉදිරිපත් කළ අර්ථ දැක්වීම් දෙකක් මෙහිලා දක්වමි. 'සභාවං විචිනන්තෝ තාය කිච්චති කිලමතීති විචිකිච්ඡා'. යමක නියම ධර්ම ස්වභාවයක් සොයාගැනීම සඳහා, සංකා සහිත දැනිකර ගනු ලබන සිතිවිල්ල සැකය නම් වන බව, අට්ඨ කතාවේ අර්ථ දැක්වීමයි.



සැකය ප්‍රභේද වශයෙන් අවස්ථා අටක් හැටියට අභිධර්මයේ දැක්වෙන අතර, සබ්බාසව සූත්‍රයේ 16 ආකාර වශයෙන් දැක්වෙයි. ශාස්තෘවරයා පිළිබඳ ඇතිකරගනු ලබන සැකය, ධර්මය පිළිබඳ ඇති සැකය, සංඝයා පිළිබඳ ඇති සැකය, ශික්ෂා පිළිබඳ සැකය, අතීත භවය හා අනාගත භවය පිළිබඳ සැකය, අතීතානාගත භව පිළිබඳ සැකය හා හේතුඵල ධර්මය පිළිබඳ සැකය යන මේ අවස්ථා පිළිබඳ ඇතිකර ගනු ලබන සැක සහිත බව බුද්ධාදී අටතැන උපදින සැකය ලෙස දහමෙහි සඳහන් වෙයි. මේ අවස්ථාවන්හි කෙනකු තුළ සැකය පහළ වන්නේ කෙසේදැයි විමසා බැලීම වැදගත් යැයි සිතමි. තථාගතයන් වහන්සේ සියල්ල දක්නා නුවණක් ඇති සර්වඥය, එමෙන්ම දෙතිසක් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් හා අනු ව්‍යංජන ලක්ෂණ අසූවකින් සමන්විත යැයි කියති. මෙවැනි අසිරිමත් ලක්ෂණ ඇති මිනිසුන් පහළ විය හැකිදැයි කෙනකුට සැක ඇතිකළ හැක. එය ශාස්තෘන් වහන්සේ පිළිබඳ සැක කිරීමයි. දහමෙන් කියවෙන්නේ කෙලෙස් තවන නිවන් මගයි. කෙලෙස් නැති කරන තැනැත්තා ක්‍රමයෙන් සෝවාන් ආදී මාර්ග හා ඵල පිළිවෙළින් ලබයි. ඒ තුළින් සියලු දුක් නැතිකර දමන බව කියවෙයි. මේ ලොව්තුරා දහමෙහි ඇති විශේෂතාවයි. මෙය ඇත්තක්ද? එලෙස කෙලෙස් සංසිඳවාලීමට හැකියාවක් ඇද්ද? ආදි වශයෙන් සැක ඇතිකළ හැක. ඒ දහම පිළිබඳ උපදනා සැකයයි. සතර මාර්ගඵල ලාභී සඟුන් සිටිය හැකිද? ඔවුන් සුපටිපන්නාදී ගුණවලින් සමන්විතද? දන් දීමාදියෙන් පින් සිදුකරගත හැකිද? ආදි වශයෙන් ඇති කර ගනු ලබන සැකය තෙවැන්නයි. සීල, සමාධි, ප්‍රඥා යන කරුණු දහමෙහි දක්වෙන්නේ ශික්ෂණ ධර්ම වශයෙනුයි, පුද්ගලයකු ශික්ෂණයට පත්කරනු ලබන බැවින් ඒ නම භාවිත කෙරේ. එකී ශික්ෂණ ධර්ම අනුගමනය කිරීමෙන්, ශික්ෂණයට පත්විය හැකිදැයි ඇති කරගනු ලබන සැකය, සික්ඛාය' කංඛති යනුවෙන් දක්වෙයි. අතීතයේ මා විසුවේද? නොඋඩවා එන භව ගමනක් ඇද්ද? එසේ නොවේද? ආදී වශයෙන් අතීත භවය පිළිබඳ ඇතිවන සැකය ''පුබ්බන්තේ කංඛති'' යනුවෙන් දක්වෙයි. එසේම මරණින් පසු ජීවිතය පිළිබඳ ඇතැමුන්ට සැක මතුවිය හැක. මරණින් පසු නැවත භවගාමී ජීවිතයකට හිමිකමක් තිබේද? නැද්ද? ආදි වශයෙන් ඒ පිළිබඳ සැක මතු කෙරේ. ඇතැමුන්ට මෙලෙස අතීත හෝ අනාගත භව පරපුරක් තිබේදැයි සැකයක් මතුවීමටද පුළුවන. බුද්ධ කාලයේදීද එවැනි සැක මතු කළ අවස්ථා පිළිබඳ සූත්‍ර දේශනාවලද සඳහන් වෙයි. අතීත හා අනාගත භවයන් පිළිබඳ ඇති කරගනු ලබන සැකය ''පුබ්බාපරන්තේ කංඛති'' යනුවෙන් දක්වෙයි. සත්වයාගේ උපත හේතුඵලසමවායක ප්‍රතිඵලයක් යැයි ඉදිරිපත් වූ බෞද්ධ මතය පිළිබඳවද බොහෝ දෙනා තුළ සැක මතුවිය. විශේෂයෙන් නිර්මාණවාදී සංකල්ප සමාජගතව තිබුණු අවධියක හේතුඵලවාදී ඉගැන්වීම දෙස සැකයෙන් බැලීම පුදුමයට කරුණක්ද නොවේ. පටිච්ච සමුප්පාද දහම පිළිබඳ සැකය, ඉදප්පච්චයතා පටිච්ච සමුප්පන්නේසු ධම්මෙසු කංඛති යනුවෙන් දහමෙහි සඳහන් වෙයි.

සැකය නම් සිතිවිල්ලකි. යමක් හෝ යමෙක් පිළිබඳ නිශ්චිත වැටහීමක්, අවබෝධයක් නැති විටෙක උපදින්නේ සැකයයි. බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම පිළිබඳ සැකයෙන් උන්වහන්සේ වෙත ආ බමුණන්, නිගණ්ඨයින් වැනි අය තථාගත දේශනාව අවසානයේදී, 'යටිකුරු කරන ලද්දක් උඩුකුරු කළා සේ, වසා තුබූ දෙයක් විවර කළ දක්වූවාසේ, මංමුලා වූවකුට මග කියා දුන්නා සේ, අඳුරෙහි සිටියකුට පහනක් දැල්වූවා සේ ඔබවහන්සේගේ පැහැදිලි කිරීම වැටහුණේ යැයි කරන ලද ප්‍රතිචාර දැක්වීමෙන් පෙනෙන්නේ දේශනාව අවසන සැකය තුරන් වූ බවයි. අවශ්‍ය තැනදී සැක කිරීම ප්‍රයෝජනවත් බව දහම පිළිගනී. ඒ බව කාලාම සූත්‍රයෙන් පැහැදිලි වෙයි. භේසකලා

"කෝපයෙන් මත් වූ තැනැත්තා උමතු අශ්වයෙකු පිට නැඟී යන්නෙකු වැනිය"



මිනිස් ජීවිතය විවරණය කරන සූත්‍ර දේශනා

වනයට වැඩම කළ බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණි කාලාම වැසියෝ තම ගමට පැමිණෙන ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් එකම දේ පිළිබඳ විවිධ මත පළකළ බැවින්, ඒ පිළිබඳව ඔවුන් තුළ සැක මතුවී ඇති බව පවසති. බුදුරදුන් ඔවුන් සැක කළ යුතු තැන සැක කර ඇති බව වදාරති. එයින් ගම්‍ය වන්නේ ස්ථානයේ එනම්, අවශ්‍ය තැනදී සැක කිරීම කළ යුතු බවයි. යම් යම් අවස්ථාවන්වලදී සැකය පදනම් කරගෙන පුද්ගලයන් පරීක්ෂා කිරීමටද ලක් කෙරේ. ඊටද දිගු ඉතිහාසයක් තිබෙන බව පෙනෙයි. ජාතක පොතේ එන සීලවිමංස, පුචමන්ද හා කෝටිසිම්බලි වැනි ජාතක කතා තුළින් එය තහවුරු වෙයි. කොසොල් රජුගෙන් යැපෙන එක් උපාසකයෙකි, ඔහු වේදයේ පරතෙරට ගිය අයෙකි. නිති පන්සිල් රකියි. ඔහුගේ ගුණවත්කම නිසාම රජු ඔහුට විශේෂ සැලකිල්ලක් දක්වයි. රජතුමා තමා කෙරෙහි දක්වන විශේෂතාව තමාගේ කුලයටද නැතිනම් ගුණයටදැයි සැක ඇතිකර ගත් උපාසකතුමා, මෙය සැක හැර නිශ්චය කරගැනීමට උපායක් යෙදීය. එනම් රජුගේ රන්කම් කරන තැනින් දිනක් එක් රන් කහවනුවක් හොරකම් කළේය. එය රන්කම් කරන්නා දුටුවත්, උපාසකතුමාට රජතුමා විශේෂයෙන් සලකන නිසා නොදුටු ලෙසින් සිටියේය. දෙවෙනි දින කහවනු දෙකක්ද, තෙවෙනි දින තුනක්ද සොරකම් කළ බැවින්, රන්කරුවා විසින් ඔහුව අල්ලා රජු වෙත ඉදිරිපත් කළේය. උපාසකතුමාගේ හොරකම පිළිබඳ පුවත අසා පුදුමයට පත් රජතුමා උපාසකගෙන් කරුණු විමසීය. උපාසකතුමාගේ පිළිතුර වූයේ, තමාට සලකන්නේ ගුණයටද, නැතිනම් කුලයටදැයි පිරික්සීමට තමන්ට වුවමනා කළ බවයි. මේ සීලවිමංස ජාතකයේ එන පුවතයි. එයින් පැහැදිලි වන්නේ ස්ථානයේ සැකය ප්‍රයෝජනවත් බවත්, අස්ථානයේ සැක කිරීම නිෂ්ප්‍රයෝජන බවත්ය.

මෙරට ත්‍රස්තවාදී උවදුර පැවැති කාලවකවානුව තුළ යම් යම් ස්ථාන, පුද්ගලයන් හා භාණ්ඩ පිළිබඳ සැකයෙන් බලා කටයුතු කිරීම නිසා, බොහෝ විනාශකාරී අවස්ථාවන් මගහරවා ගැනීමටද හැකිවූ බව අපි දනිමු. අපරාධ කොට සැඟවී සිටින බොහොමයක් අපරාධකරුවන් නීතියේ රැහැනට හසුකර ගැනීමට හැකිවී ඇත්තේද ඔවුනගේ හැසිරීම් සැකයෙන් යුතුව නිරීක්ෂණය කිරීමේ ප්‍රතිඵල වශයෙනි. අවාසනාව නම් අවශ්‍ය අනවශ්‍ය හැම විටකමත්, යෝග්‍ය අයෝග්‍ය හැම අවස්ථාවකමත් සැකයෙන් යුතුව බැලීමට යාම නිසා, බොහෝ පවුල් තුළ අවුල් සහගත ස්වභාවයක් ඇතිවීමයි. එසේ නොකර අවශ්‍ය තැනදී, අවශ්‍ය පරිදි, අවශ්‍ය ආකාරයට සැක කිරීමට හැකි නම් එයින් යහපතක් මිස අයහපතක් සිදු නොවේ.

පූජ්‍ය නෙළුවාකන්දේ ඤාණානන්ද හිමි

1. මිල මුදල්, ධනය හොඳින්, නුවණින් පරිහරණය කළ යුතුයි. එය තමන්ගේත්, අනුන්ගේත් යහපතට යෙදිය යුතුයි. තමන් හොඳින් උපයා ගත් ධනය මෙලෙස තමන්ගේ හා අන්‍යයන්ගේ යහපත සඳහා යෙදිය යුතු ආකාරය අංගුත්තර නිකායේ පත්කම්ම සූත්‍රයේ මනාව පැහැදිලි කර ඇත. ඒ මෙසේය. තමාව සුවපත් කිරීම, මව්පියන් පෝෂණය කිරීම, අඹු දරුවන්ද, සිදසුන් කම්කරුවන් පෝෂණය කිරීම, යහළු මිතුරන්ට පිහිටවීම, ධනය මනා ලෙස ආරක්ෂා කොට පස්විධ යුතුකම් ඉටුකිරීම, පින්දහම් කිරීම ආදිය ධනය නියම ලෙස පරිහරණය කිරීමේදී කළයුතු කාර්යයන් එම සූත්‍රයේ විස්තර කර ඇත.

2. අලස බව පිරිහීමේ හේතුවක් බව පරාභව සූත්‍රයෙන් දැක්වේ.

3. මත්පැන් පානය කිරීම භෝග පරිහාණියට හේතුවක්, නැතහොත් භෝග අපාය මුඛයක් බව සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් වේ. සූදුවේ දුර්විපාක සයක් මෙම සූත්‍රයේ සඳහන් වේ.

4. උත්සාහය එක් සම්පත්තියක් (උට්ඨාන සම්පදා) වශයන් ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් වේ.

5. මෙලොව සුබසිද්ධියත්, පරලොව සුබසිද්ධියත් යන දෙකම සාදා ගැනීමට ඉවහල් වන ප්‍රධාන අංගය වීර්යය බව සංයුක්ත නිකායේ ආලවක සූත්‍රයෙන් පැහැදිලි කෙරේ.

6. අනලස්ව, නොපමාව, කාර්යක්ෂමව සිය කටයුතුවල නිරතව ධාර්මිකව ධනය රැස්කළ යුතු බව අංගුත්තර නිකායේ අනණ සූත්‍රය, ඉට්ඨධම්ම සූත්‍රය ආදී සූත්‍ර රැසකින් පැහැදිලිව දක්වා ඇත.

7. ස්වාමි-භාර්යාව ඉතා මනාව පවත්වාගෙන යාමට ඉවහල් වන හැසිරීම් රටාවක්, උපදෙස් මාලාවක් දීඝ නිකායේ සිඟාලෝවාද සූත්‍රයේ අඩංගු වේ.

8. ධම්මික සූත්‍රයට අනුව මත්පැන් උන්මාදනීය පානයකි.

9. අංගුත්තර නිකායේ ඉණ සූත්‍රයේ ණයගැතිවීම කාමභෝගී ගිහියකු කාලකණ්ණියකු බවට පත්වන ආකාරය පැහැදිලි කර ඇත.

10. අංගුත්තර නිකායේ පාපණික සූත්‍රයෙන් පැවිදි ජීවිතයේ කාර්යභාරය ව්‍යාපාරිකයකුගේ කාර්යභාරය හා සසඳා ඇත.

11. අංගුත්තර නිකායේ වේථුල්ල සූත්‍රය සාර්ථක ව්‍යාපාරිකයකු වීමට අවශ්‍ය ගුණාංග තුනක් හඳුන්වා දී ඇත.

අ. වක්ඛුමා (ඇස් ඇති බව) - නුවණ

ආ. විධුරෝ (නුවණැති බව)

ඇ. නිස්සය සම්පත්තෝ (නිශ්‍රය සම්පන්නය)

වක්ඛුමා යනු නුවණ නමැති ඇස්ය. එනම් ව්‍යාපාරිකයකු සතු විය යුතු නුවණ අදහස් කෙරේ. එනම්,

අ. භාණ්ඩ මිලදී ගත යුතු ආකාරය පිළිබඳ දැනීම (ඒවං කිතං)

ආ. භාණ්ඩ විකිණිය යුතු ආකාරය පිළිබඳ දැනීම (ඒවං වික්කය මනං)

ඇ. විකිණීමේදී භාණ්ඩ මිල කළ යුතු ආකාරය පිළිබඳ දැනීම (එත්තකං මූලං භවිස්සති)

ඈ. ඒ භාණ්ඩයෙන් ලබාගත යුතු ලාභ පිළිබඳ දැනීම.

විධුර - ඥානයෙන් යුත් වීර්යයි. විකිණීමත්, මිලදී ගැනීමත් පිළිබඳ දක්ෂතාව මින් අදහස් කෙරේ. පාරිභෝගික අවශ්‍යතා හැඳින ගැනීමත්, ඒ අවශ්‍යතාවට ගැළපෙන භාණ්ඩ හඳුනා ගැනීමත් අවධාරණය කරයි. පාරිභෝගිකයාට අනවශ්‍ය දේ සපයා ඔහු රැවටීම මෙයින් ප්‍රතික්ෂේප වේ.

පූජ්‍ය යටමලගල සුමනසාර හිමි
කැලණිය

"විමසිලිමත්බව ඔබේත්, රටේත් ආරක්ෂාවයි"